# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014 නොවැම්බර් 04** වන අඟහරුවාදා
2014 கார்த்திகை 04 செவ்வாய்க்கிழமை
Tuesday 04th November 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා.** 09.45 ට **පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.45 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.45 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"2014 අගෝස්තු මස 19 වන දින සභා සම්මත වූ 2014 අංක 03 දරන බස්නාහිර පළාත් සුළු වාරිමාර්ග ප්‍රඥප්තියට සහ 2014 ඔක්තෝබර් මස 21 වන දින සභා සම්මත වූ බස්නාහිර පළාතේ පළාත් සභාවේ පරිපූරක ඇස්තමේන්තුව - 02, 2014 ට අදාළ 2014 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තියට ගරු ආණ්ඩුකාරතුමා විසින් පිළිවෙළින් 2014 ඔක්තෝබර් මස 21 සහ ඔක්තෝබර් මස 23 වන දින අනුමැතිය ලබා දී ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"කාර්ය පටිපාටි රීති කාරක සභාවේ සාමාජිකත්වය දැරූ අර්ෂාඩ් නිසාම්දීන් ගරු මන්ත්‍රීතුමාගේ සහ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාගේ කාරක සභා සාමාජිකත්වය කාර්ය පටිපාටි රීති අංක 86 (4) ප්‍රකාරව අහෝසි වන අතර, 2014.10.31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී සාමාජික ධූරයන් සඳහා හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාව සහ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාව පත් කරන ලද බව දැනුම් දෙනවා."*

*iii*

*"2014.07.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යවර ප්‍රසන්න රණතුංග මැතිතුමාට අදාළ සෙසු අමාත්‍යාංශ විෂයයන් මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ වශයෙන් විය යුතු බවට, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද නිවේදනය, අංක 1881/13 හා 2014.09.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත්ව ඇති බවත්, ඒ බව ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ අංක 1/5/5/2 හා 2014.09.30 දිනැති ලිපිය මගින් දැනුවත් කර ඇති බවත් දැනුම් දෙනවා."*

*iv*

*"මීළඟ සභා රැස්වීම පැවැත්වීමට නියමිත 2014.11.18 දින ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා එම විසර්ජන ප්‍රඥප්තිය මෙම සභාවට ඉදිරිපත් කිරීමට නියමිත බව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

i. 2014.09.24 වන දින පැවැති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2014.10.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
# PETITIONS

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, කොළඹ 10, දෙමටගොඩ පැසේජ්, අංක 45 හි පදිංචි සහුල් හමීඩ් අයිනුල් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petition Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා ඔබතුමාගෙන් ප්‍රශ්නය අහලා තියෙන්නේ 06 වැනි මාසේ 03 වැනිදා. අද නොවැම්බර් 04 වෙනිදා. ගරු ඇමැතිතුමා ප්‍රශ්නය අහලා හරියටම මාස 04 ක් වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, උපරිම මාස තුනක කාලයක් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපරිම මාස තුනක කාලයක් තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමැතිතුමා ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමේදී හැකිතාක් දුරට කෙටි කාලයක් ඇතුළත ඒවාට පිළිතුරු සපයන්න කටයුතු කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ලබන සභා වාරයේ දී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මාස හතරක් වෙනවා ගරු ඇමැතිතුමා. සාමාන්‍යයෙන් අපට කාලය දෙන්න පුළුවන් මාස තුනයි. ලබන සභා වාරයේදී මේ ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දෙන්න ගරු ඇමැතිතුමා.

***ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*Hon. Chairman ordered to refer the question to the next Council sitting.*

**න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] එවලේ කල්ගත් නමුත් පසුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුර සභාගත කරන ලදී.**

**පසුව, [ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින්]** ***සභාගත කරන ලද පිළිතුර***
*Later on, the Answer Tabled by [Hon. Chief Minister]*

***ප්‍රශ්නය :***

*අ. කළුතර ප්‍රාදේශීය සභාව මගින් සංවිධානය කළ පොසොන් උදානය 2014 සඳහා පහන් කූඩු කූටි කොපමණ ඉදි කළේද?*

*පිළිතුර :*

*අ. 35 තිස්පහයි.*

*ප්‍රශ්නය :*

*ආ. එම කුටි ඉදි කිරීමට පෞද්ගලික ආයතන වෙතින් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද? ඒ කුටි කීයක් සඳහාද?*

*පිළිතුර :*

*ආ. මිල ගණන් කැඳවීමක් සිදුකර ඇත. පහන් කූඩු කුටි 40 ක් සඳහාය.*

*ප්‍රශ්නය :*

*ඇ. එම ටෙන්ඩරය ලබාගත් ආයතනය කුමක්ද? එම ආයතනය කුටි 40 ක් සඳහා ඉදිරිපත් කළ මිල ගණන් කොපමණද?*

*පිළිතුර :*

*ඇ. සුමුදුර සවුන්ඩ්ස් ආයතනය*
*සමුදුර සවුන්ඩ්ස් ආයතනය කුටි 40 ක් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමකින් තොරව කුටි 35 ක් සඳහා රුපියල් එක් ලක්ෂ පන්සියයක (100,500/-) මිල ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත.*

*ප්‍රශ්නය :*

*ඈ. එම ආයතනය මගින් අඩි 15 x 15 කුටි කීයක් ඉදි කළේද? ඒ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද?*

*පිළිතුර :*

*ඈ. කුටි 09 යි. රුපියල් හතලිස් අටදහස් පන්සියයකි. (48,500/-)*

*ප්‍රශ්නය :*

*ඉ. එම ආයතනය මගින් අඩි 10 x 10 කුටි කීයක් ඉදි කළේද? ඒ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද?*

*පිළිතුර :*

*ඉ. 26 යි. රුපියල් පනස් දෙදහසකි (52,000/-)*

**න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] එවලේ කල්ගත් නමුත් පසුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුර සභාගත කරන ලදී.**

**පසුව, [ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින්] *සභාගත කරන ලද පිළිතුර***
*Later on, the Answer Tabled by [Hon. Chief Minister]*

*ප්‍රශ්නය :*

*අ. 2014 ජුනි 12 - 15 කාලය තුළ කළුතර ප්‍රාදේශීය සභාව විසින් කළුතර නාගොඩ ගල්ලස්ස ප්‍රදේශයේදී පොසොන් කලාපයක් පැවැත්වීද?*

*පිළිතුර :*

*අ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ආ. එම කලාපය සඳහා වැය කළ මුළු මුදල කොපමණද? එයින් ප්‍රාදේශීය සභාව විසින් වැය කළ මුදල කොපමණද?*

*පිළිතුර :*

*ආ. මේ වන විට වැය කර ඇති මුළු මුදල රුපියල් දහහතර ලක්ෂ පනස් තුන් දහසකි. (14,53,000/-) සහා අරමුදලින් වැය කළ මුදල රුපියල් නව ලක්ෂ පනස්දහසකි. (905,000/-)*

*ප්‍රශ්නය :*

*ඇ. සභාව මගින් ඉදි කරන ලද තොරන, පොසොන් කලාපයේ ශබ්ද විකාශන යන්ත්‍ර, වේදිකාව ඉදි කිරීම, විදුලි ආලෝකකරණය, පහන්කූඩු කුටි ඉදි කිරීම සඳහා අදාළ ගෙවීම් සිදු කර ඇත්තේ කවර දිනයන්හිද? කවර ආයතනයන්ටද? කවර වව්චර අංක යටතේද?*

*පිළිතුර :*

*ඇ. සභාව විසින් දරා ඇති වියදම් පහත ආකාරයට වෙයි.*

| වියදම | ගෙවීම සිදු කර ඇති දිනය | ගෙවීම සිදු වූ ආයතනය | වවුචර් අංකය | මුදල |
|---|---|---|---|---|
| වෙසක් තොරණ | 2014.06.23 | එම්.කේ.ජේ.එස්. කුමාර මහතා, 144, පෝරම, අම්බලන්ගොඩ | 119 | රු. 400,000/- |
| ශබ්ද විකාශ යන්ත්‍ර | 2014.06.26 | උපුල් රේඩියෝ සහ රෙකෝඩ්බාර්, මතුගම පාර, නාගොඩ | 139 | රු. 80,000/- |
| වේදිකා ඉදිකිරීම | 2014.06.26 | සුමධුර සවුන්ඩ්ස්, විජිත මාවත, නාගොඩ | 137 | රු. 30,000/- |
| විදුලි ආලෝකකරණය | 2014.06.26 | උපුල් රේඩියෝ සහ රෙකෝඩ්බාර්, මතුගම පාර, නාගොඩ | 138 | රු. 130,000/- |
| පහන් කූඩු කුටි ඉදිකිරීම | 2014.06.26 | සුමධුර සවුන්ඩ්ස්, විජිත මාවත, නාගොඩ | 136 | රු. 100,000/- |

**ප්‍රශ්නය :**

ඈ. එම චෙක්පත් ප්‍රාදේශීය සභාවෙන් භාරගෙන ඇත්තේ කවුරුන් විසින්ද? එම පුද්ගලයා දැනට ප්‍රාදේශීය සභාවේ දරන තනතුර කුමක්ද?

**පිළිතුර :**

ඈ. තොරණ සඳහා අදාළ චෙක්පත හැර අනෙකුත් චෙක්පත් ජී.අයි.ආර්. කුමාරගේ මහතා විසින් භාරගෙන ඇත. ඔහු කළුතර ප්‍රාදේශීය සභාවේ වැඩ පරිපාලක තනතුර දරයි.

**ප්‍රශ්නය :**

ඉ. මෙම එක් එක් අයිතමයන් සඳහා ගෙවීම් සිදු කිරීමට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගත්තේ කවදාද?

**පිළිතුර :**

ඉ.

| වියදම | සභා අනුමැතිය ලැබුණු දිනය හා තීරණ අංකය | |
|---|---|---|
| පොසොන් තොරණ | 2014.06.27 | 6 : 4 : 8 යටතේ |
| ශබ්ද විකාශන යන්ත්‍ර | 2014.06.27 | 6 : 4 : 8 යටතේ |
| වේදිකා ඉදිකිරීම | 2014.06.27 | 6 : 4 : 10 යටතේ |
| විදුලි ආලෝකකරණය | 2014.06.27 | 6 : 4 : 9 යටතේ |
| පහනුකූඩු කුටි ඉදිකිරීම | 2014.06.27 | 6 : 4 : 10 යටතේ |

**ප්‍රශ්නය :**

ඊ. මෙම ගෙවීම්වලට අදාළව ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් මුදල් රෙගුලාසි හා සභා රීති උල්ලංඝනය කර තිබේද?

**පිළිතුර :**

ඊ. කරුණට අදාළව සිදුව ඇති ක්‍රම විරෝධී තත්ත්වයන්ට වගකිවයුතු අය හඳුනාගැනීම සඳහා කළුතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් මේ වන විට මූලික විමර්ශන ආරම්භ කර ඇති අතර, එම විමර්ශන අවසන් වීමෙන් පසු තීරණය කළ යුතුව ඇත.

**ප්‍රශ්නය :**

උ. එසේ තිබේ නම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

**පිළිතුර :**

උ. මූලික විමර්ශන අවසන් වීමෙන් පසු අනාවරණය වන කරුණු මත නිගමනය කරමි.

***න්‍යාය පත්‍රයේ අංක 04 සහ 05 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Lakshman Nipuna Arachchi, - Member, under item No. 04 and 05 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr Udaya Prabhath Gammanpila on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

**න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] එවලේ කල්ගත් නමුත් පසුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුර සභාගත කරන ලදී.**

**පසුව, [ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින්] *සභාගත කරන ලද පිළිතුර***
*Later on, the Answer Tabled by* [Hon. Chief Minister]

***ප්‍රශ්නය :***

*අ. බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමිවන පළාත් සභා ප්‍රතිපාදන වෙන් කළ හැකි ව්‍යාපෘතීන් / වෙන් කළ නොහැකි ව්‍යාපෘතීන් වෙන වෙනම සඳහන් කළ හැකිද? එසේ නම් ඒ ව්‍යාපෘතීන් කවරේද?*

***පිළිතුර :***

*අ. හැකිය.*

*මුදල් කොමිෂන් සභාවේ අංක FC/PSD&CBG/Circular/2011/1 සහ 2011.07.26 දිනැති චක්‍රලේඛය මත පදනම්ව සකස් කළ 2013.12.23 දිනැති පොදු උපදෙස් මාලාව අනුව ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති දැක්වේ. (අමුණා ඇත.)[1] ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති එහි ඇමුණුම II හි දක්වා ඇති අංක 1, 2, 3, 4 සහ 5 මගින් දක්වා ඇත. සෙසු ව්‍යාපෘති ක්‍රියාත්මක නොවේ.*

***ප්‍රශ්නය :***

*ආ. පළාත් සභා අරමුදල් කුමන හේතුවක් නිසා හෝ තම පෞද්ගලික මනාපයට අනුව යෙදවීමට මන්ත්‍රීවරුන්ට බලය පවරා ඇත්ද?*

***පිළිතුර :***

*ආ. නැත.*

***ප්‍රශ්නය :***

*ඇ. පළාත් සභා මන්ත්‍රීවරුන් තම සිතැඟි පරිදි පළාත් සභා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට ඔබතුමා වෙත පැමිණිලි ලැබී ඇත්ද?*

***පිළිතුර :***

*ඇ. නැත.*

***ප්‍රශ්නය :***

*ඈ. පැමිණිලි ලැබී ඇත්නම් ඒවා මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?*

***පිළිතුර :***

*ඈ. ආදාළ නොවේ.*

***ප්‍රශ්නය :***

*ඉ. පැමිණිලි ලැබී ඇත්නම් හෝ පැමිණිලි කළ පසුව ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද? යන්න වෙන් වෙන්ව මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?*

***පිළිතුර :***

*ඉ. පැමිණිලි ලැබී නොමැත.*

***ප්‍රශ්නය :***

*ඊ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර :***

*ඊ. අදාළ නැත.*

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.

***[සභාගත කළ ලේඛනය]***
*[Document Tabled]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 07 යටතේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ නමින් යුත් ප්‍රශ්නය සෞඛ්‍ය, දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## මීගමුව දිස්ත්‍රික් රෝහල : විපක්ෂයේ මන්ත්‍රී (බ.ප) කණ්ඩායමේ සෝදිසි කිරීම
NEGOMBO HOSPITAL: INSPECTION BY GROUP OF MEMBERS OF THE OPPOSITION (W.P.)

**07.**

**හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/49)**

අ. i. බස්නාහිර පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම 2014.10.14 වන දින මීගමු දිස්ත්‍රික් රෝහලේ කරන ලද සෝදිසි වැඩ සටහනේදී එහි එකෝ යන්ත්‍රය අක්‍රිය වී ඇති බවට හෙළිදරව් වූ අතර ඒ පිළිබඳව ඔබතුමා දන්නේද?

ii. එය යථා තත්ත්වයට පත් කිරීමට ගෙන ඇති පියවර කවරේද?

ආ. i. රෝහලේ ඉදි කරන ලද නව මහල් ගොඩනැගිල්ල ප්‍රමිතියෙන් තොරව ඉදි කර ඇති නිසා වැසි දිනවලදී නේවාසික රෝගීන් මෙන්ම කාර්ය මණ්ඩලයද අපහසුතාවයකට පත්වන බව ඔබතුමා දන්නේද?

ii. දිනකට 5000 ඉක්ම වූ ජනතාවක් පරිහරණය කරන මෙම ගොඩනැගිල්ලේ අනාරක්ෂිත බව පිළිබඳව සුදුසු පියවරක් ගන්නේද?

ඇ. i. මෘත ශරීරාගාරයේ අධිශීතකරණය අක්‍රිය වී ඇති බව දන්නේද?

ii. එය යථා තත්ත්වයට පත් කිරීමට ගෙන ඇති පියවර කවරේද?

ඈ. අක්‍රමවත් පල්දෝරු පද්ධතියේ අපද්‍රව්‍ය පිටතට ගලා යාමෙන් මීගමු කලපුවට සහ පරිසරයට සිදුවන හානිය සඳහා පිළියම් යොදන්නේද?

ඉ. තාවකාලිකව පවත්වා ගෙන යන ඖෂධ ගබඩාවේ ඇති බෙහෙත් වර්ග ගබඩා කිරීම සඳහා ප්‍රමිතියට අනුකූල වූ ගබඩාවක් ලබා දීමට කටයුතු කරන්නේද?

ඊ. රෝහල් කාර්ය මණ්ඩල ඌණතාවය නිසා රෝගීන්ට විධිමත් සේවාවක් නොසැපයෙන බැවින් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් කඩිනමින් ලබා දීමට කටයුතු කරන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

අ. i. ඔව්.

ii. මෙම යන්ත්‍රය දැනට වසර 11 ට පෙර මිලදී ගෙන ඇති අතර 2014 පෙබරවාරි මස අක්‍රිය වී ඇත. එහි නියෝජිත ආයතන වන Precision Teeh සමාගම දැනට ලංකාවේ ක්‍රියාත්මක නොවන අතර එම යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය උපාංග දැනට ලංකාවේ මිලදී ගැනීමට නැත. එබැවින් ඉදිරියේදී ප්‍රතිපාදන ලැබෙන අයුරින් නව යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආ. i. ඔව්.

ii. ගෙන ඇති පියවර,

පරමාණු බලශක්ති අධිකාරියෙන් හා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ගොඩනැගිල්ලේ ස්ථාවර බව පිළිබඳ පරීක්ෂණ පවත්වා නිර්දේශයන් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. එකී නිර්දේශ මත ගොඩනැගිල්ලේ ආරක්ෂාව පිළිබඳ ඉදිරි පියවර ගැනීමට අපෙක්ෂා කරමි.

මහල් 10 කින් යුත් නව ගොඩනැගිල්ලක් යථා කාලයේ ඉදි කිරීමට මිලියන 4000 ක මුදලක් ලබා ගැනීමට අපේක්ෂිතයි.

ඇ. i. ඔව්.

ii. මෘත ශරීර 4 ක් දැමිය හැකි ශීතකරණයක් 2011.08.01 දින මීගමුව දිස්ත්‍රික් මහ රෝහල වෙත ලබා දී ඇත. එයට අමතරව රෝහලේ අයින් කර තිබූ මෘත ශරීරාගාර ශීතකරණය අලුත්වැඩියා කර දී ඇත. එය දැනට අක්‍රිය වී ඇත. මෙය ඉතා පැරණි මෘත ශරීරාගාර ශීතකරණයක් බැවින් එය අලුත්වැඩියා කිරීමට අපහසු තත්ත්වයේ පවතින අතර ඒ සඳහා විශාල වියදමක් දැරිය යුතු වේ. එහි ප්‍රතිඵලද කෙටි කාලීන බව කාරුණිකව පෙන්වා දෙමි.

ඇ. එසේ හානියක් සිදු නොවේ. මෙහි පිළිසකර කටයුතු පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් පළාත් සභා අරමුදල් යොදවා 2014 වර්ෂයේදී සිදු කර ඇත. ඒ අනුව මීගමු කලපුවට හෝ පරිසරයට අපජලය මගින් හානියක් සිදු නොවන බව කාරුණිකව පෙන්වා දෙමි.

ඉ. ඔව්.

ඊ. ඔව්.

මීගමුව රෝහලේ පුරප්පාඩු පවතිනුයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ බඳවා ගැනීමෙන් අනතුරුව මෙම පළාත් සභාවට ලබා දෙන තනතුරු සඳහාය. එම තනතුරුවලට අදාළ පුරප්පාඩු රේඛීය අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති අතර, කාර්යය මණ්ඩලය ලැබෙන පරිදි පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

උ. අදාළ නොවේ.

මීගමුව රෝහල නිරීක්ෂණය කරන්න ගිහිල්ලා අපට උදව් කිරීම සම්බන්ධව හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු ඔබ සියලු දෙනාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්න තිබෙනවා. එකක් තමයි දැනට කොන්ක්‍රීට් එකෙන් වැසි ජලය ගලා බසින ගොඩනැගිල්ලේ තත්ත්වය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලයෙන් වාර්තාවක් ඉල්ලා තිබෙනවා. ඒ ඉල්ලා තිබෙන දිනය කවදාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට ඒකශ්‍රැතය කියන එක නැහැ ගරු විපක්ෂ නායකතුමනි. ඒ නිසා මම කල් ඉල්ලනවා. මම ඔබතුමාට ඉතා කඩිනමින් ඒ සම්බන්ධව ලිඛිතව පිළිතුරක් සපයනවා. ඊළඟ සභා වාරය වනකල් කල් මදී. මොකද, එතකොට පරක්කු වෙන නිසා. දැන් සභාව අවසන් වෙන්න කලින් දිනය අවශ්‍ය නම් දෙන්න පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මොරටුව විශ්ව විද්‍යාලයට දන්වලා තිබෙනවා කියලා කිව්වා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සභා කාලය තුළදී ඒ දිනය මම ඔබතුමාට දැනුම් දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඊත් එක්කම ඔබතුමා කිව්වා, රෝහල් පල්දෝරු පද්ධතිය පරිසරයට යන්නේ නැහැයි කියලා. අපි ඒ සම්බන්ධව නිරීක්ෂණය කළා. පල්දෝරු පද්ධතිය පිටතට ගලා යෑමක් සිදු වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මෑතක් වනතුරුම ඒක ඉතාම අර්බුදකාරී තත්ත්වයක තිබුණා. මම සන්තෝෂ වෙනවා, ඔබතුමා මගේ උපදේශක කාරක සභාවේ සිටීම ගැන. දැඩි ලෙස අපි මේ සඳහා කැප වුණා. අවංකව කියන්න ඕනෑ. දැන් ඒ තත්ත්වය 99% ක්ම යහපත්. මම හිතන්නේ, ඊයේ පෙරේදා වනකොට සම්පූර්ණයෙන්ම වැඩ අවසන් වීමට නියමිතව තිබුණා. ඒ වාගේම මම යළිත් ඒ ගැන විමසා හෙට දවසේ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙනම් අර 1% වෙන්න ඇති අපි දකින්න ඇත්තේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ, අවසන් කියලා අපට වාර්තා කළා. මේ වාගේ ප්‍රශ්න පිළිබඳව යථා අවබෝධයක් තිබෙන්නට ඇති එතැන නිරීක්ෂණයේදී.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි, හරි. බොහොම ස්තුතියි.

## සී/ස මතුගම විවිධ සේවා සමූපකාර සමිතිය : පරීක්ෂණ

MATHUGAMA MULTIPURPOSE COOPERATIVE SOCIETY LTD. : INVESTIGATIONS

**08.**

**ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ හා සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/50)**

අ. කළුතර සී/ස මතුගම විවිධ සේවා සමූපකාර සමිතිය පිළිබඳව ඔබතුමාටද පිටපතක් සහිතව 2014.07.02 දින දාතමින් සමූපකාර සංවර්ධන කොමසාරිස් මගින් සමූපකාර ප්‍රඥප්තියෙහි 46 (1), 47 (1) වගන්ති යටතේ ඉල්ලා ඇති විභාගය / පරීක්ෂණය නොකරන්නේ මන්ද?

ආ. අංක : සමු/ක/සං/3/14 හා 2012.05.23 සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ පරීක්ෂණයෙන් හෙළි වී ඇති රු. 28,81,316.26 ක මුදල අයකර ගැනීමට කටයුතු නොකරන්නේ මන්ද?

ඇ. ටෙන්ඩර් පටිපාටියෙන් තොරව සමිතියේ සභාපති/උප සභාපති සමිතිය සතු වටිනා දේපල සිය ඥාතීන් හා හිතවතුන්ගේ නමින් ලබාගෙන බාහිර පුද්ගලයන්ට අතුරු බදු දීම පිළිබඳව පරීක්ෂණයක් නොකරන්නේ මන්ද?

ඈ. මතුගම සමූපකාර සමිතිය සතු ගල්මත්ත ඉඩමේ කළු ගල කඩා විකුණා රුපියල් ලක්ෂ 02 ක පමණ මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලය හා නිලධාරීන් වංචනිකව ලබාගෙන ඇති බව දන්නේද?

ඉ. කළු ගල කැඩීමේදී ටයි බිම් රහිතව ඉදි කළ සමිතිය සතු ගොඩනැගිල්ලකට සිදු වූ හානි පිළිබඳව පරීක්ෂණයක් නොකරන්නේ මන්ද?

ඊ. මෙවන් විවිධ දූෂිත ක්‍රියා වලට සම්බන්ධ සමූපකාර සමිතියේ පාලනය කොමසාරිස් යටතට පත් නොකරන්නේ මන්ද?

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

අ. මෙම ඉල්ලීමේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් 46 (1), 47 (1) වගන්ති යටතේ පරීක්ෂණයක් කිරීමට ප්‍රමාණවත් කරුණු තිබේද යන්න පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස 2014.10.13 දින කළුතර සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත දන්වා ඇති අතර ඔහු විසින් ඒ සඳහා සමූපකාර සංවර්ධන නිලධාරී මොහාන් ජයතුංග මහතා පත් කර, මේ වන විට මූලික පරීක්ෂණ ආරම්භ කර ඇත.

ආ. සමු/ක/සං/3/14 හා 2012.05.23 දිනැති සමූපකාර සංවර්ධන කොමසාරිස් මගින් සිදු කරන ලද පරීක්ෂණය අනුව හෙළි වී ඇති රු. 28,81,316.26 ක මුදල අය කිරීමට මේ වන විටද සමිතිය පියවර ගෙන ඇත. ඒ යටතේ තවදුරටත් අයවිය යුතු මුදල රු. 592,355.60 ක් බව අනාවරණය වේ. මෙම මුදලද සමිතිය මගින් අය කර ගත යුතු අතර එසේ අය නොවන්නේ නම් සමිතිය විසින් තීරකකරණයට යොමු කළ යුතු වේ. එවිට එකී මුදල් අය කර දීමට අවශ්‍ය නීති ක්‍රියා මාර්ග ගැනීමට අප හට හැකි වේ.

| ලිපියෙන් දන්වා ඇති පරිදි විස්තරය | අයවිය යුතු මුදල | 2014.10.29 දිනට විස්තරය | 2014.10.29 දිනට ශේෂය |
|---|---|---|---|
| සේවයේ නැති සේවකයින්ගෙන් අය විය යුතු මුදල් අඩුව | රු. 1370.81 | සම්පූර්ණ මුදල අය වී ඇත. | - |
| සේවකයින්ගෙන් අය විය යුතු මුදල් අඩුව | රු. 890,288.00 | රු. 563,726.84 ක් අය වී ඇත. | රු. 326,561.16 |
| සොරු බිඳීම | රු. 65,920.95 | අයවීමට ඇත. විස්තර නැත. | රු. 65,920.95 |
| සේවයේ සිටින අයගේ මුදල් හා බඩු අඩුව | රු. 321,441.60 | සම්පූර්ණයෙන් අය වී ඇත. | - |
| ක්‍රියාකාරී ඉන්ධන ණයගැතියෝ | රු. 1,077,605.00 | රු. 936,077.90 ක් අය වී ඇත. | රු. 141,527.10 |
| අක්‍රිය ඉන්ධන ණයගැතියෝ | රු. 43,696.49 | 1990 සිට ඉදිරියට එන ශේෂයකිවිස්තර නැත. | රු. 43,696.49 |
| ක්‍රියාකාරී බී මහල ණයගැතියෝ | රු. 406,598.58 | රු. 466,343.41 ක් අය වී ඇත | රු. 14,649.90 |
| අක්‍රිය බීමහල ණයගැතියෝ | රු. 74,394.73 | | |
| **එකතුව** | **රු. 2,881,316.26** | **එකතුව** | **රු. 592,355.60** |

ඇ. මෙම පරීක්ෂණය සිදු කර ඇති අතර අතුරු බඩු දීමක් සිදු කර ඇති බවට කරුණු අනාවරණය වී නැත. හිඟව පවතින රු. 433,317.40 ක් වටිනා කඩ මුදල් අය විය යුතු බවට අනාවරණය වේ. එකී මුදල් අයකර ගැනීම හෝ ඊට එරෙහිව තීරකකරණයට යොමු කිරීම සමිතියේ කාර්යයක් බැවින්, ඒ බව දැනුවත් කර 2014.09.04 දින සමිතිය වෙත ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් දන්වා යවා ඇත.

ඈ. උක්ත කරුණ සම්බන්ධයෙන් මේ වන තෙක් මා වෙත වාර්තා වී නොමැත.

ඉ. කළුගල කැඩීමේදී එහි බිම් රහිතව ඉදි කළ සමිතිය සතු ගොඩනැගිල්ලට සිදු වූ හානිය පිළිබඳව 2014.07.02 දිනැතිව ලැබී ඇති ලිපියේ කරුණු පිළිබඳව සොයා බැලීමට 2014.09.27 දින කළුතර සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇත. එකී පැමිණිල්ලේ පිටපතක් ඒ සමග යැවීමට අතපසු වී ඇති නිසා නැවත යවන ලදුව පරීක්ෂණය සඳහා මේ වන විට නිලධාරියෙක් පත් කර ඇත. ඉදිරියේදී ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදු කරනු ලබයි.

ඊ. 1998 අංක 03 දරන බස්නාහිර පළාත් සමූපකාර සමිති ප්‍රඥප්තිය යටතේ මෙකී සමූපකාර සමිතිය කොමසාරිස් පාලනය යටතට ගැනීමට නම් විධිමත් පරීක්ෂණයක් සිදු කර වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කිරීමට හැකි චෝදනා සනාථ විය යුතු වේ. එසේ නොමැති වුවහොත් කොමසාරිස් පාලනයට ගත නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, දූෂණයක් සිදු වී තිබෙනවා. මම ඇමැතිතුමාට කියන්නේ ඔබතුමා මේ සමූපකාරය සඳහා පරීක්ෂණයක් පවත්වන්න කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මෙකේ පැහැදිලිව ණය ගැතියෝ ඉන්නවා - මුදල රුපියල් 43,696.80 ක්. ඒක අය කර ගැනීමට කටයුතු කරනවා.

***න්‍යාය පත්‍රයේ අංක 09 යටතේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon.Leader of the Opposition Manju Sri Arangala , under item No. 09 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr. Udaya Prabhath Gammanpila. on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 10 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.) [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, සති 02 ක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කළේ පසුගිය සභාවේදී සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් ලෙස. මම රීති අංක 30 (1) (8) (5) රීතිය යටතේ සභාව කල් තබන අවස්ථාවේදී යොමු කළේ. විශේෂයෙන්ම සභාව කල් තබන අවස්ථාවේදී ප්‍රශ්නයක් අහන්නේ හදිසි ප්‍රශ්නයක් ලෙස. නමුත් මම ගියවර සභාව කල් තබන අවස්ථාවේදී අහපු ප්‍රශ්නයට අදත් උත්තර නැහැ. එතකොට එය තවත් සති දෙකකින් කල් දැමීම කිසිසේත්ම එකඟ වෙන්න පුළුවන් කාරණාවක් නොවෙයි. මොක්ද මේක හදිසි ප්‍රශ්නයක්. මේ වනකොට බස්නාහිර පළාත තුළ ගුරුවරු බරපතළ ලෙස පීඩාවට පත් වෙලා තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා තමයි මම මේක හදිසි ප්‍රශ්නයක් ලෙස සභාව කල් තබන අවස්ථාවේ යොමු කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඇත්ත වශයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමා -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila – Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා මහ පැමිණෙමින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පැහැදිලි කිරීමක් කරන්නම්. ගරු ප්‍රධාන ඇමැතිතුමා මට දුරකථනයෙන් කථා කරලා කිව්වා, එතුමා මේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න උපරිම උත්සාහ ගන්නවා කියලා. නමුත් එතුමාට අද දවසේ තානාපතිවරයෙක් සමග අතිවිශේෂ සාකච්ඡාවකට සම්බන්ධ වෙන්න තිබෙන නිසා ටිකක් ප්‍රමාද වෙනවා කියලා කිව්වා. මම හිතනවා. එතුමා බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් සපයන්න. ඒ නිසා එතුමා පැමිණියහොත් මම අවස්ථාවක් ලබා දෙන්න බලන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එන්නේ නැත්නම් එව්ය හැකිව තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම උත්සාහ කරනවා.

***න්‍යාය පත්‍රයේ අංක 11 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Mahinda Jayasinghe, - Member, under item No. 11 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr Udaya Prabhath Gammanpila. on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Information and Trade Affairs)

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රමාදවීම සම්බන්ධව මම කනගාටුව ප්‍රකාශ කරනවා. ප්‍රශ්න අංක 02 හා 03 ට අදාළ පිළිතුරු සහ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙන ප්‍රශ්නයට අදාළ පිළිතුරු සභාගත කරන්න අවසර ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, සභාගත කරනවා.[2]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ලබා දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ අතුරු ප්‍රශ්නය ලිඛිතව ඉදිරිපත් කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එහෙම වැඩක් නැහැ නේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඔබතුමාට අවස්ථාව ලබා දුන්නෙත් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

තත්පරයක් දෙන්න. ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ අවස්ථාවේ පිළිතුරු ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මම අහලා තිබෙන්නේ, පළාත් සභා ප්‍රතිපාදන මොන මොන වැය ශීර්ෂවලටද? කොහොමද? දාන්න පුළුවන් කියලා. ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් අහනවා 'ඇ' ප්‍රශ්නයට දුන්නු පිළිතුර මොකක්ද කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඇ පිළිතුර, නැත.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, මා ළඟ සාධකයක් තිබෙනවා. මා ළඟ නාම පුවරුවක මුල් ගල තියන කොළයක් තිබෙනවා. මම දන්නේ නැහැ මොකක්ද මේ කියලා. ජගත් කුමාර මැතිතුමා. දේශබන්දු ජගත් කුමාර අපේ පළාත් සභා මන්ත්‍රීතුමා. මම කාටවත් මඩ ගැසීමක් නොවෙයි කරන්නේ. පුද්ගලික මඩ ගැසීමක් නොවෙයි. එතුමාගේ මවට පිං පිණිස බුදු මැදුරක් හදලා තිබෙනවා පළාත් සභා ප්‍රතිපාදනවලින්. මේ සම්බන්ධව ඔබතුමා ක්‍රියාමාර්ග ගන්නවාද? එහෙම නම් මේකේ ඇත්ත නැත්ත අපි දැන ගන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, ශිෂ්‍යත්ව පොතකට නමක් දාගන්න ගියාම Photo එකක් තියෙනවා කියලා ඒක නැති කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මේ සම්බන්ධව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගේ මිය ගිය මෑණියන්ට පිං පිණිස මාලබේ ආදර්ශ පිරිමි විදුහල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඕක සභාගත කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාත් සමග ඒ ගැන කථා කළා. තවම පිළිතුරු ලැබෙමින් පවතිනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මහ එනවා.

[2] ප්‍රශ්නවලට හිමි අංකය යටතේ පළ කර ඇත. පිටු අංක 02 සිට 12 දක්වා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මඟ එනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේකට උත්තර ගරු ප්‍රධාන ඇමැතිතුමා දන්නවා. එතුමා මැදිහත් වෙලා කරපු වැඩ ගැන තමයි මම අහලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා ගියවර සභාව කල් තබන අවස්ථාවේදී මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් යොමු කළා. 10 වැනි ප්‍රශ්නය.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නයට අදාළ පිළිතුරු නැහැ. හැබැයි, මේ ප්‍රශ්නයට මට උත්තර දෙන්න පුළුවන්.

## ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය : සාමාජිකයන් බඳවා ගැනීම
SRI LANKA INDEPENDENT TEACHERS' ASSOCIATION: MEMBER RECRUITMENTS

**10.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)14/52)**

අ. අධ්‍යාපන කලාප මට්ටමින් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා විදුහල්පතිවරුන් ද සමග ශ්‍රී.ල.නි. ගුරු සංගමයේ නියෝජිතයින් ද කැඳවමින් ඔබතුමාගේ මූලිකත්වයෙන් පැවැත් වූ රැස්වීම් කුමන ස්වභාවයක ඒවාදැයි මෙම සභාවට ප්‍රකාශ කරන්නේද?

ආ. එකී රැස්වීම් වලදී ශ්‍රී.ල.නි. ගුරු සංගමයේ ප්‍රවර්ධනයට අදාළව පාසල් තුළදී සාමාජික බඳවා ගැනීම් සිදු කරන ලෙසට බලපෑම් සිදු කර තිබීම සැබෑවක්ද?

ඇ. මේ ආකාරයට විදුහල්පතිවරුන් තම නිලය යොදා ගනිමින් ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට සාමාජිකයින් ලෙස, පාසලේ ගුරුවරුන් බලහත්කාරයෙන් බඳවා ගැනීමට දරන උත්සාහයට ගුරුවරුන්ගේ දැඩි විරෝධයත්, පිළිකුලත්, ප්‍රකාශ වන බව ඔබතුමා දන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයෙන් කැඳවීම කළා. ඒකට මටත් ආරාධනා කළා. කලාප 11 ක රැස්වීම් මාලාවක් අපි තිබ්බා. පාසල් මට්ටමේ නියෝජිතයින් එක්ක. එතැනදී බලාපොරොත්තු වුණේ, ගුරු සේවා ව්‍යවස්ථාව හා විදුහල්පති සේවා ව්‍යවස්ථාව පිළිබඳ දැනුවත් කිරීම කරන්න. දෙක, වෘත්තීය සමිති මට්ටමෙන් කටයුතු කරද්දී දරුවන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි කිරීමේ වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කරන්න. ඒ කාරණා අදාළ කරගෙන අපි වෘත්තීය සමිති මට්ටමේ සාකච්ඡාවක් එතැන තිබුණා. මටත් ආරාධනාවක් ලැබුණා. මමත් ඒකට සහභාගී වුණා.

ආ. සම්පූර්ණ අසත්‍යයක් ගරු සභාපතිතුමනි. අපි කිසිම අවස්ථාවක පාසල් කාලසීමාවේදී මෙය කළ යුතුයි කියලා එතැනදී කිසිම කෙනෙක් ප්‍රකාශ කළේ නැහැ.

ඇ. දන්නේ නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය සහ මම වගකීමෙන් කියනවා ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ සභාවට එතුමාගේ පළමුවැනි ප්‍රශ්න දෙකටම ලබා දුන්නු පිළිතුරු සම්පූර්ණ අසත්‍යයක්. ඒ වාගේම මේ සභාව නොමඟ යැවීමක් කළ බව.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමාට ඒ ප්‍රකාශය කරන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ ප්‍රකාශය කරමින් මම මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, මේ මා සතුව තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඇත්ත වශයෙන්ම ඔබතුමාට අවස්ථාව ලබා දුන්නේ යුතුකමක් වශයෙන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ප්‍රකාශ කරන්න බැහැ නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රකාශ නොවෙයි. ප්‍රශ්නය අහන්න මට ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රකාශය නොවෙයි. ප්‍රශ්නයක් අහන්නේ. මම ඔබතුමාගෙන් අහනවා ලිඛිතව ප්‍රශ්න අහද්දී -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි. ඔබතුමා අහන්න කෝ, පිළිතුරු ටික දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලිඛිතව ප්‍රශ්න අහනකොට කියනවා, ප්‍රශ්නයකට වචන 150 යි කියලා. ගරු සභාපතිතුමනි, -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි, හරි. අහන්න. අහන්න දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අහන්න. අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නිශ්ශබ්ද වෙන්න කෝ? මම අහන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ලිඛිතව ප්‍රශ්න අහනකොට වචන 150 යි කියලා තිබෙනවා. නමුත් වාචිකව ප්‍රශ්න අහනකොට වචන සංඛ්‍යාවක් ගැන කියලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් කෙටියෙන් ප්‍රශ්නය අහන්න. රීතිවල තියෙන්නේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මා සතුව මේ තිබෙන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලිපි ශීර්ෂය යටතේ පසුගිය 10 වැනි මාසේ 27 වැනිදා රාජකාරී වෙලාවක පෙ.ව. 11.30 ට රද්දොළුව ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රාථමික විදුහලට ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ සාමාජිකයන් බඳවා ගැනීම සඳහා යවපු ලිපිය. ඒ විතරක් නොවෙයි. ඔබතුමා කලින් කියපු ප්‍රශ්න -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතකොට -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක වැරැදියි. ඔබතුමා අහපු දේට මම මේ උත්තර දීලා තියෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉන්න මම ප්‍රශ්නය අහන්නම්. එතකොට ඔබතුමා කිව්වේ, ඔබතුමා ආරාධනයක් සහිතව මේකට සහභාගී වුණා කියලා. නමුත් මේ ලිපියේ තිබෙන්නේ, ඔබතුමා විසින් තමයි මේ කැඳවීම කරලා තිබෙන්නේ. ඒ ගැන මට පැහැදිලි කරලා දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ අහන්නේ ප්‍රධාන අමාත්‍යතුමාගෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා ඒ ලිපිය සභාගත කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලිපිය සභාගත කරනවා.[3]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය අහන්නේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට කියලා. කිසිම අවස්ථාවක ප්‍රධාන අමාත්‍යවරයාගේ ලිපි ශීර්ෂයකින් නොවෙයි ඔය ලිපිය ඇරලා තියෙන්නේ. ඔබතුමා ඕක මගෙන් ඇහුවා නම්, මම ඒකටත් උත්තරයක් දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නමුත් වගකීම තියෙන්නේ, ප්‍රසන්න රණතුංග, බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ දේශපාලන පක්ෂය නියෝජනය කරන වෘත්තීය සමිති වැඩ සටහනකට මට සහභාගී වෙන්න බැරි නම් කාටද සහභාගී වෙන්න පුළුවන්?

[3] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට වෘත්තීය සමිති -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකක්ද වැරැද්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට මම ඒක -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම පැහැදිලිව වගකීමෙන් කියනවා, මම කිසිම අවස්ථාවක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට ඔබතුමාගේ වෘත්තීය සමිතිය වෙනුවෙන් මැදිහත් වෙන්න -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ප්‍රධාන අමාත්‍යවරයා හෝ අධ්‍යාපන අමාත්‍යවරයාගේ ශීර්ෂ ලිපියකින් එහෙම ලිපියක් ඇරලා නැහැ. වෘත්තීය සමිතියෙන් මට ආරාධනා කළාම වෘත්තීය සමිති නියෝජිතයින්ගේ ආරාධනාව අනුව මේ සාමාජිකයින්ට ලිපියක් ඇරලා තිබෙනවා, මේ කමිටුවේ නිලධාරියෙක් හැටියට මම සහභාගී වෙනවා කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නමුත් ඔබතුමා මේ, ඔබතුමාගේ බලය පාවිච්චි කරන්නේ. අපට තිබෙන ප්‍රශ්නය ඒකයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

බලයක් දීලා තිබෙන්නේ පාවිච්චි කරන්න තමයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

රාජ්‍ය බලය පාවිච්චි කරන්න බැහැ, එහෙම. එහෙම රාජ්‍ය බලය පාවිච්චි කරන්න බැහැ, වෘත්තීය සමිතිවලට සාමාජිකයෝ බඳවා ගන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ වැඩ සටහනට භය වෙන්න ඕනෑද? මේක භය වෙන්න දෙයක් නොවෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා මට කියන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මොන වගන්තියේද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ ප්‍රශ්නය අපි -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ආයතන සංග්‍රහයේ හරි, වෘත්තීය සමිති ආඥා පනතේ හරි මොන වගන්තියේද රාජ්‍ය බලය යෙදාගෙන වෘත්තීය සමිති සාමාජිකයෝ බඳවා ගන්න පුළුවන් කියලා තිබෙන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අපි කිසිම අවස්ථාවක රාජ්‍ය බලය පාවිච්චි කරලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නයත් මම අහන්නම්. එතකොට මට කියන්න. ඊළඟට ඔබතුමා මේ ලිපියේ කියන්නේ මොකක්ද? එමෙන්ම අහගන්න හොඳට. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. ඇහෙනවා. කෙටියෙන් කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එමෙන්ම පාසල් වේලාවේදී පැමිණෙන නියෝජිතයින් සඳහා අවශ්‍ය නම් රාජකාරී නිවාඩු අනුමත කර දීමට කටයුතු කළ හැකිය. මම අහනවා. දෙන්න උත්තරය.

[සභාවේ ඝෝෂා]

ආ ... හරි ෂෝක්. තව අත්පුඩි ගහන්න. උඩට නැඟලා ගහන්න. හරි ෂෝක්. මේසේ උඩට නැඟලා ගහන්න. ඒ ඉන්න මහ කෙනාත් නීති කඩනවා. මෙහේ ඉන්න මහ කෙනාත් නීති කඩනවා. මොකක්ද මේ නීතිය? කොහේද මේ නීතිය තියෙන්නේ? රටේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සංවරශීලීව -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොහොමද වෘත්තීය සමිති රැස්වීමට -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

පොඩ්ඩක් ඉන්න මම උත්තර දෙනකම්. ඔබතුමා වාඩි වෙන්න. මම උත්තර දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. මට උත්තර දෙන්න ඔබතුමා කොහොමද රාජකාරී නිවාඩු අනුමත කරන්නේ කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, වෘත්තීය සමිති කැඳවීම සඳහා රාජකාරී නිවාඩු ලබා ගැනීමේ හැකියාව ඕනෑම සාමාජිකයෙකුට

තිබෙනවා. ඒක මේකේම තිබෙනවා. මේ අනුව කැඳවීමට ඒ අයට නිල වශයෙන් නීත්‍යානුකූල - මේ මම නිවාඩු දීපු එකක් නොවෙයි. ඒ සාමාජිකයන්ට හැකියි. ඔබතුමා වෘත්තීය සමිති නායකයෙක් හැටියට ඔබතුමා දන්නවා එහෙම සම්මන්ත්‍රණ හා වැඩ සටහන්වලට නිවාඩු ගැනීමේ හැකියාව තිබෙන බව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කාටද දෙන්න පුළුවන්?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක කලාපයෙන් දෙන්න පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කලාපයෙන් නොවෙයි දීලා තිබෙන්නේ. ඔබතුමා නේ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට පුළුවන්. පොඩ්ඩක් ඉන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම නිවාඩුවක් දීලා නැහැ. මම කියලා තිබෙන්නේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ආරාධිත අමුත්තන් -

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු ඇමැතිතුමා, ඔබතුමාට නිවාඩු දෙන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ලියුම ගැහුවේ ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ සභාපති වසන්ත හඳපාන්ගොඩ හරි, ලේකම් නිශ්ශංක හරි නම් අපට ප්‍රශ්නයක් නැහැ. මේ ලියුම ගහලා තියෙන්නේ ප්‍රධාන ඇමති. ආරාධිත අමුත්තා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා දිගින් දිගටම -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ආරාධිත අමුත්තා කොහොමද රාජකාරී නිවාඩු දෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කමිටු සාමාජිකයෙක් හැටියට මම වෘත්තීය සමිතිය දැනුවත් කිරීමක් කරලා තිබෙනවා, ඒ අයට ඒ විධියට ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයෙන් ආරාධනාවක් කළාම ඒ අයට නිවාඩු ලබා ගැනීමේ හැකියාව තිබෙන බව. ගරු සභාපතිතුමනි, මම කනගාටු වෙනවා. මොකද, අද වෘත්තීය සමිති හැම එක්කෙනාටම රිදිලා තිබෙනවා, මේ වැඩ සටහන කරද්දී.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේ සභාව නොමඟ යවන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම කාවවත් නොමඟ යවන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ වැරැදි ප්‍රකාශයක් ඔබතුමා කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉතින් මම උත්තරයක් දුන්නා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය හෝ ඕනෑම වෘත්තීය සමිතියක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දිගින් දිගටම මේ ප්‍රශ්නයට කාලය දෙන්න අමාරුයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලේකම්වරයාට හෝ සභාපතිවරයාට පුළුවන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ ප්‍රශ්නය අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වාර්ෂිකව නිවාඩු දීලා කැඳවන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක තියෙන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් සමාවෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒකේ තියෙන්නේ ගරු සභාපතිතුමනි, මම ඔබතුමා නොදන්නවා නම් කියන්නම්. ආයතන සංග්‍රහය අනුව ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් අහන්න.

දන්නේ නැති එක උගන්වන්න එපැයි දෙයියනේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ඔබතුමා පොඩ්ඩක් අහන්න කෝ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

තව ටික දවසකින් උගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා සමාවෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හය නැහැ. ලැජ්ජයි. කැතයි.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මොකක්ද කැත?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාටත්, ඔබතුමාටත් මම මේ පැහැදිලි කිරීමක් කරන්නේ ප්‍රශ්න ඇසීමේදී ඒවා විවාදයට ලක් වෙන්න ඉඩ දෙන්න බැහැ. ඒ සම්බන්ධව දිගින් දිගටම විවාදයකට යන්න දෙන්න බැහැ. ඒ නිසා කරුණාකරලා මෙතැනින් ඒ විවාදය නවත්වන්න. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා නේ? මම ඇමැතිතුමා සමඟ සාකච්ඡා කරලා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම මම යුතුකමක් වශයෙන් ඔබතුමාට අවස්ථාව ලබා දුන්නේ.

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, කෝට්ටේ විවිධ සේවා සමූපකාර සමිතිය පසුගිය දිනවල මැතිවරණය පවත්වලා අවුරුදු 24 කට පස්සේ නැවත ඡන්දයෙන් පත් වුණු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන්න අවස්ථාව ලැබුණා. ඒ අනුව ඡන්දය දීපු අපේ පළාතේ ඉන්න ජනතාවට, සමූපකාර සාමාජික සාමාජිකාවන්ට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්න දෙකක් තිබෙනවා. පළමුවැනි වරප්‍රසාද ප්‍රශ්නය තමයි ඇත්ත වශයෙන්ම අධික වර්ෂාව නිසා විශාල වශයෙන් අපේ ගමනාගමනයට අපහසුතා ඇති වෙලා තිබෙනවා. මීරිගම ආසනය වාගේම මම හිතන්නේ සෑම මන්ත්‍රීවරයෙකුගේම ආසනවල දාපු පාරවල් කැඩිලා ගිහිල්ලා, පාලම් බෝක්කු කැඩිලා ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම මීරිගම නගරයේ පැය භාගයක් පමණ වැස්සොත් නගරයම යට වන තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. වාරිමාර්ග පද්ධතියත් අද අභාවයට ගිහිල්ලා. ඒ වාගේම බෝක්කු පද්ධතියත් අභාවයට ගිහිල්ලා තිබෙනවා. පසුගිය කාලවල දාපු කාපට් පවා ගැලවිලා ගිහිල්ලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට ඕකට වරප්‍රසාද ප්‍රශ්නයක් වශයෙන් අවස්ථාව ලබා දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මොකද, අපි එනකොටත් අපට එන්න බැරි තත්ත්වයක් මතු වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහොමත් මේ දවස්වල අධික වාර්ෂාව නිසා ගොඩක් මාර්ග ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ නිසා මම ඉල්ලීමක් කරන්නේ ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාට හරි කියලා පරිපූරකයක් දාලා සෑම මන්ත්‍රීවරයෙකුටම ප්‍රතිපාදන ටිකක් ලබා දෙන්න. නැත්නම් මේක විශාල ප්‍රශ්නයක් වෙනවා. ඒකයි මගේ ඉල්ලීම. ඒ වාගේම දෙවැනි ප්‍රශ්නය තමයි අද අපි එනකොට මේ පහළ මහලයේ සැලසුම් නිලධාරීවරුන් විශාල සංඛ්‍යාවක් හිටියා. ඒ අය ඉල්ලීමක් කරලා තිබෙනවා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ප්‍රශ්න මාලාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ගරු මන්ත්‍රීතුමා, ඒක මටත් ලැබුණා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ යෝජනාවේ 2006 වැටුප් චක්‍රලේඛය අනුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඒක ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් නොවෙයි. කරුණාකරලා වාඩි වෙන්න. ඒක හැමෝටම ලැබුණා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

හැම මන්ත්‍රීවරයෙකුටම බලපානවා. සභාපතිතුමාටත් බලපානවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් වෙන්නේ නැහැ. ඒ තියෙන්නේ වෙනම කාරණයක්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

අපට ප්‍රතිපාදන එන්නේ සැලසුම් නිලධාරීන් මගින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ගරු මන්ත්‍රීතුමා වරප්‍රසාද ප්‍රශ්න කියලා එක එක කාරණා ඉදිරිපත් කරන්න සූදානම් වෙන්න එපා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ අය ඇත්ත වශයෙන්ම කළේ නැත්නම් අපේ ප්‍රතිපාදන ටික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට කාලය වටිනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

කාලයක් නොවෙයි ගරු සභාපතිතුමා අපි කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් නැහැ නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

වරප්‍රසාදයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට අවස්ථාව දෙන්න පුළුවන් ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමකට විතරයි.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ කියන්නේ යෝජනා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාවට එන අවස්ථාවේදී යම්කිසි අසාධාරණයක් වුණා නම්, මම ඒ ගැන බලනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

යෝජනාවක් කරන්නේ ඒකයි. අපේ මුදල්. ඔබතුමාගේ මුදලුත් යන්නේ එතැනට නේ? සැලසුම් නිලධාරිවරුන්ට, ඒ අයට ලැබෙන්න තිබෙන වරප්‍රසාද ටික ලබා දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. 36 (1) රීතිය පිළිබඳව ඔබතුමා දන්නවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

අපේ වරප්‍රසාදයත් නේ ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිසිම වරප්‍රසාද කඩවීමක් වෙන්නේ නැහැ. කිසි සේත්ම වෙන්නේ නැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමාගේත් වරප්‍රසාදයත්. අපේ මුදල් මේ සැලසුම් නිලධාරිවරුන් යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් ඒ සම්බන්ධ ලිපියක් ලැබුණා. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍ය සහ අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරමින් තමයි මේ කාරණය පිළිබඳව පෞද්ගලික පැහැදිලි කිරීම කරන්නේ. ගරු සභාපතිතුමනි, මේ වනවිට බස්නාහිර පළාතට බලපාන අන්දමට, බස්නාහිර පළාතේ අධ්‍යාපනය

ගුරුවරුන්ට පමණක් බලපාන විධියට ගුරු පිය සටහන් පොත පදනම් කරගෙන වැටුප් වර්ධක ලබා දීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වන තත්ත්වයක් තිබෙනවා. මේ ගුරු පිය සටහන් පොත ඉතාමත්ම නිවැරැදි, හොඳ ක්‍රමවේදයක් බව සියලුම ගුරුවරුන් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් අයවලුන් විශ්වාස කරනවා. නමුත් ගැටළුව තිබෙන්නේ, වර්ෂයකට උපරිම රුපියල් 645 ක වැටුප් වර්ධකයක් ලබා ගැනීම සඳහා මේ ගුරු පිය සටහන් පොත විදුහල්පතිවරයාගේ නිර්දේශය, විදුහල්පතිවරයාගේ නියමය මත පමණක් මේ වැටුප් වර්ධකය ලබා දෙනවා වෙනුවට, අනෙකුත් පළාත්වලට නැති බස්නාහිර පළාතේ විශේෂයෙන් හොරණ කලාපයට පමණක් මේ තත්ත්වය වෙනස් මගක් ගෙන තිබෙනවා. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් මේ පිය සටහන් පොත විදුහල්පතිගේ නිර්දේශයෙන් පසුව එතුමන්ගේ නිගමනය සඳහන් කරලා කලාප කාර්යාලයට ලබා දීමෙන් පසුව තමයි දැනට මේ කලාපයේ සිද්ධ වන වැටුප් වර්ධකය ලබා දීම සිදු කරනු ලබන්නේ. නමුත් ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ මහතා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා අමතමින් යොමු කරන ලද ලිපියේ පැහැදිලිව සඳහන් වෙනවා, මෙහෙම නියමයක්, නියෝගයක් කිසිදු කලාප අධ්‍යක්ෂවරයෙකුට හෝ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකුට හෝ ලබා දීලා නැහැයි කියලා. නමුත් අදටත් බණ්ඩාරගම ජාතික පාසලේත්, බණ්ඩාරගම කොට්ඨාශයේ වෙනත් පළාත් සභා පාසල්වලත් කලාප කාර්යාලයට ගුරු පිය සටහන් පොතේ කොට්ඨාශ අධ්‍යක්ෂගේ නිර්දේශ නැතුව යොමු කරපු කිසිදු වැටුප් වර්ධකයක් ලබා දීලා නැහැ. කිසිදු වැටුප් වර්ධකයකට අත්සන් තබලා නැහැ. මෙය ඉතාමත්ම බරපතළ තත්ත්වයක්. නීතිය තුළ කිසි තැනක සඳහන් වෙන්නේ නැහැ. පානදුර කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මේ සම්බන්ධයෙන් ක්‍රියා කරපු අවස්ථාවක ඔම්බුඩ්ස්මන්ට්වරයා පවා ඒ කාරණය වැරැදි බව සඳහන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තලහිටිය, බෙගමුව, උඩුවර වාගේ බණ්ඩාරගම කොට්ඨාශයේ ඈත ගම්වල ඉන්න උදවියට කොට්ඨාශ කාර්යාලයට ඇවිල්ලා ඒ අයට ආපහු යන්න දවසක් යනවා. අගලවත්ත, මතුගම ඈත ප්‍රදේශවල අයටත් මතුගමට එන්න විශාල කාලයක් යනවා. ඒ නිසා මෙය ගුරුවරයා පීඩාවට පත් කරන, නීතියේ නැති කාරණයක් බව ගෞරවයෙන් සඳහන් කරනවා. ඒ නිසා මේ කාරණය පළාතේ ප්‍රධාන ලේකම්වරයා දක්වලා තිබෙන ආකාරයට මෙහි කිසිදු නෛතික පදනමක් නැති නිසා, නීත්‍යානුකූල තත්ත්වයක් නැති නිසා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා මේ කාරණයට අධ්‍යාපන අමාත්‍යවරයා විධියට ඍජු මැදිහත් වෙලා මේ කාරණය නිවැරැදි කරලා ගුරුවරුන්ගේ වැටුප් වර්ධකය ලබා ගැනීම සඳහා විදුහල්පතිවරයාගේ නිර්දේශය පමණක් ගුරු පිය සටහන් පොතට ඇතුළත් කිරීම ප්‍රමාණවත් කොට ලිඛිත ලියවිල්ලක් අදාළ කොට්ඨාශ සහ කලාප අධ්‍යක්ෂවරුන්ට යොමු කරන ලෙසට. බොහොම ස්තුතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, මේ කාරණය මේ සභාව තුළ මතු කරන්නට ලැබීම පිළිබඳව. අපි දන්නවා, පසුගිය දවසක ලංකාවේ දරුණුම ඛේදවාචකයක් විධියට මීරියබැද්ද ගම්මානයේ පවුල් 73 ක් පමණ නිවාසත් එක්ක, දේපළත් එක්ක සියල්ලම විනාශ වුණා. අද දරුවාට මව නැති වෙලා තිබෙනවා. මවට දරුවා නැති වෙලා තිබෙනවා. බිරිඳට ස්වාමියා නැති වෙලා තිබෙනවා. ඒ වාගේම ස්වාමියාට බිරිඳ නැති වෙලා තිබෙනවා. විශාල කම්පාවකට පත් වෙමින් තිබෙන කාල පරිච්ඡේදයක් තමයි මේ ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි කවුරුත් මේ පිළිබඳව ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මතක් කරන්නේ, මෙවැනි දේ ඉදිරියටත් වෙන්න පුළුවන්කම තිබෙනවා. රජයක් විධියට, රජයේ වගකීම තමයි මේ තත්ත්වයෙන් ජනතාව මුදවාගෙන මේ පිළිබඳව අවබෝධයක් ඇති බොහෝ දෙනාගේ මතය සැලකිල්ලට ගෙන ක්‍රියා කිරීම.

අපි දන්නවා භූ විද්‍යාඥයෙක් වන මහචාර්ය කපිල දිසානායක මැතිතුමන් මේ පිළිබඳව රජයට අනන්ත අප්‍රමාණ නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. මහියංගණයේ දහ අට වංගුව හදනකොට - මේ දහ අට වංගුව හදලා ඉවර කළාට, සුන්දර පරිසරයක් එතැන ඇති වුණාට පළමුවැනි වතාවට නාය යෑමකට ලක් වුණා. මේ නාය යෑමකට ලක් වීම පිළිබඳව මහචාර්ය කපිල දිසානායක මැතිතුමා කියන්නේ අවිධිමත් සංවර්ධනය නිසා මේ නාය යෑම් සිද්ධ වෙනවා කියන එකයි. ඒ ගල් බෝර දමද්දී ඒ පාරවල් අයිනේ ගල් කඩන්න ඕනෑ නිශ්චිත ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය හරියට පාවිච්චි කර ගන්නේ නැහැ. අද අනන්ත අප්‍රමාණ පාරවල් පුළුල් කරනවා. ඒක හොඳයි. හැබැයි, ක්‍රියා කළ යුතු ක්‍රමවේදයට ක්‍රියා නොකිරීම නිසා

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

තමයි පාරවල් අයින් සම්පූර්ණයෙන්ම නාය යැමේ තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ කියන එක තමයි භූ විද්‍යාඥයින්ගේ අදහස වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි දන්නවා, ඒ ගල් කඩද්දී විශාල බෝර දමද්දී උඩ ප්‍රදේශය පාංශු ඛාදනයට ලක් වෙනවා. ඒ නිසා මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම රජයේ වගකීමක්, සංවර්ධනය කරන ගමන්ම නියමිත ක්‍රියා පටිපාටියෙන් යුක්තව වැඩ කටයුතු කිරීම.

අනෙක් එක තමයි ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය රජයට දන්වලා තිබෙනවා, 2005 දී නාය යෑමට පත් වීමට ඉඩ තිබෙන ප්‍රදේශයක් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න කියලා. ඒ විතරක් නොවෙයි. 2011 දීත් මේ පිළිබඳව දන්වලා තිබෙනවා. නමුත් රජයේ වගකිව යුතු නිලධාරීන්, රජය, වතු සමාගම් මැදිහත් වීම් හරියට නොකළ නිසා තමයි මේ මිනිස්සුන්ගේ ජීවිත අවදානම් තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද රජය කියනවා, මේ මිනිස්සුන්ට කිව්වාට මේක නිලධාරීන්ගේ වගකීමක්. නිලධාරීන් හරියට ඉටු කරලා නැහැ. මේක මිනිස්සුන්ගේ වගකීමක්. මිනිස්සු ඒ තැන්වලින් ගිහිල්ලා නැහැ. මිනිස්සුන්ට තමන් ජීවත් වෙන ප්‍රදේශයෙන් යන්න සුදුසු පරිසරය හදන්න ඕනෑ. රජයේ නිලධාරීන්ට වැඩිය වගකීම තිබෙන්නේ ආණ්ඩුවට. අපි දන්නවා අනවසර ඉදි කිරීම්, ඒ වාගේම විශාල සංකීර්ණ ඉදි කිරීම්, ජලාශ ඉදි කිරීම්වලදී පාංශු ඛාදනයට ලක් වෙනවා. මේ තත්ත්වය විධිමත් කරන්න කියන එක මම හිතන්නේ අද රටේ මහචාර්යවරුන් පෙන්වා දෙද්දී ආණ්ඩුවත් මේ පිළිබඳව මීට වඩා සැලකිල්ලක් ගත්තොත් මේ ජීවිතවලට ආරක්ෂාවක් තිබෙනවා කියන එක මම මතක් කරන් කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.22 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.22 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ කාරණය පිළිබඳව අදහස් දක්වන්න මට කාලය ලබා දීම සම්බන්ධව බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. අද දවසේ මාතෘකාව බවට පත් වෙලා තිබෙන්නේ මේ පවතින අයහපත් කාලගුණ තත්ත්වය. අපට මතකයි මීට වසර ගණනාවකට ඉහතදී සුනාමි ලංකාවට වදින වෙලාවේදී ඒ වචනයවත් අපට හුරු පුරුදු එකක් වෙලා තිබුණේ නැහැ. එදා අපි අලුතෙන් කථා කරන්න පටන් ගත්තා ස්වභාවික ව්‍යසනයන් පිළිබඳව. එවැනි ක්‍රියාමාර්ග ගත යුතුයි කියලා එදා අපි සාකච්ඡා කළා. ඒ විතරක් නොවෙයි. වෙරළ බඩ තීරයේ අලුතෙන් ඉදි කිරීම්, පදිංචි වෙලා ඉන්න ජනතාව බේරා ගැනීම් වැනි මාතෘකා පිළිබඳව අපි දිගින් දිගටම සාකච්ඡා කළා. ඒ වෙලාවේදී යම් වැඩ සටහනක් ක්‍රියාත්මක වුණා. සුනාමියෙන් විපතට පත් වූවන් බේරා ගන්නවාට වඩා - ඒ වෙලාවේ බේරාගන්න බැරි වුණා. නමුත් ඉදිරියේදී ගත යුතු ක්‍රියා මාර්ගයන් සඳහා යම් වැඩ සටහන් ක්‍රියාත්මක වුණා. නමුත් පසු කාලීනව අපි දැක්කා, මේ වෙරළ තීරයේ ඉදි කිරීම් සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ග යළි ආපසු හැරවෙන විධිය. ඒවා ක්‍රියාත්මක නොවන විධිය. අපි දන්නවා, ස්වභාවික ව්‍යසනයකින් අහිමි වෙන්නේ දේපළ පමණක් නොවෙයි. විශාල වශයෙන් ජීවිත අහිමි වෙනවා. අපි දැක්කා, පසුගිය දවස්වල කොස්ලන්ද නාය යෑම නිසා ඇති වුණු හානිය. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, අද වනකොට කොස්ලන්ද නාය යෑමෙන් මියගිය පිරිස කොපමණද කියලාවත් අපි දන්නේ නැහැ. ඒවා සංඛ්‍යා ලේඛන නැති මරණ බවට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා මේ වෙලාවේදී අපි යළි මතක් කරන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් අපි ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාද කියලා. විශේෂයෙන්ම අපි දන්නවා 2005 දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය යම් අනතුරු ඇඟවීමක් කළා. ඒ වාගේම 2011 දී එම අනතුරු ඇඟවීම යළිත් අලුත් කළා. පසුගිය දා මීරියබැද්ද ප්‍රදේශයේ සිදු වූ නාය යෑමෙන් දැනට ප්‍රකාශ වෙන්නේ 39 දෙනෙකු පමණ අතුරුදන් කියලා. ඇත්ත වශයෙන්ම මිය ගිය ප්‍රමාණය මීට වැඩි විය හැකියි. නමුත් අපි මේ අවස්ථාවේදී විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ, මේ අනතුරට ලක් වූ ප්‍රදේශ පමණක් නොවෙයි. අනතුරු ඇඟවීම් නිකුත් කරලා තිබෙන, තර්ජනයට ලක් වූ ප්‍රදේශ පිළිබඳව විශේෂයෙන්ම අපි දන්නවා, මේ ප්‍රදේශය නාය යනවා කියූ පමණින්

ජනතාව එම ප්‍රදේශවලින් ඉවත් වෙන්නේ නැහැ. ඒ මිනිස්සුන්ට ප්‍රමාණවත් විකල්පයක් දෙන්න ඕනෑ. ඒක රජයේ වගකීමක්. ඒක අපේ වගකීමක්. ජනතා නියෝජිතයින් විධියට අපට ලොකු වගකීමක් තිබෙනවා මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න.

ගරු සභාපතිතුමනි, අර කොළඹදී ඉඩම් ටික අරගෙන ගෙවල් හදන්න ඕනෑ වුණාම මිනිස්සු භය කරලා, තර්ජනය කරලා, සුදු වෑන්වලින් ගෙනියනවා වාගේ වැඩ සටහන්වලින් නොවෙයි. නමුත් ජනතාවට ප්‍රමාණවත් විකල්පයක් දීම සිදු විය යුතුයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම මියගිය ප්‍රමාණය සැලකීමෙන් හෝ අනාගතය සඳහා පියවර නොගැනීමෙන් මේ ප්‍රශ්නයට ප්‍රමාණවත් පිළිතුරක් ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම මම මේ කාරණය මතු කරලා කියන්නේ ගරු සභාපතිතුමනි, අපි දන්නවා කළුතර දිස්ත්‍රික්කයත් බස්නාහිර පළාත් සභාවට අයිති ප්‍රදේශයක්. මේ ප්‍රදේශයේ දැනටමත් නාය යෑම් තර්ජන තිබෙනවා. මේ ප්‍රදේශයේ නාය යෑම් තර්ජනය පිළිබඳවත් අද ඊයේ නොවෙයි 2005 සිටම විශේෂයෙන් ප්‍රකාශ වෙලා තිබෙනවා. විශේෂඥයෝ කියලා තිබෙනවා. අපි දන්නවා පසුගිය කාලයේ නාය යෑම්වලින් කළුතර දිස්ත්‍රික්කයේ විතරක් 13 දෙනෙකු මරණයට පත් වුණා. ඒ පිළිබඳව අපේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා පවා සාක්ෂි දරයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ කියන්න වැදගත් වෙන්නේ, බස්නාහිර පළාතේ පවතින තර්ජනය පිළිබඳව සලකා බලා තාවකාලික පැලැස්තර විසඳුම් නොවෙයි, ස්ථිර සාර විසඳුම් අප ගත යුතුයි. යළි පදිංචි කළ යුතු නම් ඒ සඳහා පියවර ගත යුතුයි. ඒ සඳහා වැඩ පිළිවෙළ කුමක්ද? ඒ වාගේම ඒ සඳහා යම් කමිටුවක් පත් කර හෝ නාය යෑම් සම්බන්ධව තිබෙන අනතුරට යම් පිළියමක් ගත යුතුයි කියලා මම මේ සභාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 11 වැනි පිටුවේ 16 වැනි වගන්තිය යටතේ ලිපි ලේඛන ආදිය පිළිගැන්වීම යටතේයි මම මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්නේ. ඒකේ පළමුවැනි වගන්තියෙන් ඉතාමත් පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, ලිපි ලේඛන මේ සභාවට ඉදිරිපත් කරන්නේ කොහොමද? කාටද? ඒ සම්බන්ධයෙන් බලතල තිබෙන්නේ කියලා. එහෙම වුණත් සමගාමී සහෝදරාත්මක පළාත් සභා දෙකකම මම දන්න තරමට ඇමැතිවරුන් වෙත ලිපි ලේඛන ඉදිරිපත් කරන්න සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට අවස්ථාව තිබෙනවා. හැබැයි මේ සභාව තුළ මේ රීති සංග්‍රහය අනුව එහෙම අවස්ථාවක් ලැබිලා නැහැ. මම මෙහෙම මතු කරන්නේ, මගේ වරප්‍රසාදයක් විධියට මේ සභාවට එනකොට බස්නාහිර පළාත් සභා ඒකාබද්ධ උපාධිධාරී සංගමයෙන් යම් පිරිසක් ඇවිල්ලා ඔවුන්ගේ වෘත්තීය සමිති විධියට ඉදිරිපත් කරපු කාරණයක් තිබෙනවා. බරපතළ අසාධාරණයට ලක් වෙලා තිබෙනවා කියලා. වගන්ති දෙකක් අනුව ඒ අය පැහැදිලි කරලා දීලා තිබෙනවා. 2006/6 වැටුප් චක්‍රලේඛය අනුව MN-5 වැටුප් ක්‍රමය ලබා දීම සහ සමාන පදනමකින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට කෙටියෙන් වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කියන්න කෝ?

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඇත්තටම සභා නීති රීති අනුව මෙවැනි ලේඛනයක් අපට හදිසි අවශ්‍යතාවයක් අනුව සභාගත කරන්න අවස්ථාවක් නැහැ. මහ ඇමැතිතුමාට යොමු කළ යුතු ලිපි ලේඛනයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට ඒක ලැබුණා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඉතින් මම පැහැදිලි කරන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හැමෝටම ලැබුණා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඒ ලිපිය මේ සභාවට එන හැම මන්ත්‍රී කෙනෙකුටම දුන්නා. එතුමා ඒ ලකුණක් දාගන්න හදන දෙයක්. ඒකට අවස්ථාව දෙන්න.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම මතු කරන්නේ ඒ ලිපිය සම්බන්ධ ගැටළුව නොවෙයි. මම මතු කරන්නේ මේ සෑම මන්ත්‍රීවරයෙකුටම ඒ අයිතිවාසිකම ලබා දීමට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරුණිකරලා බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් කඩ වෙලා නම් මම අවස්ථාව ලබා දෙනවා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම මතු කරන කාරණය නැවත වතාවක් පැහැදිලි කරන්නම්. මේ ලිපියේ අඩංගු කාරණා සම්බන්ධව නොවෙයි. සාමාන්‍යයෙන් මන්ත්‍රීවරුන්ටත් ඇමැතිවරුන් වෙත ලිපි ලේඛන භාර දීම සඳහා අවස්ථාවක් ලබා දෙන්න කියන එකයි මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ඒක ලබා දෙන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ සම්බන්ධව සභා කටයුතු කාරක සභාවේදී අවධානය යොමු කරලා ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන් ඒ අවස්ථාව ලබා දෙනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඔබතුමන්ලාගේ නියෝජිතයා සභා කටයුතු කාරක සභාවට එන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, සභා කටයුතු කාරක සභාවට එතුමන්ලාගේ නියෝජිතයා එනවා නම් අපට ඒක සාකච්ඡා කළ හැකියි. අද වනතුරු ඔබතුමන්ලාගේ පක්ෂය නියෝජනය කරන නියෝජිතයා සභා කටයුතු කාරක සභාවට ඇවිල්ලා නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කවුද ආවේ නැත්තේ? කවදාද ආවේ නැත්තේ? ඇවිල්ලා තියෙන්නේ. සභාව නොමඟ යවන්න එපා. ගරු සභාපතිතුමනි, මෙතුමා තමයි එන්නේ නැත්තේ. සභා කටයුතු කාරක සභාවේදී ඔබතුමාව මම දැක්කෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න තමයි මගේ මේ විශේෂ ප්‍රකාශය මම කරන්නේ. ගරු සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් වසර ගණනාවක් හිටපු මන්ත්‍රීවරයෙක් වශයෙන් බස්නාහිර පළාත් සභා ප්‍රතිපාදනවලින් 45% කට ආසන්න මුදලක් මම වෙන් කරන්නේ - ගරු ප්‍රධාන ඇමැතිතුමාත් දන්නවා. සැලසුම් අංශයේ උදවියත් දන්නවා. අධ්‍යාපනයට බව. එහෙත් මට වුණු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මම මේ කථා කරන්නේ. හැබැයි එය දීර්ඝ වශයෙන් කථා කරන්න මට විනාඩියක් හරි වැඩිපුර ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඇත්තටම බස්නාහිර පළාතේ අධ්‍යාපනය නංවන්න විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් අපේ පක්ෂ භේදයක් නැහැ. ඒක අපේ යුතුකමක්. කෙසේ වෙතත් මම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් හැම වර්ෂයකදීම 5 ශිෂ්‍යත්වය වෙන්න පුළුවන්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) (උසස් පෙළ) සඳහා නොයෙකුත් නිබන්ධන, ප්‍රශ්න පත්‍ර අපි යොමු කරනවා. ඒවා කාලයක් තිස්සේ වුණා. මීට කලින් හිටියේ හේමචන්ද්‍ර පළාත් අධ්‍යක්ෂතුමා වෙන්න පුළුවන්. අයිලප්පෙරුම මැතිතුමා වෙන්න පුළුවන්. එහෙම කාලයක් තිබුණා. එහෙත් මේ වසරේදී - ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය මට අවශ්‍යයි. මේ වසරේදී 5 ශිෂ්‍යත්වය සඳහා මම විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. එහෙත් ඒ ශිෂ්‍යත්ව පොත මුද්‍රණය කිරීමේ ඉඳලා මම අපහසුතාවයට පත් වුණා. ප්‍රතිඵල එනකල් මුද්‍රණකරුවාට මුදල් ලබා දුන්නේ නැහැ. පළාත් අධ්‍යක්ෂතුමාගේ තිබෙන යම් යම් ප්‍රශ්න නිසා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මුදල කියන්න. විශාල මුදල් කියන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කලාපයෙන්. විපක්ෂයේ මන්ත්‍රීවරු නොවෙයි. කලාපයෙන් ඒ ඒ ආයතනවලට ලබා දෙන්නේ. මම ඉල්ලීමක් කරන්නේ ගරු සභාපතිතුමනි, ප්‍රතිඵල ආවා. ඒක ඇගයීමට මම යම්කිසි දෙයක් ලබා දෙන්න හදනකොට මට දැන ගන්න ලැබුණා, තවමත් ඒ සඳහා මට අනුමැතිය ලබා දීලා නැහැ. බලනකොට මගේ පින්තූරයක් දාන්නත් බැහැ. එහෙම නම් මට ඒ සම්බන්ධව කියන්න ඕනෑ. මම කියන්නේ ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි පෘථජ්ජන මිනිස්සු. අපේ නම විතරක් දාන්න පළාත් සභා ප්‍රතිපාදන කියලා. මගේ ඡායාරූප මට ඕනෑ නැහැ. කෙසේ වෙතත් ඔබතුමාගේ පළාත් අධ්‍යක්ෂතුමාගේ විමල් ගුණරත්න මැතිතුමාගේ කාර්යාලයට ගිය වෙලාවේ පැයක් මම හිටගෙන හිටියා. මේ අධ්‍යක්ෂතුමා මට ඉඳගන්න කිව්වේ නැහැ. ඒ වාගේම කිසිම ගණන් ගැනීමක් නැහැ. එතුමා රැස්වීම්වලට යනවා. එතුමා ගණන් ගන්නේ නැහැ. මම බලාගෙන ඉඳලා, නැගිටලා ගියා. මේ අධ්‍යක්ෂතුමාව තමයි මීනුවන්ගොඩ නාලන්දාවෙන් ගහලා එලෙව්වේ. ගුරුකුල මහ විද්‍යාලයෙන් ගහලා එලෙව්වේ. ඒ වාගේම තර්ස්ටන් විද්‍යාලයෙන් ගහලා එලෙව්වේ මේ විමල් ගුණරත්න අධ්‍යක්ෂතුමාව. අපි ළඟ ඡායාරූප තිබෙනවා. මේ වාගේ අධ්‍යක්ෂවරුන්ට මේ පළාත නංවන්න පුළුවන්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පළාත් අධ්‍යක්ෂතුමාට එහෙම අගෞරව කිරීමට අපේ විරෝධය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අධ්‍යාපන සංකල්පය ක්‍රියාවට නංවන්න පුළුවන්ද? මම ඉල්ලීමක් කරනවා මේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මැදිහත් වෙන්න. මෙහෙම නිලධාරීන්ව පාච්චල් කරන්න බැහැ. බුලත් අතක් දීලා පිළිගන්නද කියන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, විමල් ගුණරත්න කියන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට, කටුස්සාට මල් මාලයක් දාලා වාගේ. එතුමා මහ ඇමැතිතුමා වාගේ නොවෙයි. මහ ඇමැතිතුමාගේ ක්‍රියාකාරකම් දන්නේ නැතුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒ විතරක් නොවෙයි. එතුමාට ඕනෑ විධියට ගමනක් යන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් මට වුණු අසාධාරණය වාගේ - තවමත් මා වෙනුවෙන් මෙය අනුමත කරලා දීලා නැහැ. එහෙම නම් මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න වාගේම, ඉදිරි පළාත් සභා අයවැය විවාදවලදී එතුමාගේ අක්‍රමිකතා, එතුමාගේ විෂමාචාර මම පොත් ගණන් ගෙනැල්ලා මේ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා වහාම පරීක්ෂණයක් කරලා මන්ත්‍රීවරුන්ගේ ගරුත්වයත්, ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන සම්බන්ධව විධිමත්, පක්ෂ විපක්ෂ නැතුව හැමෝටම එක නීතියක් යටතේ කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

උපරිම කෙටියෙන් කියන්න උත්සාහ කරනවා ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම මේ ස්ථානයේ මම නැති වෙලාවේ, මම විශේෂ රාජකාරියකට ගියේ. ඒ අවස්ථාවේ මම කරපු සත් කාර්යයක් ඉතාමත් වැරදි විධියට අර්ථ නිරූපණය කරමින් ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කටයුතු කරලා තිබෙනවා. මේ ප්‍රකාශයම කඩුවෙල මහ නගර සභාවේ ප්‍රියන්ත පත්බේරිය විපක්ෂ නායකතුමා පසුගිය සභා වාරයේදී කරලා තිබුණා, ඉතාම කුහක, පටු අදහසින්. හැබැයි, ඒක කරපු එකේ දිට්ඨධම්මවේදනීය කර්මයටද කොහේද අද උදේ වනකොට එතුමාගේ ආසන සංවිධායක ධූරයත් නැති වෙලා. උදාර රත්නායක අලුත් මන්ත්‍රීතුමාට ලැබිලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ වාගේම මම කියනවා මේ සිද්ධියට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජෝර්ජ්ටත් එහෙම වෙනවා කියලාද කිව්වේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් මේ වාගේ දේවල් ඇදලා ගන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම විශ්වාස කළා ජ්‍යෝෂ්ට මන්ත්‍රීවරයෙක්, විපක්ෂයේ හිටපු සංවිධායකතුමා වාගේ අය මෙහෙම දේවල් ගේන එක සුදුසු නැහැ කියලා. විශේෂයෙන්ම මේ සිද්ධිය සම්බන්ධයෙන් කියනවා නම් මීට වසර කිහිපයකට පෙර මගේ ආදරණීය අම්මා නැති වුණා. ඒ නැති වුණු කාල පරිච්ඡේදයේදී දිගටම මම විවිධ -

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඕක පෞද්ගලික පැහැදිලි කිරීමක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඇයි කාටද ප්‍රශ්නේ?

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

වරප්‍රසාදය අපට පැහැදිලි නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමාගේ පාඩුවේ ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගැටුම්වලට යන්න අවශ්‍ය නැහැ. කෙටියෙන් කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පැහැදිලිව තමයි කියන්නේ. විශේෂයෙන් අපි කවුරුත් තමන් හැදූ වැඩූ දෙමව්පියන්ට ආදරෙයි. ඒ වාගේම අපි බෞද්ධයෝ විධියට විවිධ කුසල කර්ම, පිංකම් කරනවා. විශේෂයෙන් මැණියන් නැති වුණු වෙලාවේ ඉඳලා. ඉතින් පසුගිය කාලයේ මම ඒ කටයුතු කරන අතරතුර විමධ්‍යගත ප්‍රතිපාදනවලිනුත් වැඩ කටයුතු කරලා තිබුණා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මේ කරන්නේ පෞද්ගලික පැහැදිලි කිරීමක්. වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්න කියලා කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කහන්තොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා රීතිවල තිබෙන්නේ 36 (1) වරප්‍රසාදය කෙටියෙන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ කාරණාවට අදාළව ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දීර්ඝ පැහැදිලි කිරීම්වලට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ කාරණාව පැහැදිලි කරන්න මම මොනවාද කියන්නේ. මට එහෙම නම් ලියවිල්ලක් ලියලා දෙන්න වෙයි. මෙන්න මේක විතරක් කියන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න කෝ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම මේ කියන්න හදන්නේ මේ සිද්ධිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට කියන්න කෝ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමාට තමයි කියන්නේ. මෙතැනදී විදුහල්පතිතුමාගේ ඉල්ලීමට අපි ඒ පාසලේ බුදු මැදුරක් ඉදි කරන්න කටයුතු කළා. ඒ අතරේ මගේ අනෙකුත් පිංකම් සිද්ධ වුණා. මගේ අතිනුත් රුපියල් 50,000/- ක් විතර ඒ කටයුතුවලට ඉල්ලා ගත්තා. ඒ පැහැදිලි කිරීමත් කළා. ඒ මුදලුත් දුන්නා. ඊට අමතරව ප්‍රදේශවාසීන්ගේ වෙනත් මුදලුත් ලබා දීලා තිබෙනවා. ඒ ලබා දුන් මුදලුත් එක්ක තමයි මේ බුදු මැදුර කෙරුණේ. ඉතින් ඒ අවස්ථාවේ ගම්වාසීන්, පාසල් සංවර්ධන සමිතිය, විදුහල්පතිතුමා කිව්වා, මේ කටයුත්තට අපි අනෙක් අයගේ නම් දානවා පිං පිණිස කියලා, මේ අවස්ථාවේ දැම්මාට කමක් නැහැ කියලා ඉල්ලීමක් කරපු නිසා මම අවස්ථාව දුන්නා. අවශ්‍ය නම් ඒක විදුහල්පතිතුමාට කියලා ගලවලා දැම්මාට මට ප්‍රශ්නයක් නැහැ. නිකම් නැති තැන මඩ ගහලා, බොරු සිද්ධි මතු කරන්න එපා කියලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒකේ තියෙන්නේ පළාත් සභා ප්‍රතිපාදන කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම ගෞරවයෙන් මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

පළාත් සභා ප්‍රතිපාදන කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලැජ්ජයි පළාත් සභා ප්‍රතිපාදනවලින් ඔය වාගේ වැඩ කරන ඒවා ගැන.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මම කිව්වා පළාත් සභා ප්‍රතිපාදනත් තිබෙනවා. හැමෝගේම පුද්ගලික ආධාර මුදල් තිබෙනවා. මගේ විතරක් නොවෙයි. හැමෝගේම. ඒ නිසා අසත්‍ය ප්‍රකාශයක් කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි. ලැජ්ජ නැති ප්‍රශ්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නිකම් ගෙඕ පාට් දාන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පළාත් සභා ප්‍රතිපාදනවලින් කරලා තමන්ගේ අම්මාගේ නම දාගන්න ලැජ්ජයි නේ?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න. මම අවස්ථාව දෙන්නම්. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ කාරණාව කථා කළේ ගරු මන්ත්‍රීතුමා සභාවේ නැති අවස්ථාවක. මගේ යුතුකමක් තිබෙනවා එතුමාට ඒ සම්බන්ධව අවස්ථාවක් ලබා දෙන්න. ඒ නිසා මම අවස්ථාව ලබා දුන්නා. නමුත් එතුමා දීර්ඝව පැහැදිලි කළා. එතුමාට අයිතියක් තිබෙනවා එතුමාට වුණු හානිය සම්බන්ධව මේ සභාවට පැහැදිලි කිරීමක් කරන්න. ඒ අයිතිය අපි එතුමා දෙන්න ඕනෑ. ප්‍රශ්නයක් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා එතුමාගේ ප්‍රතිපාදනවලින් 45% ක් අධ්‍යාපනයට වෙන් කරනවා කියලා. 45% ක් වෙන් කරන්න බැහැ. ප්‍රතිපාදනවලින් 20% යි අධ්‍යාපනයට වෙන්න කරන්න පුළුවන්. මෙතුමාට විතරක් 45% ක් වෙන්න කරන්න පුළුවන් නම් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බොරුවේ සීමාවක් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

දෙවැනි කාරණය ශිෂ්‍යත්ව ළමයින්ට එක එක්කෙනාගේ නම් ගහලා දෙන්න කිසිම සුදුසුකමක් නැහැ. එක එක ප්‍රශ්න පත්‍ර දීලා ළමයින්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. අපේ වරප්‍රසාදය. අනෙක් කාරණය මේ අධ්‍යක්ෂතුමා ඇවිල්ලා අවුරුදු ගාණනක් වෙනවා. එතුමාගේ වරදක් තිබුණා නම්, එදා කියන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා තමයි අජ්මාල් මන්ත්‍රීතුමාගේ -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

පුටුව දුන්නේ නැහැ කියලා චෝදනා කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා -

[සභාවේ ඝෝෂා]

අල්ලස් කථා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

වරදක් තිබුණා නම් නිවැරැදි කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඔබතුමාට දැන්ද මතක් වුණේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අජ්මාල් මන්ත්‍රීතුමාගෙන් - ඇමැතිතුමා ලක්ෂ 35 න් ලක්ෂ 10 ඉල්ලා ගත්තා. මේවා, අතේ තියෙනවා ලිඛිතව. ඒ ටේප් එක තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒවා අහගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා. හරි හරි ඒක මම එතුමාට කියන්නම්.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. සභාවේ න්‍යාය පත්‍රයට යන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ලක්ෂ 35 ගත්තා. ලක්ෂ 10 ක් සල්ලිවලට දෙයියනේ. අර ලක්ෂ 35 යෝජනා ටික-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යූ. ජොර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මයික් එක ඕෆ් කරලා පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ, දිගින් දිගටම මේක යන්න බැහැ. රීති ප්‍රශ්නයි. 36(1) යි. සභාවක් මේක.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේවාට අදාළ නැහැ, මගේ රීති -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීතිය කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36(1) යටතේ. හොරණ කලාපයේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

36(1) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න. රීති ප්‍රශ්නය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

රීති අංකය කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිව්වා. කිව්වා. 36(1) එක කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මොකුත් කිව්වාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඇහුණා එතුමා කියනවා. ඔබතුමාට ඇහුණේ නැති වුණාට මට කරන්න දෙයක් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරියට කියන්න. 36(1) ද, 2 ද ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. 36(1) කියලා කියනවා මට ඇහුණා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

36(1) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ ප්‍රශ්නය ඉවරයි. එතුමාට එච්චර කථා කරන්න දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය හරි දැන්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

වරප්‍රසාද ප්‍රශ්න තමයි. මගේ වරප්‍රසාදයක් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙනත් ප්‍රශ්නවලට යන්න දෙන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලක්ෂ 25 යි කිව්වාම 10 ක් ගෙව්වා කියලා කියන්න මෙතුමාට අයිතියක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මේ වාගේ හරක් කියන කථා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ රීති කියලා වෙන වෙන කාරණා කියන්න දෙන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලක්ෂ 35 ක් අරගෙන 10 ක් ජරාව කනවාද අපි. එක්සත් ජාතික පක්ෂය කාපුවා මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ලක්ෂ 35 දුන්නේ මහජනතාවට වැඩ කරන්න. අර අප්මාල්ව සල්ලිවලට විකුණන්න නොවෙයි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අපි අප්මාල්ට වික්කේ නැහැ. තමුන්නාන්සේ කියන තුප්පහි වැඩ අපි කරලා නැහැ. එක්සත් ජාතික පක්ෂය තමයි ගොන් වැඩ කරලා තිබෙන්නේ. තමුන්නාන්සේ කරන පාහරකම්, තුප්පහි කථා අපට කියන්න එපා. තමුන්නාන්සේ ඔප්පු කරලා පෙන්නන්න ඕනෑ. අපි ඒ වාගේ වැඩ කරලා නැහැ. හරකෙක් වාගේ කථා කරන්න එපා. සක්කිලි වැඩ අපි කරලා නැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අලි හොරකම.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

තමුන්නාන්සේ වාගේ සක්කිලි වැඩ කරලා නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු මහ ඇමැතිතුමා දන්නවා මේ ගැන.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අලි හොරකම.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

තමුන්නාන්සේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

වැරදි චෝදනා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

එහෙමනම් හැන්සාඩ් එකෙන් අයින් කරන්න කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතුමා චණ්ඩියෙක් වෙලා ඉන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේවා තුප්පහි කථා. තාත්තා හොරෙක් වෙන්න ඇති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අයින් කරන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, එතුමා චණ්ඩියෙක් වෙලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කිසි දෙයක් ඇහුණේ නැහැ. දෙන්නා මොනවද එහෙන් මෙහෙන් කෑ කෝ ගැහුවා. ඇහුණේ නැහැ.

**[**සභාවේ ඝෝෂා**]**

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අයින් කරන්න දෙයක් නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අයින් කරන්න දෙයක් නැහැ. ඇහුණේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, -

**[**සභාවේ ඝෝෂා**]**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභාව විහිළුවක් කරන්න එපා. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා ඇයි මේ සභාව හෑල්ලුවට ලක් කරන්නේ? ඇයි හෑල්ලු කරන්නේ. ගරු සභාවක් මේක. මේ නවක මන්ත්‍රීවරු හොඳයි. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු තමයි මෙතැන කෑ ගහන්නේ. සභාව විහිළුවක් කරන්නේ. සභාව විහිළුවක් කරන්න එපා. ඔබතුමා කථා කරන්න කෝ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

තවම කට්ටිය දන්නේ නැහැ. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකර නිශ්ශබ්ද වන්න. සභාවේ විහිළු කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රොකට් එකක් යවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා සභාවට එන්නෙත් පරක්කු වෙලා. වෙලාවට එන්නෙත් නැහැ. ඇවිල්ලා විහිළු කරනවා. ඔබතුමා ප්‍රශ්නය කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්න දෙකක්. පළමුවැනි එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකක් කියන්න. කෙටියෙන් කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එකයි. එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙකක් කියන්නේ නැතිව ඔබතුමා එකක් කියන්න.

**[**සභාවේ ඝෝෂා**]**

මට දැන් රීති ප්‍රශ්න වැඩි වෙලා තිබෙන්නේ. එකක් කියලා ඉවර කරන්න. දෙකක් කියන්න ගියොත් මාව තවත් අමාරුවේ වැටෙනවා. එකක් කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා වතුර බිව්වා නේ. පළමුවැනි එක. හොරණ කලාපයේ ව්‍යූහ කමිටු රැස්වීම එකක් කියනවා. අනික් එක කියන්නේ නැහැ. ඊළඟ එක කියන්නේ නැහැ. දෙකකට එකක් කියන්නේ. එහෙම මොකක් හරි ක්‍රමවේදයක් තිබෙනවාද, පළාත් සභා මන්ත්‍රීවරුන්ට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම තමයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සමෘද්ධි එකක් නොවෙයි මේ අහන්නේ. ව්‍යූහ කමිටු රැස්වීම ගැන.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

විරුද්ධ පක්ෂයට එහෙම තමයි කියන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හොරණ කලාපයේ ව්‍යූහ කමිටු රැස්වීම්, දෙකක් කියන්නේ නැහැ. එකක් කියනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩු පක්ෂයට දෙකයි. විපක්ෂයට එකයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ඒ නිසා -

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ලියුම හම්බ වෙන්නෙත් නැද්ද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අනික් ඔක්කොම ලියුම් හම්බ වෙන කොට ඒ ලියුම හම්බ වෙන්නේ නැත්නම් මොකක් හරි වෙන දෝෂයක් තිබෙන්න ඕනෑ.

**[**සභාවේ ඝෝෂා**]**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඒ ප්‍රශ්නය අපි බලමු කෝ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ඒක බලන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කළුතර න්‍යාය දෙකට එකයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දෙවැනි එක. ගරු සභාපතිතුමනි, මම පෙරෙයිදා රාත්‍රියේ හොරණ නගරයේ ජෙනරල්ට මෙච්චර භය ඇයි? කියලා පෝස්ටර් අලවනකොට පොලිසියෙන් ඇවිල්ලා නැවැත්තුවා. ඇයි දන්නේ නැහැ ගරු සභාපතිතුමනි, එහෙම නැවැත්තුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම දන්නෙත් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ජෙනරල්ට මෙච්චර භය ඇයි කියලා සාටකය දාලා තිබෙන පෝස්ටරය අලවනකොට ඇවිල්ලා නැවැත්තුවා. ඇයි දන්නේ නැහැ එච්චර භය?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක ගිහිල්ලා පොලිසියෙන් අහන්න. සභාපතිතුමා කොහොමද දන්නේ ඒක.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

වරප්‍රසාදවලට අයිති නැහැ ඕවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඇයි? පොලිසියෙන් නේ මාව නැවැත්තුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා වාඩි වෙන්න කෝ. දැන් මෙතුමාගේ ප්‍රශ්නය කියන්න කෝ. කෙටියෙන් කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අත්අඩංගුවට ගත්තොත් පොලිසිය ප්‍රශ්න කළොත් ඒක වරප්‍රසාද ප්‍රශ්නයක්ද? රීති සංග්‍රහයේ වරප්‍රසාද ප්‍රශ්න විග්‍රහ කරලා තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා,

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඒවාට පිටින් වරප්‍රසාද ප්‍රශ්න නඟන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා හරි ප්‍රසිද්ධයි එක දෙයකට.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒකේ මහ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පොලිසිය හිතුවද දන්නේ නැහැ මේ වැඩේ ආයේ පටන් අරගෙන කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් කියන්න කෝ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. 36(1) යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එනකොට එහෙම මොකුත් ප්‍රශ්නයක් වුණාද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මට එහෙම ප්‍රශ්නයක් නැහැ. දැන් මට ප්‍රශ්නයක් ඇති වුණා, මේ සභාවේ අපේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙයි, අපේ යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙයි ඇතුළේ. සාමාන්‍යයෙන් අපි දන්න විධියට අපට ලක්ෂ 35 යි ප්‍රතිපාදන දෙන්නේ. දැන් මෙතැන කථා වුණා 35 ක් දීලා 10 ක් ගන්න කථාවක්. ඒ කියන්නේ ලක්ෂ 10 ක් වැඩිපුර දෙන කථාවක්. ඉතින් මම හිතන්නේ අපි මන්ත්‍රීවරු හැටියට අපි දන්න විධියට අපට ලක්ෂ 35 යි දෙන්නේ. ඊට එහා තව ලක්ෂ 10 ක් එහෙම අමතරව දෙනවාද කියලා දැනගන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එහෙම එකක් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ඔබතුමා වාඩි වෙන්න. ඒවාට විෂයය භාර ඇමැතිවරු ඉන්නවා. වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

නැහැ. මගේ ප්‍රශ්නය විසඳුනේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

වරප්‍රසාද ප්‍රශ්නය -

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක එහෙම යන්න දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. කරුණාකර වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මගේ වරප්‍රසාද ප්‍රශ්නය විසඳුනේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය විසඳුනේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මගේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා නේ අනවශ්‍ය කථාවලට ගිහිල්ලා ප්‍රශ්න අහගන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අනවශ්‍ය කථාවක් නැහැ. ලක්ෂ 35 යි හම්බ වෙන්නේ. මොකද අනවශ්‍ය වෙන්නේ. ලක්ෂ 35 -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බරපතළ අපහාසයක් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. තව මන්ත්‍රීවරු 102 ක් මේ සභාවේ ඉන්නවා. ඒ අයට අවස්ථාව දෙන්න ඕනෑ. ඔබතුමාටයි අනික් මන්ත්‍රීවරුන්ටයි විතරක් දෙන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

නැහැ. නැහැ. ගරු සභාපතිතුමාමයි ප්‍රශ්නය විසඳන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ සභාවේ තව මන්ත්‍රීවරු 102 ක් ඉන්නවා. ඒ අයටත් අවස්ථාවක් දෙන්න ඕනෑ. ඔබතුමන්ලාට මේ තනි තනියෙන් ප්‍රකාශ කරන්න ගියාම අනික් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිදු වෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මන්ත්‍රීවරයෙක්ට ලක්ෂ 35 යි දෙන්නේ. ලක්ෂ 25 ක් කොළඹට දුන්නා නම් ඒක ඔප්පු කරන්න ඕනෑ. මම මුළු කොළඹට ලක්ෂ 05 යි. ලක්ෂ 10 ක් ජරාව දුන්නා කියලා දූෂණ චෝදනා කරනවා නම් ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න. නැත්නම් ඔබතුමා ඔප්පු කරන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ වරප්‍රසාද කඩ වුණා නම් මම ඒ ගැන සොයා බලන්නම්. විෂයය භාර අමාත්‍යවරයාට ඒ කාරණාව ගැන යොමු කරලා මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්නේ ඇයි?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1). හා කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අද මට කෑ ගහන්න බැහැ. ඒක නිසා පොඩ්ඩක් අහගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් අද කෑ ගහන්න බැහැ. අමාරුයි. මට දැන් මහන්සියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපේ යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා වැඩක් නැහැ. දෙයියනේ ඔබතුමා ගැන කියන්න කෝ. මේ එක එක මන්ත්‍රීවරුන් ගාව ගන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට පොඩ්ඩක් කියන්න දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අනුන්ගේ වරප්‍රසාද ඔබතුමා කථා කරන්නේ ඇයි?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා නැඟුවේ ඉතාමත් බරපතළ ප්‍රශ්නයක්. ඒ කියන්නේ අපේ ගරු මහ ඇමැතිතුමාගේ අමාත්‍යංශය යටතේ මහ ඇමැතිතුමා යටතේ වංචාවක්, දූෂණයක් වෙනවා කියලා තමයි කිව්වේ. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ ගැන පරීක්ෂණයක් කරලා අපට ඒ ගැන පිළිතුරක් දෙන්න කියලා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි දැන් න්‍යාය පත්‍රයට යමු. දැන් මේ වේලාවේ තිබෙන්නේ න්‍යාය පත්‍රයට යන එක. අනේ ඔක්කෝම ටික ඉවරයි. කරුණාකර 36(1) ත් ඉවරයි. රීතිත් ඉවරයි. දැන් න්‍යාය පත්‍රයට යමු. න්‍යාය පත්‍රය අනුව ඊළඟට තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු. නමුත්, මට අද උදේ රීති අත්හිටුවීමේ යෝජනා දෙකක් ලැබුණා. එක යෝජනාවක් ලැබුණේ, පෙ.ව. 09.15 ට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ රීති අත්හිටුවීමේ යෝජනාව. පෙ.ව. 09.35 ට එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවක් ලැබුණා. ඒ අනුව මට සිද්ධ වෙනවා, මුලින් ලැබුණු ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙසට එතුමාට ආරාධනා කරන්න. සමාවෙන්න මරික්කාර් ගරු මන්ත්‍රීතුමා මට අවස්ථාව දෙන්න විධියක් නැහැ. යෝජනා දෙකක් තිබෙන නිසා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ කියන්නේ අද මේකෙන් පස්සේ හම්බ වෙන්නෙත් නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වේලාව තිබුණොත් දෙන්න පුළුවන්. තිබ්බොත් අපි බලමු. ඒ අනුව මම ආරාධනා කරනවා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට ඔබතුමාගේ රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, අලුත් ක්‍රමයක්ද? විපක්ෂයේ යෝජනාවලට අවස්ථාව ලැබෙන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි වේලාව තිබුණොත් ඔබතුමාට දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ මාතෘකාවට දැන් හයයි. පෞද්ගලික පැහැදිලි කිරීමක් ඉල්ලුවාමත් -

**[**සභාවේ ඝෝෂා**]**

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තනිකර සිරසේ යන හින්දා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

හය හින්දා දැන් හැමදාම ඒක යට යවනවා. මම හිතන්නේ ආණ්ඩු පක්ෂය ඒ මාතෘකාවට මුහුණ දෙන්න හයයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

වචන තේරෙන්නේ නැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

රටට ආදරෙයි කියන කට්ටිය, දේශප්‍රේමීන් කියන කට්ටිය ඒ මාතෘකාවට මුහුණ දෙන්න හයයි. මම යෝජනා කරනවා, සභාව දෙක වෙනතුරු ගිහින් ඒ යෝජනාව සම්මත කරමුයි කියලා. විවාදයක් ඕනෑ නැහැ.

**[**සභාවේ ඝෝෂා**]**

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බොරුවට කෑ ගහන්න එපා. ටී.වී. එකට මොනවා හරි කියන්න ඕනෑ නේ. ඒකයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි,-

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරස ඇවිල්ලා නම් හරි. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා නැඟිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරසට ගත්තා. සිරසට ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මයික් ඕන් කරගෙන කෑ ගහනවා. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු මහ ඇමැතිතුමා කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ටික ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාවක් දෙන්න කෝ. එතුමාට බාධා කරන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මන්ත්‍රීතුමාට පළාත් සභා ක්‍රමය ගැන, මේ සභාව හැසිරීම පිළිබඳව අවබෝධයක් නොමැති නිසා ඒ ප්‍රකාශය කරන්න ඇති. මොකද, පළමුවෙන්ම යෝජනාවල් ගෙනාපු වෙලාවල් කියලා ඔබතුමා පැහැදිලි කරලා දුන්නා පළමුවැනියට ගත යුත්තේ මේකයි කියලා. ඊට පස්සේ වෙලා තිබුණොත් අපට දෙවැනි යෝජනාව ගන්න පුළුවන්කම තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මම හිතන්නේ එතුමාට තත්පර කිහිපයේ සිරසේ එකේ වෙලාව අවසන් නිසා එතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජයවේවා.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දැන් ඔබතුමාගේ තත්පර තිහත් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, දැන් හරි නේ.

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති 107 යටතේ යෝජනාව ඉදිරිපත් කිරීම. ***"****කාර්ය පටිපාටි රීති 107 මඟින් සලසා ඇති ප්‍රතිපාදන අනුව පොදු වැදගත්කමකින් යුක්ත වූද හදිසි වූද පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම සඳහා කාර්ය පටිපාටි රීති 08(5), 08(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතින් අත්හිටුවිය යුතු යැයි මම යෝජනා කරමි.****"***

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:
## ස්වභාවික උවදුරු හා කාලගුණික විපර්යාසවලින් විපතට පත් වූවන්ට සහන සැලසීමට කඩිනම් වැඩ පිළිවෙළක් සැකසීම
IMPLEMENTING AN IMMEDIATE PROGRAMME TO PROVIDE RELIEF TO PERSONS AFFECTED BY NATURAL DISASTERS AND CLIMATIC CHANGES

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ***"****ස්වභාවික උවදුරු හා කාලගුණික විපර්යාසයන්වලට සමස්ත ලෝකයම ගොදුරු වෙමින් පවතින බව අප කවුරුත් පිළිගන්නා සත්‍යයකි. එබැවින්, බස්නාහිර පළාත් සභාව ලෙස මෙවැනි උවදුරු පැමිණි විට ඒ සඳහා මුහුණ දීමට හා එය වළක්වා ගැනීමට වෙනම ඒකකයක් පිහිටුවීම ඉතා කඩිනමින් කළ යුතු කාර්යයක් බවට පත්ව ඇත. ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ සමාජ*

*සේවා අමාත්‍යාංශයද ඒකාබද්ධව කඩිනමින් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම ගරු සභාව අදහස් කරයි."*

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභාවේ සියලු දෙනාගෙන්ම අවසරයි. අපේ ගරු සභාපතිතුමාට මම මේ අවස්ථාවේදී ස්තුතියක් කරන්න ඕනෑ. මේ අවස්ථාවට මට ආරාධනා කිරීම පිළිබඳව. 1993 වර්ෂයේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් මෙතෙක් කල් ආ ගමනේදී සුවිශේෂී අවස්ථාවක් තමයි මේ අවස්ථාව. විවිධ තනතුරු නියෝජනය කළත් කවදාවත් මම මේ මූලාසනය නියෝජනය කරලා නැහැ. ඒ අනුව මම මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්, අමාත්‍ය මණ්ඩලයෙන්, ඒ වාගේම සභාවේ ධූරධාරීන්ගෙන්, ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමාගෙන්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඇතුළු සියලුදෙනාගෙන්ම සහයෝගය ඉල්ලා සිටිනවා,මේ පුටුවේ, මේ මූලාසනයේ ගෞරවය රැකෙන පරිදි කටයුතු කරන්න සහයෝගය ලබා දෙන හැටියට. ස්තුතියි.

ඊළඟට තිබෙන්නේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට සභාව ඇමැතීමට. කාලය විනාඩි 10 ක් තිබෙනවා.

[පූ.භා. 11.58]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම මෙහෙම යෝජනාවක් ගෙනෙන්න අදහස් කළේ අද අපේ ශ්‍රී ලංකාව පමණක් නොවෙයි, අද මුළු ලෝකය පුරාම ස්වභාවික උවදුරු, කාලගුණික විපර්යාසයන් විටින් විට සිද්ධ වෙනවා. ඒක අපි කවුරුත් මාධ්‍යවලින් හොඳින් දැකලා තිබෙනවා. ඉතින් ඒකත් එක්කම අද අපි ලංකාව ගත්තාමත් ලංකාවේ දීර්ඝ කාලීනව, ජනගහණය වැඩි වෙන්න, වැඩි වෙන්න ඒ හරහා සිදු වෙන පරිසර හානියත් සමඟ අද මේ ලංකාවේත් ස්වභාවික විපත්, පරිසර හානීන් විශාල වශයෙන් සිදුවෙමින් යනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවක් හැටියට අපේ යුතුකමක් හා වගකීමක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවට මෙවැනි ස්වභාවික විපත් පැමිණීම වළක්වන්න කටයුතු කිරීමත්, ඒක අවම කර ගැනීමත් ඒ වාගේම එහෙම ස්වභාවික විපතක් ආවොත් ඒකට ක්ෂණිකව අවශ්‍ය පියවර ගන්න බස්නාහිර පළාත් සභාව හැටියට අපේ යුතුකමක් හා වගකීමක් තිබෙනවා.

විශේෂයෙන්ම ගංවතුර උවදුරුවලදී සමහර අවස්ථාවලදී අපි දැකලා තිබෙනවා, බස්නාහිර පළාත් සභාවක් හැටියට අපට අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ක්ෂණිකව උදව් ලබා ගන්න බැරි අවස්ථා තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාව හැටියට, බස්නාහිර පළාතේ ජනතාව හැටියට අපි මේකට විසඳුමක් ගන්න ඕනෑ. අපට මතකයි. අපි දීර්ඝ කාලීන ඉතිහාසය අරගෙන බැලුවාම අපි එක වේලාවක අපේ පළාත - අපේ පළාත විතරක් නොවෙයි. ලංකාවේ විශාල පළාත් රාශියක් සුනාමියෙන් යට වුණා. ඊට පස්සේ අපේ කඳු සහිත ප්‍රදේශ ගත්තාම නායයෑම්වලට ලක් වුණා. ඒ වාගේම සුළි සුළංවලින් ලොකු හානි සිදු වුණා. මේ කළුතර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම අගලවත්ත, මතුගම, බුලත්සිංහල වාගේ ප්‍රදේශ ගත්තාම, බණ්ඩාරගම වාගේ ආසන විශාල ප්‍රමාණයක් ඒ තත්ත්වයට මුහුණ දුන්නා. බස්නාහිර පළාතේ අනික් දිස්ත්‍රික්ක එක්ක ගත්තාම කළුතර දිස්ත්‍රික්කය විශේෂයි.

මේ මෑතකදී වුණු සිදුවීම තමයි අපි කවුරුත් දන්න, අපි සියලුදෙනාම ශෝකයට පත් වුණු අවස්ථාව අපේ කොස්ලන්ද ඛේදවාචකය. ජීවිත විශාල ප්‍රමාණයක් අපට නැති වුණා. අදටත් ඒ ජීවිත සොයාගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

එහිදී අපට එක එක්කෙනාට ඇඟිල්ල දික් කරන්න බැහැ. ඒවායේ එක එක වැරැදි තැන් තිබෙනවා. මේ වාගේ දේවල් වෙන්න ඉස්සෙල්ලා අපි මේවාට විකල්ප සොයාගන්න ඕනෑ. බස්නාහිර පළාතෙත් මෙවැනි දේවල් වෙන්න ඉස්සෙල්ලා අපි විකල්ප සොයා ගෙන ඒවාට පිළියම් යොදන්න ඕනෑ. අද ඒ ඛේදවාචකය ගත්තාම අපි කවුරුත් දන්නවා. සමහර දරුවන්ට අම්මා තාත්තා නැති වුණා. භාර්යාවන්ට තමන්ගේ ස්වාමි පුරුෂයා නැති වුණා. ස්වාමි පුරුෂයාට තමන්ගේ භාර්යාව නැති වුණා. අපි මාධ්‍යයෙන් දැක්කා. සමහර පවුල්වල දරුවන්ට කවුරුත් නැහැ. එකම එක්කෙනයි ඉතිරි වෙලා තිබෙන්නේ. සමහර පවුල්වල කවුරුත් නැහැ. පාසල් ගිය දරුවන් ටික විතරයි අද ඉන්නේ. අද ඒ තත්ත්වයට ඔවුන් පත් වෙලා තිබෙනවා. අපි ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේ කටයුතුවලදී සංවේදී නායකයෙක් හැටියට, පොළවේ පය ගහලා ඉන්න නායකයෙක් හැටියට අතිගරු ජනාධිපතිතුමා ක්ෂණිකව මැදිහත් වෙලා ඒ පහසුකම් සියල්ල ඒ ප්‍රදේශවලට සපයලා දීම පිළිබඳ. එසේ සපයලා දීලා රජයෙන් කරන්න පුළුවන් සියලු පහසුකම් ලබා දුන්නා. ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමාටත් අපි ස්තූතිවන්ත වෙනවා. පක්ෂ භේදයකින් තොරව විපක්ෂ නායකතුමා ඇතුළු ඒ පක්ෂ නායකයන් සියලුදෙනා ගිහිල්ලා දේශපාලන භේදයකින් තොරව තමන්ට කරන්න පුළුවන් මොකක්ද? ඒ හැමදේම කළා.

අතිගරු ජනාධිපතිතුමා එදා ඒ යුද්ධය නැති කරලා, යුද්ධයෙන් පීඩා විඳලා, ඒ බෝම්බ පුපුරලා විනාශයන් වන කොට ඒ තැන්වලට ගිහිල්ලා සංවේදී වුණු හැටි අපි දැක්කා. ඒ වාගේම අවස්ථාවක් තමයි අපි දැක්කේ. ඒ කොස්ලන්ද ප්‍රදේශයට ගිහිල්ලා ඒ දරුවන් දැකලා, ඒ පීඩාවට පත් වුණු ජනතාව දැකලා ඒ වාගේ හොඳ සංවේදී වෙලා, කරන්න පුළුවන් සියලු දේ එතැනදී කළා. අපි ස්තූතිවත්ත වෙනවා. අපි ගෞරව කරනවා, සංවේදී නායකයෙක් අපට ඉදීම පිළිබඳව. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බස්නාහිර පළාතේත් අපි කළුතර දිස්ත්‍රික්කය ගත්තාම විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ කඳු සහිත ප්‍රදේශ වැඩියි. තේ වගා කරන ප්‍රදේශ වැඩියි. ඒවාත් එක්ක අද ජලාශ වැඩියි. මේවාත් එක්ක අපි දැන්මම පරීක්ෂණ කරන්න ඕනෑ. පරීක්ෂණ කරලා මේවායේ ඒ වාගේ අවදානමක් තිබෙනවාද කියලා බලන්න ඕනෑ. මම කියන්නේ, ඒ පැති විතරක් නොවෙයි. කළුතර දිස්ත්‍රික්කයේ හැම තැනම ඒ වාගේ අවදානම් තැන් අපි දැන්ම ඒ අවශ්‍ය විශේෂඥයන් යොමු කරවලා, ඒ විශේෂඥයින්ගේ මඟපෙන්වීම අනුව ඒවාට අපි පිළියම් සොයා බලන්න ඕනෑ. ඒවාට අපට දෙන්න පුළුවන් සහනයන් ලබා දෙන්න ඕනෑ.

ඒකත් එකක්ම මම විශේෂයෙන්ම අපේ රටේ තිබෙන මාධ්‍ය ජාලයට ස්තූතිවන්ත වෙනවා. අපි දැක්කා, ඒ මාධ්‍ය ජාලය තුළ අපි විශාල වශයෙන් මාධ්‍ය ජාලය පවා කැපවීම් කළා. ස්වර්ණවාහිනී ආයතනය ගත්තාම, ඒ වාගේම සිරස ආයතනය ගත්තාම - සිරස ආයතනයට අපි ඇත්තටම ස්තූතිවන්ත වෙනවා. සිරස ආයතනය පැහැදිලි කරලා කිව්වා වෙනදාට සිරස ආයතනයෙන් ගම්වලට යන පාර දිගේ ආධාර එකතු කරගෙන යනවා කියලා. අද එහෙම දෙයක් නැහැ. එදා සිරස ආයතනය කිව්වා, පාරවල්වලට එන ඒවා අපට ගන්න විධියක් නැහැ. ඒ තරමට බඩු ලැබිලා තිබෙන්නේ කියලා. ඒ මහා ධනස්කන්දයක්, ජනතාවට විශාල සහන ප්‍රමාණයක් අරගෙන ගියා. අපි ඒ සිරස ආයතනය කරපු වැඩ පිළිවෙළත් එක්ක අපි ඒ ජනතාවටත් ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේ මහා කෘතවේදීත්වය දන්නා ජනතාවක් අපේ රටේ ඉදීම පිළිබඳව. අනික් මාධ්‍යත් එහෙමයි. ඒ මාධ්‍ය සියල්ල ඒ විධියට කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, පැහැදිලිවම මේ බස්නාහිර පළාත මඟින් මේකට විශේෂයෙන්ම මුහුණ දීලා තිබෙන මේ ව්‍යසනයන් වළක්වා ගන්න, නැවත ඒ වාගේ උවදුරුවලට බස්නාහිර පළාත පත් නොවෙන්න අපි බස්නාහිර පළාත මඟින් විශේෂ ඒකකයක් අපේ සමාජ සේවා අමාත්‍යාංශය හරහා අපට ඉතාමත් හොඳ, කැපවීමෙන් කටයුතු කරන හොඳ වැඩකාර ඇමැතිවරයෙක් ඉන්නවා. අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා තමයි සමාජ සේවා අමාත්‍යාංශය භාරව ඉන්නේ. එතුමාත් එක්ක ඒකාබද්ධ වෙලා ඒ සමාජ සේවා අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා මේ කාරණය ඉතා හොඳින් ක්‍රියාත්මක කරන්න බස්නාහිර පළාතේ ජනතාවට මෙවන් උවදුරකට කිසිදාක ලක් වෙන්නේ නැති වෙන්න, මේ ස්වභාවික විපත් වෙන්නේ නැති වෙන්න, ඒ වගේම පරිසර හානීන් වළක්වා ගන්න වෙනම ඒකකයක් පිහිටුවන ලෙස මම සභාවට යෝජනා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමනි. මීළඟට තිබෙන්නේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සභාව ඇමැතීම. ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.06]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන් මේ විපතට පත් ජනතාව වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවෙත්, මාගේත් ශෝකය ඒ පවුල්වලට ප්‍රකාශ කරන්න කැමැතියි. විශේෂයෙන්ම පසුගිය ඡන්ද කාලයේ මාත් ගිහිල්ලා හාලි ඇළ, කොස්ලන්ද වාගේ මේ ප්‍රදේශවල වැඩ කළා. ඒ ජනතාව කොපමණ අසරණව ජීවත් වුණාද කියලා අපට පෙණුනා. ඒ අවස්ථාවලදී අපි දැක්කා, මේ කෙරෙන සංවර්ධනයත් එක්ක කොපමණ පරිසර හානියක් සිදු වෙලා තිබෙනවාද කියලා. ඒක නිසා ඒ ජනතාව වෙනුවෙන් මම හිතන්නේ ප්‍රථමයෙන්ම අපි ඒ පවුල්වල අයට අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්. නමුත් මම හිතන්නේ මුලින්ම තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලගුණික විපර්යාස මේ ලෝකයම කියලා. අපි මේ ලෝකය ගැන කථා කරන්න ඉස්සෙල්ලා මම හිතන්නේ අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාත් දන්නවා මේ ලංකාව ගැන. ජාත්‍යන්තරයට බැණ බැණ ඉන්න කට්ටිය හැටියට මම හිතන්නේ මේ ලංකාවේ සිදුවන ආශ්චර්යය ගැන කථා කළොත් හොඳයි කියලා. ලංකාවේ සිදුවන ආශ්චර්යයේ පියමංකඩ තමයි අපට මේ පෙනෙන්න තිබෙන්නේ. අර කඩවත ඉදිවන එක වාගේ අද පේන්න තිබෙනවා, අපි ඊයේ පෙරෙයිදා දැක්කා දවස් දෙකයි වැස්සේ. කාපට් කරලා තිබෙන කොළඹ - මීගමුව පාර වැලිගම්පිටිය හන්දියේ මොනවාද වෙලා තිබෙන්නේ කියලා බැලුවොත් ආශ්චර්යය හොඳට බලාගන්න පුළුවන්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මොකද වෙලා තිබෙන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අලුතෙන් දාපු කාපට් එක පිම්බිලා, ගැලවිලා එළියට ඇවිල්ලා. ඔබතුමා එනකොට දකින්න ඇති නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දාල ඉවර නැහැ ඒක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දාල ඉවර නැත්තේ නැහැ. දැන් ඒ කැල්ල ආයේ කපලා ආයේ දානවා. මෙන්න මේක තමයි ආශ්චර්යය. අපි ඌව ඡන්දයට යද්දී දැක්කා පාරවල් හදනවා. ඒක හොඳයි. පාරවල් හදද්දී කොහොමද පාරවල් හදන්නේ -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

පාරවල් කැඩෙනකොට ඔබතුමන්ලාට හරි සන්තෝෂයි නේද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කිසිම ස්වභාවික -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පාරවල් හදන එක ගැන කථා කරන්න -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කථා කළේ ජනාධිපතිතුමාගේ ආශ්චර්යය ගැන. එතකොට අපි මොකුත් කිව්වේ නැහැ නේ? කියවන්නේ නැතිව ඔතැනට වෙලා ඉන්න. අපි කියන දෙයත් අහගෙන ඉන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වැදගත් යෝජනාවක් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැදගත් බව ඔබතුමා දැන ගන්න ඕනෑ ඔබතුමාගේ කථාවේදී කථා කරන්න. දැන් වැදගත්කම ගැන කථා කරලා වැඩක් නැහැ. මේකත් පොඩ්ඩක් අහගන්න. අපි දැක්කා, ඒ සංවර්ධනය කරන්නේ කොහොමද කියලා. ඕනෑ ඕනෑ වේලාවට එක එක්කෙනාට ඕනෑ ඕනෑ විධියට - එතුමා කථා කළේ සිරස ගැන නේ. අද ඔබතුමාගේ තත්ත්පර දෙකක් දායි. භය වෙන්න එපා. අපි දැක්කා, කොහොමද ඒ සංවර්ධනය වෙන්නේ කියලා. අද මේ රටේ සංවර්ධනය වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක එක්කෙනාට

ඕනෑ ඕනෑ පිළිවෙළට. දැන් අපි කිව්වොත් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට කොහේ හරි කොන්ක්‍රීට් ටිකක් දාන්න ඕනෑ කියලා එතුමා ගිහිල්ලා දානවා. සපත්තු කාණු දාන්න ඕනෑ වුණාම එතුමා ගිහිල්ලා සපත්තු කාණු දානවා. අන්න ඒ වාගේ තමන්ට ඕනෑ ඕනෑ විදියට කිසිම පිළිවෙළක් නැතිව, වැඩ සටහනක් නැතිව කරගෙන යන සංවර්ධනයක් තමයි අද තිබෙන්නේ. අන්න ඒකේ ප්‍රතිඵලය තමයි අද අපට භුක්ති විඳින්න වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතින් අපි කනගාටු වෙනවා. අද වෙන කොට අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනතාවට සහනයක් දෙන්න මාධ්‍ය ආයතවලින් යම් යම් පියවර අරන් තිබෙනවා. නමුත් මේ රජය විසින් මම දන්න තරමට තවම කිසිම සහනයක් මේ රටේ ජනතාවට දීලා නැහැ. ඒ මාධ්‍ය ආයතන ටික නැත්නම් -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බොරු කියන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලංකාවේ මොනවාද දීලා තිබෙන්නේ කියන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔබතුමා පිස්සන් කොටුවේද සිටියේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාධ්‍ය ආයතන ටිකයි මේ රටේ ජනතාවයි එකතු කරලා ගිහිල්ලා දෙන කෑම ටිකෙන් තමයි අද අසරණභාවයට පත් වුණු ජනතාව ජීවත් වෙන්නේ. ඒ ජනතාව ජීවත් වෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා,

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කිසි ආධාරයක් ඕනෑ නැහැ. ආණ්ඩුව ඔක්කෝම කරනවා. බොරු කියන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි මීට පෙරත් දැක්කා මේ වාගේ අසරණභාවයට ජනතාව පත් වුණාම හැමදාම ඒ ජනතාවගේ උදව්වට ආවේ මේ රටේ ජනතාව. ඔවුන් ගිහිල්ලා කෑම ටිකද, වතුර ටිකද - අපි ඡන්දය කාලයේදී දැක්කා. අර නියඟයට පත් වුණු ජනතාව වෙනුවෙන් වතුර එකතු කරලා ගිහින් දුන්නේ කවුද කියලා අපි දැක්කා. මේ රටේ ජනතාව. ඡන්දයට තමයි රුපියල් 2500/- ක් ගණනේ බෙදන්න ගත්තේ, නියඟයට සහනාධාර කියලා. එතකන් ඔය කියන ආශ්චර්යය කරන නායකයා දැක්කේ නැහැ, මේ රටේ නියඟයට පත් වෙලා ජනතාවට බොන්න වතුර ටික නැතිව ඉන්නවා කියලා. ඡන්දය ආපුවාම තමයි ඒක දැන ගත්තේ. එතකොට තමයි රුපියල් 2500/- ගණනේ සහනාධාර දෙන්න පටන් ගත්තේ. ඇත්ත කියද්දී කාටවත් කථා කරන්න බැහැ. එය අපට හොඳටම පැහැදිලිව පෙනෙනවා. මේවා ඇත්ත කියලා එතුමන්ලාත් දන්නවා. ඔන්න ඕක තමයි ආශ්චර්ය. ඒක නිසා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නිසා අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට කඬේ යන්න හැදුවාට මේ රටේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙම තමයි. ජනාධිපතිතුමාට කඬේ යන්නේ නැතිව විපක්ෂ නායකතුමාට කඬේ යන්නද?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කඬේ නොවෙයි. සුපර් මාකට් යන්නේ.

**[සභාවේ සෝෂා]**

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් මමද කථා කරන්නේ. මෙතුමාද කථා කරන්නේ. දැන් කවුද කථා කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා - ඔබතුමාගේ යෝජනාවක් නේ ගෙනත් තිබෙන්නේ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඕනෑ නම් තව විනාඩියක් දෙන්නම්. තව විනාඩියක් ඕනෑද? ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඉතිරි ටික කඩේ යන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා සඳහන් කළා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කඩේ යන්න එපා. සුපර් මාකට් යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද මට කෑ ගහන්න අමාරුයි. ඒක නිසා කෑ ගහන්න බැහැ. පොඩ්ඩක් අහගෙන ඉන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කිව්වා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පොළවේ පය ගහලා ඉන්න කෙනෙක් කියලා. අපි දැක්කා හෙලිකොප්ටරයෙන් ජනතාව බලන්න කොහොමද ගියේ කියලා. මම හිතන්නේ ඉක්මණට යන්න ඕනෑකම නිසා වෙන්න ඇති නේද? ඉක්මණට යන්න ඕනෑකමට හෙලිකොප්ටරයෙන් ගියා.

[සභාවේ ඝෝෂා]

මේ රජය අද කොළඹට කරලා තිබෙන විපත බලන්න. මේ සංවර්ධනය කියලා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා සභාවට ගැළපෙන්නේ නැති වචන පාවිච්චි කළා. තමුසේ කියලා.

[සභාවේ ඝෝෂා]

සදාචාරාත්මකව හැසිරෙන්න කියන්න. හැසිරෙන්න ඉගෙන ගන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

නායකතුමාට අමුඩයක් ගහන්න කියන්න පුළුවන් නම් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා යෝජනාවට අදාළව කථා කරන්න. මේ රටේ අසරණ වුණු මිනිසුන් වෙනුවෙන් ගෙනැල්ලා තිබෙන යෝජනාවක්. ඒ නිසා යෝජනාවට අදාළව කථා කරන්න. තව විනාඩියයි. මම ඔබතුමාට තව තත්ත්පර තිහක් වැඩිපුර දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අසරණ මිනිස්සු වෙනුවෙන් තමයි කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා සිරසට හොඳ කිව්වා. ඒක දායි. දැන් අපේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමාවත් දායි. කමක් නැහැ. දැන් මගේ විනාඩි පහ දෙන්න කථා කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ නැහැ. ඔබතුමාවත් දායි. හොඳ කථාවක් කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විනාඩි දෙකකට හරි කමක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් කියාගෙන ගියේ දැන් මේ සංවර්ධනය

[සභාවේ ඝෝෂා]

මට අද කෑ ගහන්න බැහැ. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කොහොමද මගේ කාලය අවසන් කරන්නේ. දැන් මම මෙතැන ඇවිල්ලා ඉඳගන්නවා. බැහැ. බැහැ. මගේ කාලය ලබා දෙන්න. මගේ කාලයට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාටයි, එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාටයි කථා කරන්න දීලා මගේ කාලය අවසානයි කියන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තමුන්නාන්සේට මම සානුකම්පිතව තව තත්ත්පර 30 ක් දෙන්නම්. කරුණාකර කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තව විනාඩියක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියාගෙන ගියේ දැන් මේ කොළඹටත් වෙන්නේ මේ ටිකම තමයි. කොළඹත් හිතෙන හිතෙන වේලාවට අර දුප්පත් අහිංසක මිනිසුන්ගේ පැල්පත් ටික කඩලා ලොකු සංවර්ධනයක් කරනවා කියලා කැසිනෝවලට තමන්ගේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීමා, ඔබතුමා දැන් ජ්‍යෙෂ්ඨත්වයට පැමිණෙමින් සිටින මන්ත්‍රීවරයෙක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සමීප අයට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ යෝජනාවට අදාළව මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලොකු ලොකු හෝටල් ගහන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. මේ රටේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. බොහොම ස්තුතියි. ඔබතුමාගේ කාලය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අහිංසක දුප්පත් ජනතාව අද අසරණ තත්ත්වයට පත් වෙන්න -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද වරප්‍රසාදය?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

වරප්‍රසාදය, සමස්ත බස්නාහිර පළාතේ ජනතාව නියෝජනය කරන්න -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

සති දෙකකට සැරයක් මේ ස්ථානයට එන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා වාඩි වෙන්න. වරප්‍රසාද ප්‍රශ්නයක්. 36(1)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම හිටගෙන ඉන්නම්. කමක් නැහැ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

සති දෙකකට සැරයක් තමයි මේ අහිංසක බස්නාහිර පළාතේ ජනතාව නියෝජනය කරන්න එන්නේ. මම දන්නේ නැහැ මේ තිබෙන කාලසීමාව තුළ මේ වාගේ විගඩම් නටන මන්ත්‍රීවරු ඉදීම අපට ලොකු ලැජ්ජාවක්. අපේ කාලයයි නාස්ති වෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කඩවුණු වරප්‍රසාදය සඳහන් කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

වරප්‍රසාදය, මට ඡන්දය දෙන ජනතාවට කරන ලොකුම අවාසියක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාට වේලාව ඉල්ල ගන්න කියන්න. ඔබතුමා වෙලාව ඉල්ලගෙන කථා කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමාට වෙලාව දෙන්නේ නැත්තේ ආණ්ඩු පක්ෂයෙන්. අපි නොවෙයි. ආණ්ඩු පක්ෂයෙන් වෙලාව ඉල්ලගන්න. අපි නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

පිස්සන් කොටුවට දාන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා වාගේ -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

බලන්න. බොහොම කුහක ලෙස අසික්කිත ලෙස -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කථා කළේ අහිංසක ජනතාව වෙනුවෙන්.

[සභාවේ ඝෝෂා]

තමුන්නාන්සේත් රාජපක්ෂ වෙනුවෙන් කඩේ යනවා, වැඩේ කරන්න. ඔය කඩේ යන එක දැන්වත් නවත්වලා ජනතාව වෙනුවෙන් වැඩක් කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හොඳයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සමන්මලී සකළසූරිය ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සමන්මලී සකළසූරිය**
Hon. Samanmalee Sakalasooriya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මේ කථාවෙන් පස්සේ අපි ඕක ගනිමුද? හදිස්සියක් නැහැ නේ. හදිසි ආන්තරාවක්ද? මොකුත් නැහැ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මේක බොහොම බරපතළ ප්‍රශ්නයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මට දොම්පේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය - හදිසිම එකක්ද?

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

හදිසිම එකක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ කියන්නේ හුස්ම ගන්න අමාරු එකක්ද?

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඔව්. ඔව්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙමනම් කියන්න. 36(1) ද?

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

36(1) යටතේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඔක්තෝබර් මස 28 දින ලිපියක් ලැබෙනවා, දොම්පේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයාගෙන්.

*"ඔබ විසින් පළාත් සභා රැස්වීමේදී වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය දොම්පේ ආසනයේ ඇති බව ප්‍රකාශ කිරීම සම්බන්ධයෙනි.*

*දොම්පේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක හා බස්නාහිර පළාත් සභා මන්ත්‍රී උපාලි ගුණරත්න මැතිතුමාගේ උපදෙස් පරිදි ඉහත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට එන්න"* කියලා.

එතකොට අපි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ වරප්‍රසාදය කොහොමද කැඩිලා තිබෙන්නේ?

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු මහ ඇමැතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කොහොමද මාව කැඳවන්නේ. (බාධා කිරීමක්) ගරු මහ ඇමැතිතුමනි, මම මේක කථා කළේ මෙතැනදී තිබෙන ප්‍රශ්න ගැන. එහෙම නම් අනික් එක මම විශ්වාස කරනවා උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාත් මෙතැන සාමාන්‍ය මන්ත්‍රීවරයෙක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එතුමා එහෙමනම් මට කියන්න ඕනෑ. ඇයි? මේ ප්‍රාදේශීය ලේකම්වරයා හරහා එවලා තිබෙන්නේ,

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාදයක් ඔය කියන කාරණය තුළ කැඩිලා නැහැ. මම තීන්දු කරන්නේ. එම නිසා කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාට වරප්‍රසාදයක් අහිමි වෙලා නැහැ. ඒක පෞද්ගලික කාරණාවක්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ නිලධාරීන් පළාත් සභාවේ කථා කරන එක සම්බන්ධව මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රශ්න අහන එක වරප්‍රසාද කඩවීමක්. රජයේ නිලධාරීන් කොහොමද මන්ත්‍රීවරුන්ව ප්‍රශ්න කරන්නේ පළාත් සභා සැසි වාරයේදී කථා කරන එක සම්බන්ධව. ඔබතුමා පක්ෂග්‍රාහීව තීන්දු දෙන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා ලිපිය සභාගත කරන්න. ලියුම කියවන්න. මමයි මූලාසනය තීන්දු කරන්නේ ඔබතුමාගේ වරප්‍රසාදය කැඩිලා තිබෙනවාද නැද්ද කියලා. ලියුම කියවන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මේ ලියුම මම සභාගත කරනවා.[4] ඒ වාගේම මගේ ජීවිතයට තර්ජනයක්.

[4] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කියවන්න. මූලාසනය තීන්දු කරන්නේ ඔබතුමාගේ වරප්‍රසාදය කැඩිලා තිබෙනවාද නැද්ද කියලා. කැඩිලා තිබෙනවාද කියලා තේරුම් ගන්න ලිපිය කියවන්න බලන්න. පැහැදිලි කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කැඩිලාද නැද්ද කියලා බලාගන්න -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙමනම් සමන්මලී සකලසූරිය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමාගේ කැඩිලා ගොඩක් කල්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මන්ත්‍රීවරයෙක් කියපු දෙයක් රජයේ නිලධාරීන් කොහොමද ප්‍රශ්න කරන්නේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මම උත්තර දුන්නාම ඉඳගන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔහොම ඉන්න ගරු මන්ත්‍රීතුමා. හැබැයි මතක තියාගන්න - මේ කැමරාවලට කියලද ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එතුමා එහෙම හිටපුවාවේ.

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

කැමරාව හොඳට අල්ලන්න.

[සභාවේ සෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තීන්දුවක් දෙන්න පළාත් සභා සැසි වාරයකදී කථා කරන එක සම්බන්ධව ප්‍රශ්න කිරීමේ අයිතියක් රජයේ නිලධාරීන්ට තිබෙනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසියම් මන්ත්‍රීවරයෙක් තමන්ගේ වරප්‍රසාද කඩ වූ බවට ප්‍රකාශයක් කරනවා නම් අඩුම වශයෙන් ඒක සාවධානව සවන්දීලා ඔබතුමාට පුළුවන් වෙන්න ඕනෑ, මේක පාලනය කරලා එතුමාට නිශ්චිත පිළිතුරක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම ඒක එතුමාට කිව්වා. ඒ කියන කාරණය වරප්‍රසාද කඩවීමක් නොවෙයි. කරුණාකරලා කථාව එතැනින් ඉවර කරන්න. ඊළඟට න්‍යාය පත්‍රයට යන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා දැන්වත් මෙතුමන්ලාව නිහඬ කරගෙන ඒ කාරණාවට සවන් දෙන්න කරුණාකරලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මේ පළාත් සභාව උත්තරීතර පළාත් සභාවක්. මතක තියාගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ උත්තරීතර පළාත් සභාවේ -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා පළාත් සභාව හැල්ලු කරන්න එපා. මේක කෝලම් මඩුවක් නොවෙයි. ගරු -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර මෙතුමන්ලා නිහඬ කරගන්න. එතුමා දැන් මෙතැන -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ පළාත් සභාවට අගෞරව කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි අගෞරව කරන්නේ නැහැ මේ උත්තරීතර සභාවට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සමන්මලී සකළසූරිය ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමා නිශ්චිත පිළිතුරක් දෙන්න. පළාත් සභා සැසි වාරයේදී කථා කරන දේවල්වලට රජයේ නිලධාරීන්ට උත්තර දෙන්න ඕනෑද කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමා පක්ෂග්‍රාහී වෙනවා නේ.?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කෝ ඉස්සෙල්ලා.

[සභාවේ ඝෝෂා]

එහෙම එවලා අන්තිමට ඒ මන්ත්‍රීතුමා කියයි මම දන්නේ නැහැයි කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍ය නවත්වන්න මේ සභාව ගෙනියන්න ඕනෑ නම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

සභාව මේ විධියට කවදාවක්වත් ගෙනි යන්න බැහැ. මේ මාධ්‍ය ආවොත් -

**[**සභාවේ සෝෂා**]**

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

අයි.ටී.එන්. එක කඩේ යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මාධ්‍ය නතර කරන්නේ කොහොමද?

**[**සභාවේ සෝෂා**]**

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රජාතන්ත්‍රවාදය වළපල්ලට යවනවා.

**[**සභාවේ සෝෂා**]**

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

තත්ත්පර දෙක ඉවරයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීවරුනි මේක අහන්න. වරප්‍රසාද ප්‍රශ්නයක් කාට හරි තිබෙනවා නම් අපට මෙතැනදී තීන්දු කරන්න බැරි නම්, මූලාසනයටත් ඒක තීන්දු කරන්න බැරි නම් අපේ රීතිවල තිබෙනවා වරප්‍රසාද කමිටුවක්. අපි ඒ කමිටුවට යොමු කරනවා. මම ගරු සභාපතිතුමාටත් ඒ ගැන කියන්නම්. අපි වරප්‍රසාද කමිටුවට යොමු කරලා, වරප්‍රසාද අහිමි වෙලා තිබෙනවා නම් ඒවා දෙන්නම්. ඒ සම්බන්ධව ඒ කමිටුව තීන්දු කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි වැරැද්දක් තිබෙනවා. එහි පිළිගැනීම කරන්න. ගරු මහ ඇමැතිතුමා මාර්ගයෙන් මෙය අදාළ කමිටුවට යොමු කරන්න. මෙහි සඳහන් වෙන්නේ පළාත් සභා මන්ත්‍රී උපාලි ගුණරත්න මැතිතුමාගේ උපදෙස් පරිදි කියලා. එහෙම එතුමාත් මේ පළාත් සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයෙක්. මේ සිද්ධිය කථා කරන අවස්ථාවේ එතුමාත් මේ සභාවේ හිටපු කෙනෙක්. ඒක නිසා මේක ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් මෙතුමා කැඳවීමේ අවශ්‍යතාවයක් නැහැ. දැන් මේකේ තිබෙන වැරැද්ද මේ ප්‍රාදේශීය ලේකම්වරයා කටයුතු කරන්නේ දේශපාලන අධිකාරියේ නියෝගයක් මත. ඒ නියෝගය බලපවත්වන්නේ තවත් පළාත් සභා මන්ත්‍රී කෙනෙකුට. ඒකයි මේ වැරැද්ද. මේ ලිපිය අදාළ කටයුතු සඳහා ලබා දෙන්න කියන - නමුත් එයයි වැරැද්ද තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කරුණු පැහැදිලි කිරීම තවදුරටත් ගෙනි යන්න බැහැ. නමුත් මම ඒ ගැන සාවදානව ඇහුම්කන් දෙනවා. ඒකත් ආරාධනාවක්ද කියන එක අපි දන්නේ නැහැ. ඒ නිසා අපි වරප්‍රසාද කමිටුවට යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ප්‍රාදේශීය ලේකම්වරයා මධ්‍යම ආණ්ඩුවේ සේවය කරන කෙනෙක්. එතකොට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔය ලිපිය සභාගත කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පළාත් සභාවට අදාළ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ලේකම්තුමා, මෙය වරප්‍රසාද කමිටුවට යොමු කරන්න. ගරු මන්ත්‍රීතුමිය මූලාසනයෙන් යම්කිසි උපදෙසක් දුන්නොත්, ඉල්ලීමක් කෙරුවොත් ඒ අනුව ක්‍රියාත්මක කරන්න. ඔබතුමිය කථා කරන්න. ඒකයි මේ සභාව වෙනත් දේවල්වලට යන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථා කරන්න හයයි.

[අ.භා. 12.21]

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

හය නම් නැහැ. අපේ විලි ලැජ්ජාව කියන එක තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. කටවහගෙන ඉන්න. මංගල කථාව. පොඩ්ඩක් සදාචාරාත්මක හැසිරෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මනමාලයා කවුද?

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සමන්මලී සකලසූරිය ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය ඔබතුමියගේ මංගල කථාව ඉතාමත්ම හොඳට කරන්න. මනමාලයා පස්සේ කාලයක පෙන්නන්න පුළුවන්. එතකන් හොඳට කථා කරන්න. මෙතුමන්ලා අහයි.

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

මගේ මංගල කථාවට අවස්ථාව ලබා දීම පිළිබඳව මෙම උත්තරීතර සභාවේ සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. 2014 බස්නාහිර පළාතේ පළාත් සභා මැතිවරණය උදෙසා එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් ඉදිරිපත් වූ අපේක්ෂක ලැයිස්තුවේ හිටපු ලාබාලතම අපේක්ෂිකාව ලෙස මේ ගෞරවනීය සභාව නියෝජනය කිරීමට ඡන්දයෙන් මාව තෝරා පත් කර ගත් දිවුලපිටිය ආසනය ප්‍රමුඛ ගම්පහ දිස්ත්‍රික් ජනතාවට මාගේ ගෞරවනීය ප්‍රණාමය පුද කර සිටිනවා. එමෙන්ම මෙම ගෞරවනීය සභාවේ වරක් සභාපතිවරයෙක්, සභානායකවරයෙක් හා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කළ දිවුලපිටිය ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ මාගේ දිවංගත පියාණන් වන සර්ධාතිස්ස සකලසූරිය මැතිතුමාගේ අවංක ජන මෙහෙවර ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වාගේම ඔහුගෙන් පසු එය අඛණ්ඩව එම සේවය කරගෙන යන්න ජනතාවගේ ඡන්දයෙන් තේරී පත් වුණු පසුගිය පළාත් සභාව නියෝජනය කරපු මගේ මව චන්ද්‍රිකා සකලසූරිය මැතිනියගේ අවංක සේවය, බාධක මැද්දේ කරගෙන ගියපු ඒ අවංක සේවයත් මේ අවස්ථාවේදී ඉතාමත්ම ගෞරවයෙන් තවත් කාන්තාවක් විධියට සිහිපත් කරනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී අප පක්ෂයේ නායකතුමන් වත්මන් ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමන්, ඒත් සමඟම අප දිස්ත්‍රික්කයේ නායක ගරු ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමන්වත් ඉතාමත්ම ගෞරවයෙන් සිහිපත් කරනවා. අප පක්ෂයේ නායකත්වය විධියට. ඒත් සමඟම බස්නාහිර පළාත් සභාවේ සුපසන් නිම්තෙරක් කරන්නට පුළුවන්, සුපසන් මෙහෙවරක් කරන්නට මෙපමණ කාලයක් බස්නාහිර පළාත් සභාව තුළ අපේ ගරු මහ ඇමැතිතුමන් ලෙස කටයුතු කරපු සහ කරන ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාටත්, ඒත් එක්කම එම අමාත්‍ය මණ්ඩලයටත් නවක මන්ත්‍රීවරයෙක් විධියට මගේ සුභාශිංසනය මේ අවස්ථාවේදී එකතු කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් යෝජිත යෝජනාව ඉතාමත්ම කාලෝචිත එකක් බව මමත් පිළිගන්නවා. සමස්ත ලෝකයම ස්වභාවික උවදුරුවලට ලක් වෙලා තිබෙනවා. එය ඈත අතීතයේ සිටම සිදු වුණු දෙයක්. මේක අපේ

[ගරු සමන්මලී සකලසූරිය]

ආණ්ඩුව කාලයේවත්, එහෙම නැත්නම් වෙනත් ආණ්ඩුවක් කාලයේවත් පටන් ගත්ත දෙයක්, ඇති වුණු දෙයක් නොවෙයි. මේක අනාදිමත් කාලයක සිටම මේ ලෝකයේ සිදුවන ස්වභාවික සිද්ධි දාමයක්. ඒත් සමඟම වර්තමානය වන විට සිවිල් යුද්ධ වේවා. එහෙම නැත්නම් වෙනත් සටන් වේවා. ඒ සටන්වලට වැඩිය, ඒ සටන්වලින් පීඩාවට පත් වන ජනතාවට වැඩිය වැඩි ජනතාවක් ස්වභාවික විපත් හේතුවෙන් උන්හිටි තැන් අහිමි වෙලා පීඩාවට පත් වන බව දැන් දැන් පර්යේෂණවලින් හෙළි වෙලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුදෙක් ආර්ථික වාසි අරඹයා කෙටි කාලීන මෙන්ම දිගු කාලීන සැලසුම් තුළින් ස්වභාව ධර්මයාට හානිවන අයුරින් මානව හැසිරීම තුළ ඔහු කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභයන් සඳහා ඔහු කෙටි කාලීන ආර්ථික වාසි ලබත්ද, දිගු කාලීනව ඔහුගේ මී මුණුපුරන් ඔහුට ශාප කරනු ඇත. මන්ද, ඔවුනට ජීවත්වීමට ලොවක් නැතිවන කල්හි මුදල් ආහාරයට ගැනීමට නොහැකි බව ඔවුන්හට පසක්වන හෙයිනි. අද දින ඩොලර් බිලියන ගණනින් ආදායම උපයමින් ලොව රජ කරන රාජ්‍යයන්වලට තම ජනයාගේ සෞඛ්‍ය හා ජීවිතය රැක ගැනීමටත්, මානව සම්පත රැකගැනීමටත් ඉපයූ මුදලට වඩා බොහෝ දෑ වියදම් කිරීමට අනාගතයේදී සිදු වනු ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වභාවික විපතකදී සිදුවන මිනිස් ජීවිත අහිමි වීම්, දේපළ හානි වැනි බොහෝ දේ සැමටම පොදුවේ බලපාන ප්‍රශ්න බවට පත් වෙමින් පවතිනවා. ජල ගැලීම් වේවා. සුළි සුළං වේවා. නායයෑම් වේවා. මේ සියල්ලක්ම අතිමහත් පාරිසරික මෙන්ම සාමාජයීය බලපෑමක් ඇති කරනවා. පසුගියදා කොස්ලන්දවත්ත, හල්දුම්මුල්ල, මීරියබැද්ද ප්‍රදේශයේ ඇති වූ නායයෑම් තත්ත්වය නිසා 150 කට අධික නිවාස ප්‍රමාණයක් යට වී ඇතත් එම ජීවිත සදහටම පසට යට වුණා. සමහරෙක්ට තම සිය පවුලම අහිමි වුණා. සමහර දරුවන්ට තමන්ගේ දෙමව්පියන් අහිමි වුණා. මෙවැනි විධියට මානව සම්බන්ධතා ගත්තාම බොහෝ අයට බොහෝ දේ අහිමි වුණා. ඒ සියලුම විපතට පත් අපේම සහෝදර ජනතාවට මාගේත්, දිවුලපිටිය ජනතාවගේත්, ගම්පහ දිස්ත්‍රික්කය ප්‍රමුඛ අපේ පළාත් සභාවේත් ශෝකය, සංවේගය මේ අවස්ථාවේදී නවක මන්ත්‍රීවරියක් ලෙස පුද කර සිටින්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නායයෑමක් සඳහා - උදාහරණයක් විධියට ස්වභාවික විපතක් ගත්තොත් ඒ සඳහා භූ විද්‍යාත්මකව, රූප විද්‍යාත්මක භෞතික වශයෙන් හා මිනිස් ක්‍රියාකාරකම් වශයෙන් බලපාන හේතු රාශි ගණනාවක් තිබෙනවා. ඒක නිසා මේකට අපට එක්කෙනෙකුට ඇඟිල්ල දික් කරන්න බැහැ. සමහරවිට වක්‍රාකාරව අපත් මේකට හවුල් ඇති. එම නිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන මේ වන විට ලංකාවේ ස්ථාපනය කරලා තිබෙනවා. මේ වන විටත් ඔවුන් විශාල වශයෙන් වැඩ සටහන් දියත් කරලා තිබෙනවා. ඔවුන්ට හැකි අයුරින් වාගේම, විවිධ සංවිධානවල සහ රජයේ මැදිහත්වීම මත ඒ වෙනුවෙන් නියැලී සිටිනවා. ඒ නිසා දීප ව්‍යාප්තව ඔවුන් ඒ වැඩ සටහන් කරනකොට බස්නාහිර පළාත තුළ මෙවැනි ඒකකයක් පිහිටුවලා, මෙවැනි දෙයක් කිරීම තුළින් වෙන්නට පුළුවන් හානි විශාල වශයෙන් අවම කරගත හැකි බව මම මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය, තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

අපි දන්නවා, අපි අහලා තිබෙනවා, ශ්‍රී ලංකාවට බලපෑ සුනාමි අවස්ථාවේදී සංචාරක යුවලක් නිසා ඒ වෙරළ ආශ්‍රිත ප්‍රදේශයක බොහෝ ජීවිත ප්‍රමාණයක් බේරුණා කියලා. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාව ලෙස මෙවැනි උවදුරක් පැමිණි විට ඒ සඳහා මුහුණ දීමට සහ එය වළක්වා ගැනීමට වෙනම ඒකකයක් අප පළාත තුළ පිහිටුවීම ඉතා කඩිනමින් කළ යුතු කාර්යයක් බව මම ප්‍රකාශ කර සිටිනවා. තවද, පාසල් අධ්‍යාපනය තුළට ස්වභාවික විපත් සඳහා විෂය කරුණු වඩ වඩාත් ඇතුළත් කළ යුතු අතර ඔවුන්ට එම විෂයය කරුණු ප්‍රායෝගිකව යොදා ගන්නේ කෙසේද කියලා ඒ අධ්‍යාපනයට ඇතුළත් කළ යුතුයි. ග්‍රාමීය මට්ටමේ ඇති සමිති හා සංවිධාන මඟින්ද එම දැනුවත් කිරීම කළ හැකි බව මම යෝජනා කරනවා. රාජ්‍ය ආයතන සහ නිලධාරීන් මෙන්ම අනිකුත් සියලුම ආයතන තව තවත් දැනුවත් විය යුතු අතර විශේෂයෙන්ම මාධ්‍ය අද රටේ විශාල කාර්යභාරයක් කරන මොහොතක සියලුම මාධ්‍ය ඒකරාශී කරගෙන බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමන් සහ විෂයය භාර ගරු ඇමැතිතුමාට

පුළුවන් නම් අපි සියලුදෙනාම එකතු කරලා විශාල මාධ්‍ය වැඩ සටහනක් ක්‍රියාත්මක කරලා මේ පිළිබඳව ක්‍රියාත්මක වන්නට මම හිතන්නේ, මේ යෝජනාව තවත් ඵලදායි යෝජනාවක් බවට පත් වේවි කියලා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. නවක මන්ත්‍රීවරියක් විධියට ඒ වාගේම තමන්ගේ මංගල, කුළුඳුල් කථාව ඉතාමත්ම සාරවත් කථාවක් ලෙස කළා. මම හිතනවා ඒක සභාවට ආදර්ශයක් කියලා. මීළඟට විපක්ෂය නියෝජනය කරමින් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.29]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මේ ගෙනෙන ලද යෝජනාව පිළිබඳව ඇත්ත වශයෙන්ම ස්තූතිය පළ කරන්න ඕනෑ. ඉතාමත් කාලෝචිත මාතෘකාවක්. අද අපි සාකච්ඡාවට ලක් කරමින් සිටින මාතෘකාවක්. අපේ අවධානය යොමු විය යුතු මාතෘකාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අද අපි බරපතළ ව්‍යසනකට මුහුණ දීලා සිටිනවා. 2004 සුනාමියට මුහුණ දුන්නාට පස්සේ අපි එදා වුණු හානිය ගැන කථා කළා. ඊළඟට ගත යුතු පියවර ගැන කථා කළා. නමුත් ඊළඟට ඇති වන ව්‍යසනයට මුහුණ දෙන්න අපි සූදානම් වුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. අපි දන්නවා, 2005 දී ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මේ නායයෑම පිළිබඳව දැනුම් දෙනවා. 2011 දී යළිත් ඒ පිළිබඳව දැනුම් දෙනවා. නමුත් කිසිඳු පියවරක් ගැනීමට මෙතෙක් අසමත් වෙලා තිබෙනවා.

ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වභාවික ව්‍යසනයක් සිදු වෙන්න කලින් අපට ඕනෑ තරම් තොරතුරු දැනගන්න පුළුවන්. නමුත් ඒ තොරතුරු අනුව බලධාරීන් විධියට, නිලධාරීන් විධියට අපේ රටේ ඒ අදාළ අංශවල ඉන්න අය නිවැරැදි ලෙස කටයුතු කරනවාද කියන ප්‍රශ්නය තමයි අප ඉදිරියේ තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම පසුගිය කාලයේ සිදු වුණු ව්‍යසනයන් පිළිබඳව කලින් දැනුම් දුන්නත් පියවර ගත්තේ නැහැයි කියන එකට චෝදනා කරන්නේ අපිව නොවෙයි. මේ පිළිබඳව විශේෂඥයෙක් - මේ ක්ෂේත්‍රයේ ඉන්න ප්‍රවීණයින් චෝදනා කරනවා, අපි නිසි පියවර අරගෙන නැහැයි කියලා. මම කියන්නේ නැහැ අපි කාටවත්, ආණ්ඩුවට හෝ වෙනත් පාර්ශවයකට ඇඟිල්ල දිගු කළ යුතුයි කියලා. නමුත් ලෝකය පිළිගන්න කාරණයක් තමයි ස්වභාවික ව්‍යසනයන්ට මුහුණ දීම සඳහා පොදු වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියන එක. හැමෝම ඒකට එකතු වෙන්න ඕනෑ. මොකද, ස්වභාවික විපත් සිදු වෙන්නේ අපි බලාපොරොත්තු නොවන අන්දමටයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, මේ පසුගියදා කොස්ලන්දේ සිදු වුනු නායයෑම පිළිබඳව. මාස කිහිපයකට කලින් හල්දුම්මුල්ලේ ප්‍රාදේශීය ලේකම්වරයාත්, ඒ වාගේම මීරියබැද්ද වතු අධිකාරිවරයත් දැනුවත් කරලා තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් අරගෙන තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කාගේද වගකීම කියන එක මතු වෙනවා. අපි දන්නවා, මේ ප්‍රදේශවල ජීවත් වෙන්නේ ඉතාම අඩු ආදායම් ලබන, දුෂ්කර ජීවිත ගෙවන ජනතාවක්. ඔවුන්ට අඩුම ගණනේ එදාවේලවත් කන්න පුළුවන්කමක් නැහැ. ඔවුන් ජීවත්වන භූමිය දාලා යන්න ඔවුන් සූදානම් නැහැ. ඒක ස්වභාවිකයි. අවුරුදු සිය ගණනක් මේ භූමියේ ඉතාම දුක්ඛිත ජීවිත ගත කරපු වතු කම්කරුවෝ. ඔවුන් වෙන යන්න තැනක් ගැන බලාපොරොත්තු තියාගෙන ජීවත් වන අය නොවෙයි. ඒ නිසා තැනක් පෙන්නලා යන්න කිව්ව පළියට මේ මිනිස්සු යන්නේ නැහැ. ඒක නිසා මේකට නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි කියන එක විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, ජාත්‍යන්තර කාලගුණ විපත් දර්ශකයට අනුව 1990 ත් 2008 ත් අතර කාලය තුළ දකුණු ආසියාවේ මිලියන 750 ක් ජනතාවකට මේ ස්වභාවික ව්‍යසන නිසා බලපෑම් ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාලය තුළ දකුණු ආසියානු කලාපයේ විතරක් දෙලක්ෂ තිස් දහසක් මිය ගිහිල්ලා තිබෙනවා. මම කැමැතියි යම් කාරණයක් මතු කරලා පෙන්වන්න. විශේෂඥයින්ගේ සොයා ගැනීම්වලට අනුව දකුණු ආසියානු කලාපයේ වැඩියෙන්ම ස්වභාවික විපත් සිදු වන්නේ බංගලාදේශයේ. දෙවැනියට ඉන්නේ ඉන්දියාව. අපි මතක තියාගන්න ඕනෑ, මේ ලැයිස්තුවේ තුන්වැනියාට ඉන්නේ ශ්‍රී ලංකාව කියලා. ඒ නිසා වඩාත් බරපතළයි. අපි ජීවත් වෙන්නේ දූපතක් ඇතුළේ. අපට ලෙහෙසියෙන්ම කාලගුණ බලපෑම් එන්න පුළුවන්. ඒ නිසා

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

මේ පිළිබඳව අපි දැඩි අවධානය යොමු කරන්න ඕනෑ. අපි දන්නවා, 1990 ත් 2008 ත් අතර කාලය තුළදී ලංකාවේ ජනගහනයෙන් 32% කට කවර හෝ ආකාරයේ ස්වභාවික විපතකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී අපේ රටේ ස්වභාවික විපත්වලට මුහුණ දෙන්න නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකළොත් 2016 වන විට අපේ රටේ ආයෝජන ඩොලර් බිලියන 4.3 ක් අපට අහිමි වෙයි කියලා ආසියානු සංවර්ධන බැංකුව ප්‍රකාශයක් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒ වාගේම අවධානම් කලාප අතර තිබෙන ලෝකයේ රටවල් 31 අපිත් ඉන්නවා. ශ්‍රී ලංකාවත් ඉන්නවා. ඒ නිසා සංවර්ධනය හොඳින් කෙරෙන්න ඕනෑ. සංවර්ධනය අවශ්‍යයි. පාරවල් හැදෙන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය දියුණු වෙන්න ඕනෑ. අලුත් පාරවල් ගොඩනැංවෙන්න ඕනෑ. හැබැයි, ඒවායින් ජනතාවට ප්‍රතිලාභ ලැබෙන්න ඕනෑ. සමහර විශේෂඥයින් කියන කාරණයක් තමයි ටොන් ගණනින් පටවපු කන්ටේනර් කඳුකර පළාත්වල යන කොට, නිසි වැඩ පිළිවෙළක් නැතිව ගොඩනැගිලි, හෝටල් හිතුමනාපෙට ඉදි කෙරෙන කොට ඒවායෙන් හානි වෙන්නෙත් මේ අසරණ දුප්පත් ජනතාවට. ඒවා අනික් අතට අප විසින් සකස් කරගන්නා ලද, අප විසින් අපේ ක්‍රියාකාරකම් නිසා ඇති වන ස්වභාවික විපත් බවට අවසානයේදී පත් වෙනවා.

ඒ නිසා මේ අවස්ථාවේදී මම මේ සභාව ඉදිරියේ කියන්නේ විශේෂයෙන් බස්නාහිර පළාත හැටියට - මීට කලිනුත් මම මතු කළා. අපි බරපතළ විධියට කළුතර දිස්ත්‍රික්කයේ නායයෑම් තර්ජනයට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, ගම්පහ. අපේ ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කිව්වා. රැයක් එළිවනතුරු වැහැලා ඉවරවෙන කොට පාරවල් යට වෙනවා. ඒ නිසා මේ සංවර්ධනය සිදු විය යුතුයි. නමුත් එය ස්වභාවික අපදාවලට ගැළපෙන විධියට, ව්‍යසනයට ගැළපෙන විධියට අපි ඒ කටයුතු කරගන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ සංවර්ධනයේ ප්‍රතිලාභ අවසානයේදී ජනතාවට ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ සභාව හමුවේ මම කියා සිටිනවා, අපි මේ අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාව හැටියට මේ ව්‍යසනයට මුහුණ දීලා සිටින, මේ අනතුරට මුහුණ දීලා සිටින ජනතාව වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. පක්ෂ පාට, දේශපාලන භේදයකින් තොරව අපි සියලු දෙනා එකතු වෙලා මේ සඳහා ක්‍රියාකාරී වැඩ පිළිවෙළක් වහාම සකස් කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනතාවට ප්‍රදේශවලින් ඉවත් වෙන්න කිව්වාට විතරක් වැඩක් නැහැ. අපි ඔවුන්ට නිසි විකල්පයක් දෙන්න ඕනෑ. ඔවුන් ගැන සොයා බලන්න ඕනෑ. ඒ වැඩ සටහනට අපි සියලුදෙනා එකඟ වෙලා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒක නිසා ස්වභාවික ව්‍යසනය කොයි වේලාවේ එනවාද කියන්න බැහැ. වැස්ස, භූමිකම්පා, නායයෑම් කොයි වේලාවේ එනවාද කියලා බලාපොරොත්තු තියන්න බැහැ. හැබැයි, විශේෂඥයින්ට පුරෝකථනය කරන්න පුළුවන්. කලින් කියන්න පුළුවන්. මෙහෙම දෙයක් සිද්ධ වෙන්න පුළුවන් කියලා. ඒ නිසා බස්නාහිර පළාත හැටියට අපි එකට එකතු වෙලා කමිටුවක් පිහිටුවලා ඉදිරියේදී මේ නිර්මාණය කරන කමිටුව, බලපෑම් කණ්ඩායමක් විධියට, ජනතාවගේ අනාගතය, ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා මේ කමිටුව ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා මා සභාවට යෝජනා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ස්තුතියි. මම හිතන්නේ එතුමා හොඳ කථාවක් සභාවට ලබා දුන්නා. මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමිය. ඔබතුමියගේත් මංගල කථාවද?

[අ.භා. 12.36]

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

ඔව්. මංගල කථාව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙමනම් හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමියගේත් මංගල කථාව නිසා කවුරුත් ඒකට යහපත් ප්‍රතිචාරයක් දක්වන හැටියට ඉල්ලා සිටිනවා.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

මට විනාඩි කීයක් හම්බ වෙනවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමියට විනාඩි 06 ක් තිබෙනවා. මම ගණනේ තව විනාඩියක් වැඩිපුර දෙන්නම්.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මගේ මංගල කථාව ඉදිරිපත් කරන දවසේත් මගේ හිතේ පුංචි අභිංසක ආඩම්බරකමක් තිබෙනවා. ඒ තමයි මේ පළාත් සභාවේ, මංගල පළාත් සභාවේ ආසනාරූඪව හිටපු මන්ත්‍රීවරයෙකුගේ දියණියක් විධියට මට හැකියාව ලැබුණා හයවැනි පළාත් සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම මනාප අරගත්ත මන්ත්‍රීවරියක් විධියට අද මෙතැන ඉඳගන්න. ඉතින් මම සන්තෝෂ වෙනවා. පළාත් සභාව හදන්න, කැ ගහලා, සටන් කරලා, මහන්සි වෙලා අවසානයේ පළාත් සභාව හදපු කෙනෙකුගේ, ඒකට පුරෝගාමී වුණු කෙනෙකුගේ දියණියක් විධියට අද මට මෙතැන කථා කරන්න අවස්ථාවක් ලැබුණු එක ගැන. මම මගේ කථාවේ දෙවන භාගයේ මම මේ තත්ත්වයට පත් කරපු සියලු දෙනාට ස්තුතිවන්ත වෙන්න බලාපොරොත්තු වෙනවා. කෘතගුණ දැක්වීමක් විධියට. හැබැයි, ඒකට ටිකක් වෙලා යයි. මොකද, ස්තුති කිරීමට අමතරව මට තව පණිවිඩ කිහිපයක් දෙන්න තිබෙනවා. ඊට කලින් මම අද මේ ගෙනෙන ලද යෝජනාව පිළිබඳ පොඩ්ඩක් කථා කරන්නම්. මගේ අදහස ඉදිරිපත් කරන්නම්.

අද ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව මේ සිදුවන ස්වභාවික අනතුරු වළක්වා ගැනීමට, මැඩ පවත්වා ගැනීමට, කලින් හඳුනා ගැනීමට පළාත් සභාවෙන් අපි වෙනම ඒකකයක් යෝජනා කළ යුතුයි. ඒ යෝජනාවට සහයෝගය දැක්වීමක් විධියට මම කැමැතියි මගේ අදහස් මේ පිළිබඳව ප්‍රකාශ කරන්න. මම විශ්වාස කරනවා, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියලුදෙනාම මේ මාතෘකාවට සහයෝගය දෙනවා කියලා. මොකද, පසුගිය කාලයේ ඇති වුණු, දින කිහිපයකට කලින් ඇති වුණු කොස්ලන්ද නායයෑමත් එක්ක අපට නැවතත් මීට අවුරුදු ගණනකට කලින් ඇති වුණු සුනාමි ව්‍යසනය, ඒ අපරාධය, නැවතත් අපට මතක් වුණා. අපි දන්නවා, මේ ලෝකයේ රටවල්වලින් ආසියාතික රටවල්වල තමයි වැඩි හරියක් මේ වාගේ ස්වභාවික අනතුරු සිද්ධ වෙන්නේ. ලංකාව ඒ අතින් ටිකක් විතර පිටිපස්සේ ඉන්නේ. ඒ අතින් අපි වාසනාවන්තයි. ස්වභාවික අනතුරු සිදුවන පැත්තෙන්. ඒ වුණත් ලංකාවේ ගංවතුර සහ නායයෑම් සිද්ධවීම් නිතර සිද්ධ වෙනවා. ඒකට මූලික හේතුවක් හැටියට, නායයෑම් ඇතිවීමට හේතුවක් හැටියට ගල්කඳු කැඩීම සහ ෆයිනස් වගාව විනාශ කිරීම සහ ගංවතුර ඇති වීමට හේතුවක් හැටියට ගොඩක් වෙලාවට බලපානවා කියලා කියන්න පුළුවන්. විශේෂයෙන් හරියට ගංවතුර වැළැක්වීමට හරි ක්‍රමවේදයක් අපේ ලංකාවේ නැති නිසා. ඉතින් මේ හැම දෙයකටම පළාත් සභාවක් විධියට, අපේ පාලන තන්ත්‍රයේ ඉහළම තැන මධ්‍යම ආණ්ඩුවට. අපි දෙවැනි තැන. මධ්‍යම ආණ්ඩුවෙන් අද වන විට ලොකු කර්තව්‍යයක්, කඩිනම් වැඩ පිළිවෙළක් කරගෙන යනවා, මේ වාගේ ස්වභාවික අනතුරු වැළැක්වීමට සහ මැඩ පැවැත්වීමට. ඒ වාගේම ස්වභාවික අනතුරුවලින් පසුව ඒ දේවල්වලට මුහුණ දීපු පුද්ගලයන්ට සහන සලසන්න. ඉතින් අපි පළාත් සභාවක් විධියට විශේෂයෙන්ම මම විශ්වාස කරනවා, අපේ මේ බස්නාහිර පළාත් සභාව තමයි ප්‍රසිද්ධම සහ වැඩි හරියක් හොඳ කට්ටිය ඉන්න, කථා කරන්න පුළුවන්. දක්ෂ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව හොඳ කට්ටිය ඉන්න පළාත් සභාව. ඉතින් ඒ නිසා මම විශ්වාස කරනවා, මේ වාගේ කාලෝචිත යෝජනාවකට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි හැමදෙනාම මේ සඳහා සහයෝගය දෙයි කියලා. මොකද නායයෑමක් සිදු වන්නේ, ගංවතුරක් සිදු වන්නේ අරයා අහවල් පක්ෂයේ, අරයා අහවල් ජාතියේ, අරයා අහවල් ආගමේ කියලා හොය හොය වෙන් කරගෙන නොවෙයි. ඒ වාගේ අනතුරක් සිදුවන විට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව, ආගම් භේදයකින් තොරව, ජාති භේදයකින් තොරව සියලුදෙනාම ඒකට මුහුණපානවා. අවසානයේ දුක් විඳින්නේ අහිංසක ජනතාව. ඒ නිසා අපි දේශපාලඥයින් විධියට, ජනතා නියෝජිතයන් විධියට, අපි ජනතාවට ආදරය කරන පුද්ගලයන් විධියට මම විශ්වාස කරනවා, මේ වාගේ යෝජනාවක් අපි සම්මත කළ යුතුයි සහ සහයෝගය ලබා දිය යුතුයි කියලා.

එතැනින් මම මගේ ස්වභාවික අනතුරු පිළිබඳ කථාව නවත්වනවා. අද මාව මෙතැන ගෙනාපු සියලුම ජනතාව පිළිබඳව පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. ඔවුන්ට ස්තුති කිරීමක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මම පළමුවෙන්ම මගේ පරම්පරාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳව මේ වේලාවේ කථා කරන්න කැමැතියි. මම දේශපාලන පවුලකින් එන, දේශපාලන ඉතිහාසයක් තිබෙන, හොඳ අතීතයක් තිබෙන කෙනෙක් විධියට මගේ සීයා ඇන්.එම්. පෙරේරා මැතිතුමාත් එක්ක එකට සමසමාජ පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් විධියට කොළොන්නාව තෙල් සංස්ථාවේ වෘත්තීය සමිති නායකයෙක් විධියට කටයුතු කරපු කෙනෙක්. අවසානයේ කොළොන්නාව

නගර සභාවට සමසමාජ පක්ෂයෙන් ඡන්දය ඉල්ලපු කෙනෙක්. ඊට පස්සේ මගේ ආච්චි, ඒ කියන්නේ මගේ තාත්තාගේ අම්මා කොමියුනිට්ස් පක්ෂයේ බලමණ්ඩලයේ හිටපු ප්‍රධාන ක්‍රියාකාරිනියක්. ඒ වාගේම තමයි මගේ තාත්තාගේ මාමා, ඒ කියන්නේ තාත්තාගේ අම්මාගේ මල්ලී කොළොන්නාව නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රී කෙනෙක්. ඒ වාගේම නැන්දා කොළොන්නාව නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රීවරියක්. මම අද සන්තෝෂ වෙනවා. ඒ තිබුණු ඉතිහාසයත් එක්ක අද මම මේ ඉන්න තැන ගැන.

විශේෂයෙන්ම 1977 දී ටී.බී. ඉලංගරත්න මහත්මයාත් එක්ක දේශපාලනය ආරම්භ කරපු මගේ තාත්තා 1979 කොළොන්නාව නගර සභාවට ඉල්ලලා එතැනින් අවස්ථාවක් ලැබුණේ නැති වුණත්, පසුව ටී.බී. ඉලංගරත්න මැතිතුමාත් එක්ක දේශපාලනය කරලා කොළොන්නාව නගර සභාවේ නාගරික මන්ත්‍රී කෙනෙක් විධියට ඉඳලා, ඊට පස්සේ විපක්ෂ නායක ධුරයට පත් වුණා. අවසානයේදී සමඟි පෙරමුණ පරාජය වනකොට නිල් කොඩියක් කොහෙවත් තැනක උස්සන්න බැරි වන කොට, නිල් තොප්පියක් දාලා එළියට බැහැලා, ජන ඝෝෂාවක් කරන්න බැරි තැන, කොළොන්නාවේ නිල් තොප්පියක් දාගන්න, නිල් කොඩියක් අතට ගන්න හිටපු එකම දේශපාලන නායකයා මගේ තාත්තා විතරයි. මම අද ආඩම්බර වෙනවා. ඒ දේශපාලන නායකයාගේ දුව විධියට අද මෙතැන කථා කරන්න ලැබුණු එක ගැන. ඒ වාගේම තමයි එක්සත් ජාතික පක්ෂයෙන් ඒ දවස්වල වුණු කරදරත් එක්ක, ජනතා විමුක්ති පෙරමුණේ ඒ දවස්වල වුණු කරදරත් එක්ක මොනවා හරි කරගෙන ජීවිතේ ගැටගහගෙන දේශපාලනයෙන් ඉස්සරහාට කොහොමහරි පන්නරය ලබාගෙන මගේ තාත්තා ඉස්සරහාට ඇවිල්ලා අවසානයේ 1988 විජය කුමාරතුංග මැතිතුමාත් එක්ක එකතු වෙලා, මහජන පක්ෂයත් එක්ක එකතු වෙලා - ඒ කාලයේ බලය බෙදා හරින්න බැහැ. ඉඩම් බලතල බෙදා හරින්න බැහැ. එතකොට පොලිස් බලතල බෙදා හරින්න බැහැ. පළාත් සභාව එපා කියපු උදවිය අද මෙතැන ඉඳගෙන ඉන්නවා. ඒ දවස්වල පළාත් සභාව ඕනෑය කියලා අපේ තාත්තා සටන් කරද්දී, ලේ, දහඩිය, කඳුළු හෙලද්දී ඒවා එපා කියලා, මර සටන් කරපු උදවිය අද මෙතැන ලස්සනට ඉඳගෙන ඉන්නවා. ඒ කෙසේ වුවත් අපේ තාත්තලා ඔප මට්ටම් කරලා, තණකොළ ටික කපලා (බාධා කිරීමක්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය, තව විනාඩියක් තිබෙනවා.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

අපේ තාත්තලා ඔපමට්ටම් කරලා, ලස්සනට තණකොළ ටික කපලා හොඳට හදපු පිට්ටනියේ තමයි අද මේ හැම කෙනාම බල්ටි ගහන්නේ. පිනුම් ගහන්නේ. මම සන්තෝෂ වෙනවා, ඒ විධියේ නායකයෙකුගේ දුවෙක් විධියට අද මට මෙතැනට එන්න ලැබුණු එක ගැන. කෙසේ වෙතත් අවසානයේ මට කියන්න තිබෙන්නේ මාව මේ තැනට ඔසවලා තබපු, කොළඹ දිස්ත්‍රික්කයේ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍රට ආදරය කරපු, මට ආදරය කරපු, ඒ වාගේම මගේ තාත්තාගේ ඝාතනයෙන් පස්සේ - මගේ තාත්තා මැරුණා නොවෙයි. මැරුවා. ඒක මම කවදාවත් අමතක කරන්නේ නැහැ. මගේ සටන අවසන් වෙන්නේ දේශපාලනයෙන් කවදා හරි දවසක -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුද දන්නේ නැහැ මැරුවේ.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

පස්සේ කියන්නම්. ඔහොම ඉන්න. කවුරුත් දන්නවා නේ? මගේ තාත්තා මැරුණා නොවෙයි. මැරුවා. ඒ කවදා හරි දවසක මගේ තාත්තාට වුණු සාධාරණයක් ඉෂ්ට වෙන්නේ මගේ තාත්තාට ඒ අසාධාරණයට සාධාරණයක් මම ඉෂ්ට කරගත්තොත් විතරයි. මම අද මෙතැන හිටගෙන ඉන්නේ, තාත්තාට ආදරය කරන ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්න. මගේ දේශපාලනය එකක්. මගේ තාත්තාගේ මිනී මැරුම එකක්. ඒක අනිවාර්යයෙන් මම එකට පටලවා ගන්නේ නැහැ. කවදා හරි දවසක මේ දේශපාලන බලතල වලින් මට වැඩක් නැහැ. මේ කිසිම දෙයකින් මට වැඩක් නැහැ. අවසානයේ මගේ අවස්ථාව වෙන්නේ මගේ තාත්තාට සාධාරණයක් ඉෂ්ට කරගන්න එක. කවදාවත් අමතක වෙන්නේ නැහැ. ඒ වාගේම තව දෙයක් මතක් කරන්න ඕනෑ. මට උදව් කරපු පක්ෂ විපක්ෂවලින් මට උපදෙස් දීපු වචනයෙන් හරි සහයෝගය දීපු හැම කෙනාටම මම මේ වේලාවේ ස්තුතිවන්ත වෙනවා. අද මට මෙතැනට එන්න ගොඩාක් උදව් කළේ. මට මඩ

ගහපු, මට අපහස කරපු, මට එක එක දේවල් කියපු හැම කෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. පුංචි කෙල්ලෙක්ගෙන් අද මම ශක්තිමත් කාන්තාවක් බවට පත් වුණේ ඒ මඩවලින් විතරයි. ඒ නිසා තමයි මම අද මෙතැන ඉන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය. බොහොම ස්තුතියි.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

ඒ වාගේම තව දෙයක් මතක් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා සහ ඒ සියලුම දේශපාලන -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මංගල කථාව.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර**
Hon. Hirunika Premachandra

සමාවෙන්න. අතිගරු ජනාධිපතිතුමා සහ සියලුම ඒ දේශපාලන පක්ෂවල, අපේ පක්ෂයේ නායකයන් සහ මහ ඇමතිතුමා, සියලුම ඇමතිවරුන්, පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් සහ අවසානයේ මට සෙවනැල්ලක් වාගේ ඉන්න මගේ මව, ඒ වාගේම මගේ සහෝදරයා සහ නැඳැයෝ. මම අදටත් හිතනවා, මගේ මේ එහා පැත්තෙන් මගේ තාත්තා අදටත් හිටගෙන මට ශක්තියක් දෙනවා, ආශිර්වාද කරනවා කියලා. සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ මංගල කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි, හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මෙනෙවියට. තමන්ගේ පියාගේ දේශපාලන ව්‍යාපාරය, කරපු කැප වීම් අපි සියලු දෙනාම දන්නවා. එතුමියට හැඟීම්බර වාගේම අපටත් ඒ කථාවේදී හැඟීම්බර වෙනවා. ඒ වාගේම එල්ලාවල ගරු මන්ත්‍රීතුමා සතුටු වෙන්න ඕනෑ. ඔබතුමා මේ රීති අත්හිටුවලා ගෙනාපු සාරගර්භ යෝජනාවේ දැන් හොඳ කථා කිහිපයක් ආවා. මීළඟට විපක්ෂය වෙනුවෙන් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 06 ක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 12.48]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මෙම යෝජනාවේ තිබෙන යම් හරයාත්මකව, එහි ඇති සාධනීය පැත්ත දකින ගමන්ම මෙම යෝජනාව හරහා කිසියම් පණිවිඩයක් මේ බලධාරීන්ගේ ඇස් යොමු කිරීම සඳහා යොදා ගන්න හැකියාවක් තිබෙනවා නම්, ඒ සඳහායි මේ අවස්ථාව මම යොදා ගන්නේ.

විශේෂයෙන්ම කාලය සීමිත නිසා ගරු සභාපතිතුමනි, එක්තරා සිද්ධියක් මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ යෝජනාවෙන් කථා කරන්නේ, වෙනම මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන්. හැබැයි, අපට තිබෙන ගැටළුව තමයි මධ්‍යම ආණ්ඩුවේ අයවැයෙන්, ඒ වාගේම පළාත් ආණ්ඩුවේ අයවැයෙන් ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවට, ඒ ආපදා කළමනාකරණ ඒකකයට මොන තරම් මුදල් ප්‍රමාණයක් පොම්ප කරනවාද? පළාත් ආණ්ඩුවේ සමාජ සුභ සාධනය හරහා මොන තරම් මුදල් ප්‍රමාණයක් පොම්ප කරනවාද? හැබැයි, ඒ තිබෙන මුදල් ප්‍රමාණයට සාපේක්ෂව මේ සමාජයට සාධාරණත්වයක් ඉෂ්ට වෙනවාද කියන ගැටළුව අප සතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක උදාහරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නම්. අපි ජීවත් වන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ, මේ අපි නියෝජනය කරන දිස්ත්‍රික්කයේ කිරුළපන ප්‍රදේශයට ඔබතුමා යන්න. එතැනින් මදක් හැරුණාට පස්සේ තිබෙනවා නුගගහ පුර කියලා ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ජීවත් වන පවුල් 38 ක ජනතාව කන්දක් පාමුලයි ජීවත් වෙන්නේ. කන්ද උඩත් ඉන්නවා, කිසියම් ප්‍රමාණයක්. කන්ද පාමුලත් ඉන්නවා කිසියම් ප්‍රමාණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ 500 ක් ඕනෑ වෙලා තිබුණා, ඒ කන්ද පල්ලෙහාට එන එක වළක්වන්න. කන්ද බඳින්න ලක්ෂ 500 ක් ඕනෑ වෙලා තිබුණා. එතකොට මේ ලක්ෂ 500 සහ මේ පවුල් 38 අතර ගැටළුවක් ඇති වෙලා තිබුණා. හැම දේශපාලඥයාම කඹ අදිමින් සිටියා. ඔබතුමාගේ මාර්ගයෙන් මම මහ ඇමතිතුමාගේ අවධානය මේ මොහොතෙත් ඒ සඳහා යොමු කරනවා. ගරු මහ ඇමතිතුමනි, මේ පවුල් 38 එකතු වෙලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා. අනේ කරුණාකරලා අපව ආරක්ෂා කරලා දෙන්න. මේ කොළඹ නගර

[ගරු සුනිල් වටගල ]

සභාවෙන්, එහෙම නැත්නම් පළාත් සභාවෙන් අපට සලකන්නේ නැහැ. මීට අදාළ ලක්ෂ 500 දෙන්නේ නැහැයි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් තිබුණා. පැහැදිලිවම මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනයක් තිබෙනවා. මේකට මැදිහත් වෙන්නය කියලා. හැබැයි මැදිහත් වුණේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයටත් පස්සේ. ආපහු නඩුවක් දැම්මා. ආපහු නඩුවක් දැම්මාට පස්සේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙපළක් කියපු ප්‍රකාශ තමුන්නාන්සේගේ අවධානයට යොමු කරනවා. ඒ නඩුවේ වග උත්තරකාරයෙක් වෙලා තිබුණේ නැහැ පළාත් සභාව. එක්තරා වෙලාවක ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වා, පළාත් සභාව මේකේ වග උත්තරකාරයෙක් කරන්න, අපට සල්ලි ටිකක් ගන්න පුළුවන්ද කියලා බලන්න කියලා. එතකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නඩු අංකය 517/2012 SCFR. එතකොට මේ නඩුවේදී මොකක්ද වුණේ. බස්නාහිර පළාත් සභාව වගඋත්තරකාරයෙක් බවට පත් කළා. ඇවිල්ලා කිව්වා සතයක් දෙන්න බැහැයි කියලා. මේ වගකීමෙන් කියන්නේ. එහෙම වෙලා නැත්නම්, මේ මන්ත්‍රී ධූරයෙන් මම හෙට ඉල්ලා අස් වෙනවා. වගකීමෙන් කියන්නේ. සතයක් දෙන්න බැහැයි කිව්වා, අර පවුල් 38 ආරක්ෂා කිරීම වෙනුවෙන්. මේ බස්නාහිර පළාත් සභාව. අපි මේ වෙනම ඒකකයක් පිහිටුවන්න කථා කරනවා. කොළඹ නගර සභාවත් කර ඇරියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවකට විනිශ්චයකාරවරයෙක් වෙලා හිටපු ශිරාණි බණ්ඩාරනායක මැතිනිය කිව්වා, කන්ද කඩා වැටුණාට පස්සේ මළ මිනී සොයන්න තමයි ඔයගොල්ලන්ට සල්ලි දෙන්න වෙන්නේ කියලා. ඊයේ පෙරෙයිදා මේ නඩුව Dismiss වෙන්න කලින්, අන්තිමට සල්ලි දෙන්නේ නැති හින්දා නඩුව පැත්තකින් තියලා තිබෙනවා. අදටත් තිබෙනවා නඩුව. ඕනෑ නම් ඒක live කර ගන්න පුළුවන්. කලින් මර්සූෆ් විනිශ්චයකාරතුමා කිව්වා, ඔයගොල්ලන්ට මතක් වෙන්නේ මේ කන්ද කඩා වැටුණු දවසටයි කියලා. කනගාටුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න කන්ද කඩා වැටී ගෙන එනවා. මේ වෙද්දී හැමෝටම ලියුම් දීලා තිබෙනවා ඒ ස්ථානයෙන් අයින් වෙන්නය කියලා. එතකොට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් තිබෙන රටක, පළාත් සභාවක සමාජ සේවා දෙපාර්තමේන්තුවක් තිබෙන අවස්ථාවක, ලක්ෂ 500 ක් දෙන්න - මේ රටේ විවිධ දේවල්වලට රුපියල් බිලියන ගණන් නිස්කාරණේ පොම්ප කරන වෙලාවක පවුල් 38 ක් ආරක්ෂා කර ගන්න මේ පළාත් සභාවට එක සතයක් වැය කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට මෙන්න මෙවන් වෙලාවක ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් මගේ තිබෙන්නේ සතුටක්. අඩුම තරමින් මට මේ අවස්ථාව කියා දෙන්න පුළුවන්. එතකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් - මම වෙන වෙන කාරණා කියන්න යන්නේ නැහැ. ඔබතුමාගේ මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. කිරුළපන නුගගහ පුර ප්‍රදේශයේ තිබෙන ප්‍රශ්නය ගරු මහ ඇමතිතුමනි, ඇස් දෙකෙන් ගිහිල්ලා බලන්න. දැන් කන්ද කඩා වැටෙන්න කිට්ටුයි. ඒ නිසා ඒ මිනිස්සුන්ට අයින් වෙන්න දැන් ප්‍රාදේශීය ලේකම්වරිය අවස්ථාව දුන්නා. එතකොට දැන් අපි, මේ පළාත් සභාව මැදිහත් වෙලා ගෙවල් ටිකක් හදා දීමේ කටයුත්තක් කරන්න අවශ්‍යයි. ඒ කන්ද නැවත පැමිණීම වැළැක්වීම වෙනුවෙන් කටයුත්තක් කරන්න තිබෙනවා. එහෙම නම් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව සක්‍රිය කරන්න පළමුවැනි පියවරක් හැටියට අපි මේ සඳහා අවධානය යොමු කරවලා, ඒ වැඩේ කරමුයි කියන යෝජනාව කරමින්, විශේෂයෙන් අපේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මට තව තත්පර 30 ක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. තත්පර 30 ක් දෙන්නම් කෝ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට අපේ පක්ෂයේ නිර්මාතෘවරයා. රෝහණ විජේවීර සහෝදරයා කියපු එක දෙයකින් මම මේ කථාව අවසන් කරනවා. අපේ මන්ත්‍රීතුමියන්ලා විශේෂයෙන් අවධානය යොමු කළේ ශිෂ්ටාචාරය පැවති දා ඉඳන්ම

මේ ස්වභාවික ව්‍යසනයන් වෙනවා. ඇත්ත. හැබැයි, 1978 අපේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා කිව්වා එක අනාවැකියක්. අඩි 3000 ට වඩා උස ප්‍රදේශ රක්ෂිත වනාන්තර කරන්න ඕනෑ. නැත්නම් ගැටළුවක් ඇති වෙනවා. මහවැලිය නොවෙයි. උතුරට ජලය ගෙන යාමට අදාළව සංවර්ධන යෝජනා ක්‍රමයකට යන්න ඕනෑ. වැඩිම ජල ප්‍රමාණයක් එන්නේ කළු ගඟෙන්. කළු ගඟ තමයි හරවන්න ඕනෑ කියලා. හැබැයි, 1978 එවකට හිටපු නායකයෝ මේක ඇහුවේ නැහැ. දැන් අපි අනිටු ප්‍රතිඵල අත් විඳිමින් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැනත් අවධානය යොමු කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ කාලීන සැලසුම් මත අපි සැලැස්මක් සකස් කර ගන්න ඕනෑය කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. කොහොම හරි පක්ෂයේ නායකතුමාගේ නමත් සඳහන් කර ගත්තා නේද? ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු වුණා ඒ කථාව. මීළඟට තිබෙන්නේ, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා සභාව ඇමතීම. කාලය විනාඩි 07 යි.

[අ.භා. 12.55]

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මූලාසනයෙන් අවසරයි. පළමුවෙන්ම මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ පළාත් සභාවේ නවක මන්ත්‍රීවරයෙක් විධියට 1993 අවුරුද්දේ ඉඳලා මේ පළාත් සභාව නියෝජනය කරන, වරෙක අමාත්‍යවරයෙක් විධියට අපේ පළාතට විශාල සේවාවක් කරපු ජ්‍යෝෂ්ඨතම ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනයේ ඉඳගෙන ඉන්න වෙලාවක මට මේ කථාව කරන්නට ලැබීම පිළිබඳව මම පෞද්ගලිකව සතුටු වෙනවා. ඒ වාගේම දෙවනුව, මම මෙය අවස්ථාවක් කර ගන්නවා, පසුගියදා ඉතාමත්ම කනගාටුදායක විපතකට මුහුණ දුන්නු කොස්ලන්ද, හල්දුම්මුල්ල ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේත් විශේෂයෙන්ම, පොදුවේ බස්නාහිර පළාතේ ජනතාවගේත් කනගාටුව ප්‍රකාශ කර සිටින්නට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෙවුණු දශක දෙකක පමණ කාලය මුළුල්ලේ අපි දැකලා තිබෙනවා, මේ ලෝකයේ ස්වභාවික චක්‍රයන් සියල්ලම පාහේ බලාපොරොත්තු නොවන ආකාරයට, මීට පෙර බලාපොරොත්තු නොවූ ආකාරයට වෙනස්කම්වලට භාජනය වෙලා තිබෙන බව. එසේ වෙනස්කම්වලට භාජනය වීම හරහා ලෝකයේ ඉතාමත්ම දියුණු රටවල සිට දියුණු වෙමින් පවතින රටවල් දක්වා ස්වභාවික ව්‍යසනයන්ට මුහුණ දීමට සිදු වුණු ආකාරය පසුගිය දශක දෙක ඇතුළත අපි ඉතා විශාල වශයෙන් දැක්කා. මේ සඳහා හේතු වෙලා තිබෙන ප්‍රධානතම කාරණාව වන්නේ, මේ ලෝකයේ මානවයා විසින් කර ගෙන යනු ලබන සංවර්ධන වැඩ පිළිවෙළ. මේ සංවර්ධන වැඩ පිළිවෙළේ අතුරු ඵල ලෙස විවිධ හේතූන් පදනම් කර ගනිමින් ස්වභාවික චක්‍රයන් වෙනස් වීමකට භාජනය වෙලා තිබෙනවා. මේ වෙනස් වීම ඇතුළේ මෙතෙක් කලක් අපේක්ෂා නොකළ ආකාරයේ දැවැන්ත වැසි ලැබීම, ඒ වාගේම අනපේක්ෂිත කාලවලදී නියඟ ඇති වීම ආදී ස්වභාවික චක්‍රයන්ගේ යම් යම් විකෘතීන් ඇති වී තිබෙනවා. මෙවැනි වාතාවරණයක් තුළ මේ ආකාරයේ සිදු වීම් පදනම් කර ගනිමින් ඇති වනු ලබන අනාගත ව්‍යසනයන්ට මුහුණ දීම උදෙසා බස්නාහිර පළාත් සභාව විධියට අපි කිසියම් ඒකකයක් පවත්වාගෙන යා යුතුයි. කිසියම් ඒකකයක් පිහිටුවිය යුතුයි යන්න පිළිබඳව ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කරන ලද යෝජනාවට මාගේ සම්පූර්ණ සහයෝගය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙහිදී විශේෂයෙන් සඳහන් කර සිටින්නේ, අපි ජීවත් වන බස්නාහිර පළාත අපි දන්නවා, නිරිත දිග මෝසම් වැසිවලට වර්ෂයේ එක කාලයකදී මුහුණ දෙනවා. ඒ වාගේම තමයි මධ්‍ය කඳුකරයට ඇති වන්නා වූ අධික වූ වර්ෂාපතනයේ ජල ප්‍රමාණය විශාල වශයෙන් මුහුදට ගලා ගෙන යන්නේ, එහෙම නැත්නම් පහළට ගලාගෙන එන්නේ මේ බස්නාහිර පළාත හරහා. මා ජීවත් වන ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ආසනය, මීනුවන්ගොඩ ආසනය, ජා-ඇළ ආසනය වැනි ප්‍රදේශ ඈත අතීතයේ ඉඳලාම ඒ පහත් බිම් නිරන්තරයෙන්ම මේ අධික වර්ෂාව නිසා යට වීමේ තත්ත්වයකට මුහුණ දුන්නා. නමුත් මෑත කාලීනව අපි දැක්කා ඉතාමත්ම පිළිවෙළට ඒ වතුර බැස්ස වීම උදෙසා කර ගෙන යනු ලැබූ සංවර්ධන ව්‍යාපෘතීන් නිසා යම් ආකාරයක පාලනයක් මෙහි දක්නට ලැබෙන බව. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කිසි විටෙකත් අපේක්ෂා කරන්නට බැරි ආකාරයේ දැවැන්ත වර්ෂාපතනයක් ලැබුණොත් සමහර වෙලාවට දිනයකට දෙකකට අපි අර්බුදකාරී

[ගරු සුසාර දිනාල් සිල්වා]

තත්ත්වයකට මුහුණ දෙන්නට ඉඩ තිබෙනවා. අපට මතකයි. මීට මාස කිහිපයකට කලින් කළුතර දිස්ත්‍රික්කයේ මෙවැනි තත්ත්වයක් ඇති වෙලා, අපේ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් පවා ඒ වෙනුවෙන් බොහොම කැප වෙලා කටයුතු කළා. අනික් අතට අපි කළුතර දිස්ත්‍රික්කය ගත්තාම රබර් වගාව, තේ වගාව ආශ්‍රිතව කඳුකර වගාවන් පැවැත්වෙන නිසා නාය යාමේ තර්ජනයන්ට කළුතර දිස්ත්‍රික්කයේ නොයෙකුත් ප්‍රදේශ මුහුණ දීමේ අවධානමක් තිබෙනවා. එතකොට මෙවැනි පසුබිමක් මත කළුතර දිස්ත්‍රික්කයේ කළු ගඟ ආශ්‍රිත ජනතාවත්, ඒ වාගේම විශේෂයෙන්ම කැලණි ගඟ ආශ්‍රිතව ගම්පහ දිස්ත්‍රික්කයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවත් මධ්‍ය කඳුකරයට ලැබෙන්නා වූ අධික වර්ෂාව බැස ගෙන යන අවස්ථාවලදී ගං වතුර තර්ජනයකට මුහුණ දීමේ අවදානමක් තිබෙනවා. මෙවැනි අවදානම් කලින් හඳුනාගෙන ඒ පිළිබඳව කලින් ක්‍රියාත්මක වීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මා මෙහිදී විශේෂයෙන් අවධාරණය කරනවා.

මේ මොහොතේදී සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මෙතැන නොසිටියත්, එතුමා සඳහන් කළා විශේෂයෙන්ම බංගලිදේශයයි ඉන්දියාවටයි පස්සේ අපි අවදානම් ලැයිස්තුවේ ඉන්නවාය කියලා. මම හිතනවා, ඒකේ පොඩි වැරැද්දක් තිබෙනවා. බංගලාදේශය, ඉන්දියාව, පකිස්ථානය සහ නේපාලයට පසුවයි අපි මේ අවදානම් ලේඛනයේ ඉන්නේ. දකුණු ආසියානු කලාපයේ. එසේ නමුත් ඒ අවදානම් ලේඛනයේ යටින් හිටියාය කියලා අපට මේක බැහැර කරන්නට බැහැ. විශේෂයෙන්ම බස්නාහිර පළාත මේ රටේ ආර්ථිකයේ මර්මස්ථානය. මේ රටේ ආර්ථිකයේ සන්ධිස්ථානය. මේ රටේ සියලුම පරිපාලන ව්‍යුහය ක්‍රියාත්මක වන ස්ථානය. වැඩිම ජන ගහනයක් ජීවත් වන ස්ථානය. ඒ නිසා අපට සිද්ධ වෙනවා, බස්නාහිර පළාත විධියට අනාගතයේ ඇති විය හැකි මෙවැනි විපත්තීන් සඳහා කිසියම් ක්‍රමවත් වැඩ පිළිවෙළක් මේ බස්නාහිර පළාත තුළ සකස් කර ගැනීමට. ඒ සඳහා අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත් කාලෝචිතයි කියලා මම මේ ගරු සභාව ඉදිරියේ මේ අවස්ථාවේ නැවත වාරයක් ප්‍රකාශ කරන්නට කැමැතියි.

ඒ වාගේම තමයි අපි අපේ රටේ ඉතිහාසය දෙස බැලුවාම නොයෙකුත් අවස්ථාවන්වලදී අපි ස්වභාවික ව්‍යසනයන්වලට මුහුණ දීලා තිබෙනවා. හැබැයි, මෑත දශක දෙක දිහා බැලුවාම ඒ ස්වභාවික ව්‍යසනයන්ගේ මෙතෙක් තිබූ සාමාන්‍ය රටාවේ දැඩි වෙනස්කම් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. රටක් විධියට අපේ ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වෙනවා. අපි දන්නවා. මේ පුංචි රටේ ජීවත් වන මිනිස්සු කොහේ හරි ජීවත් වෙන්න ඕනෑ. එතකොට අපේ විපක්ෂයේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, මෙවැනි වැඩ කටයුත්තකට පොදු වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා. හැමෝගේම දායකත්වය එක්ක. හැමෝගේම සහයෝගය එක්ක. හැබැයි මම හිතනවා, ඒ පොදු වැඩ පිළිවෙළට සහයෝගය දැක්වීම පිළිබඳව යම් යම් ගැටළුකාරී තත්ත්වයන් තිබෙනවාය කියලා. අපි අද දකිනවා. කොළඹ නගරයේ පැල්පත් ආශ්‍රිතව ඉන්න ජනතාවට නව නිවාස තනා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. හැම විටම මේ ව්‍යාපෘතියේ වැරදි පැත්ත උද්දීපනය කරමින්, ඒකේ අඩු ලුහුඬුකම් පෙන්වා දෙමින් කටයුතු කරනවා විනා, මෙවැනි වැඩ පිළිවෙළකට දේශපාලනමය භේදයකින් තොරව සහයෝගය දැක්වීමක් අපට දක්නට ලැබෙන්නේ නැහැ. දැන් අපි මීරියබැද්ද ප්‍රදේශය ගත්තත්, කොස්ලන්ද ප්‍රදේශය ගත්තත්, යම් හෙයකින් මීට පෙර මේ ජනතාව ඉවත් කරන්නට දේශපාලන අධිකාරිය මැදිහත් වූවා නම්, අනිවාර්යයෙන්ම අපට අහන්නට සිද්ධ වෙන්නේ අද කොළඹ නගරයේ පැල්පත් ඉවත් කරද්දී අපි මුහුණ දෙන දේශපාලන ගැටළුවටමයි. ඒ නිසා මේ තත්ත්වය මීට වඩා පුළුල් ලෙස බැලිය යුතුයි. බස්නාහිර පළාත් සභාව විධියට අපි මේ තත්ත්වය මීට වඩා පුළුල් ලෙස බැලිය යුතුයි.

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා කොළඹ දිස්ත්‍රික්කයේ හඳුනාගත් කිසියම් ස්ථානයක තිබෙන්නා වූ ගැටළුවක් පිළිබඳව. මෙවැනි ගැටළුවක් විසඳීමේදී සමස්ත දේශපාලන පක්ෂ සියල්ලම එකතු වෙලා, ජනතා නියෝජිතයන් එකතු වෙලා, අපේ මේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා යෝජනා කරනවා වාගේ කිසියම් අධිකාරියක්, එහෙම නැත්නම් කිසියම් ආයතනයක් සම්බන්ධ කර ගෙන ඒ තොරතුරු එක්රැස් කරලා, අනාගතයට ගැලපෙන විධියට මේ ප්‍රශ්නයට විධිමත් විසඳුමක් කරා යෑමේ හැකියාව අපට තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේත්, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේත් තිබෙන්නා වූ ගංවතුර තර්ජනයට පිළියමක් සඳහා ගංවතුර

තර්ජනය කලින් හඳුනාගෙන ඒ පිළිබඳව පිළියම් යෙදවීම සඳහා සහ මධ්‍ය කඳුකරයට ලැබෙන්නා වූ අධික වර්ෂාපතනයෙන් පීඩාවට පත් වීමට ඉඩ තිබෙන කළුතර සහ ගම්පහ ජනතාව පිළිබඳව සලකා බලා මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට සියලු දෙනාගේම දායකත්වය, සියලු දෙනාගේම සහයෝගය ලැබෙනු ඇතැයි මා විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි පසුගිය කාල සීමාව මුළුල්ලේ අපි දකිනවා, අපේ රටේ සීඝ්‍ර සංවර්ධන වැඩ පිළිවෙළක් මහින්ද රාජපක්ෂ ගරු ජනාධිපතිතුමන්ගේ රජය යටතේ සිද්ධ වෙනවා. Highway හැදිලා තිබෙනවා. එහෙම නැත්නම් අධිවේගී මාර්ග හැදිලා තිබෙනවා. තිබුණු මාර්ග දැවැන්ත ලෙස පුළුල් වෙලා තිබෙනවා. Lane දෙකට තිබුණු පාරවල් Lane හතරට වර්ධනය වෙනවා. මෙහෙම වෙන කොට සමහර වෙලාවට ස්වභාවිකව ජලය බැස යාමට අතීතයේ සිට තිබුණු මාර්ගයන් අවහිර වන්නට පුළුවන්. ඒ ස්ථානවලට පාලම් හදනවා. බෝක්කු හදනවා. නමුත් ඒවා ඒ ආකාරයට හැදුවාට අනපේක්ෂිතව ලැබෙන වර්ෂාපතනයක් නිසා මේ තැන්වල පැය කිහිපයකට මේ වතුර ප්‍රමාණයේ හිර වීමක් ඇති වෙන්න පුළුවන්. අපි පසුගියදා කළුතර දිස්ත්‍රික්කයේ දැක්කේ අන්න ඒ වාගේ තත්ත්වයක්. පසුගිය දින කිහිපය මුළුල්ලේ වේයන්ගොඩ ප්‍රදේශයේ, ජාඇළ, කිරිදිවිට ප්‍රදේශය වාගේ ප්‍රදේශවල වතුර එකතු වෙලා තිබෙන ආකාරය අපි දැක්කා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී ඉතාමත් කාලෝචිතයි අපි මෙවැනි සිදුවීම් කල් තියා හඳුනාගැනීම. ඒ වාගේම අපි දකිනවා, මෙවැනි සිදුවීම් සිදු වන අවස්ථාවන්වලදී සමහර උදවිය උත්සාහ කරනවා, පටු දේශපාලන වාසි ලබා ගන්නට. සමහර උදවිය උත්සාහ කරනවා, මේ හරහා වෙනත් යම් යම් ප්‍රතිලාභ ලබා ගන්නට. නමුත් පළාත් සභාවක් විධියට කිසියම් විධිමත් වැඩ පිළිවෙළක් අපට ක්‍රියාත්මක කළ හැකි නම්, ඒ විධිමත් වැඩ පිළිවෙළ හරහා අපේ ජනතාවට සෙත සලසන්නට අපට හැකියාව තිබෙනවා. එක පැත්තකින් මධ්‍යම රජය ක්‍රියාත්මක වෙද්දී එක පැත්තකින් ආපදා කළමනාකරණ අධිකාරිය සහ අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙද්දී අනෙක් අතින් පළාත් සභාවක් විධියට අපේ මන්ත්‍රීවරුන්ට හැකියාව තිබෙනවා, මේ සඳහා කිසියම් විධිමත් වැඩ පිළිවෙළක් යොදන්න. විශාලතම ජනගහනයක් ජීවත් වන, විශාල භූමි ප්‍රදේශයක් නියෝජනය කරන ජනතාව විධියට මම මේ යෝජනාවට මගේ පක්ෂග්‍රාහීත්වය ප්‍රකාශ කරමින්, එතුමන්ට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. සමාවෙන්න ඕනෑ බාධා කළාට. 2014 රැස්වීම් පැවැත්වීමේ දින ලේඛනය මා වෙතත් මීගමුව බන්ධනාගාරය වෙතත් ලැබී තිබෙනවා. නමුත් දෙසැම්බර් මාසයේ දින වෙනස් වෙලා තිබෙනවා. කරුණාකරලා මම ගෞරවයෙන් ඉල්ලනවා. මීගමුව බන්ධනාගාර අධිකාරීතුමාටත්, බන්ධනාගාර කොමසාරිස්තුමාටත් ඒ බව දැනුම් දෙන්නය කියලා. මොකද, පරණ දිනවලට තමයි මාව ලබන මාසයේ ගේන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඒ කාරණාව මම ලේකම්තුමා වෙත යොමු කරනවා. අවශ්‍ය පියවර ගන්න. බොහොම ස්තුතියි. මගෙත් මේ මංගල මූලාසනය. මීළඟට යළිත් වරක් ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Hector Bethmage M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.06]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම අපේ සහෝදර මන්ත්‍රී ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමාගේ යෝජනාව, මම හිතනවා මේක ඉතාම කාලෝචිත යෝජනාවක්. මේ යෝජනාව පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ යෝජනාවේ මම හිතන්නේ, එතුමා අවසන් කරලා

[ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්]

තිබෙන්නේ මේ උවදුර පැමිණ ඊට මුහුණ දීම සඳහා, වළක්වා ගැනීමට වෙනම ඒකක පිහිටුවීම ඉතා කඩිනමින් කළ යුතු කාර්යයක් බවට පත්ව ඇත කියලයි. මම හිතනවා, ගරු සභාපතිතුමනි, අද ආණ්ඩුව පැත්තෙන් බැලුවත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මේ රටේ තිබෙනවා. මට තේරෙන්නේ නැහැ, අපි ආයිත් කමිටු පත් කරන්නේ ඇයි කියලා. එතකොට ආපදා කළමනාකරණ ආයතනයේ ප්‍රධාන පරමාර්ථය තමයි යම් උවදුරක් වෙන්න කලින් ඒවා හඳුනාගෙන ඒකට පිළියම් යෙදීම. එතකොට අද මේ ගරු මන්ත්‍රීතුමාගේ අදහස වන්නේ, ඒ වාගේ අමාත්‍යාංශ, මේ වාගේ දෙපාර්තමේන්තු තුළින් නිසියාකාරව ක්‍රියා පටිපාටියක් හා ජනතාවට සේවයක් වෙන්නේ නැති හින්දා අලුත් කමිටු හදන්න එතුමා උත්සාහ කරනවාද කියන ප්‍රශ්නය තියෙනවා. ඒ ප්‍රශ්නය කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද අපි මේ සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් හැටියට තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු, බොහෝ මන්ත්‍රීවරු ගණනාවක් අද මේ සාකච්ඡාවේදී, මේ සභාවේදී මතු කළේ - ඇත්තටම අපි දන්නවා, පසුගිය කාලයේ විශාල සංවර්ධන ව්‍යාපෘතියක් මේ රටේ වෙනවාය කියලා අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැම තිස්සේම කියන දෙයක්. අපට පේන්න තිබෙන දෙයක්. විශාල වශයෙන් පාරවල් හැදෙනවා. කාපට් කරනවා. කඳු කපනවා. Highway හදනවා. ඒ වාගේ විශාල සංවර්ධනයක් වෙනවා. නමුත් මේ සංවර්ධනය හරහා - තට්ටු නිවාස හදනවා. කැසිනෝ හදනවා. ඉඩම් මංකොල්ල කනවා. ඒ ඔක්කොම වෙනවා. ඒ නිසා මේ සංවර්ධනය හරහා -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මේවා හදන්නේ කාටද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කාටද? මේ සංවර්ධනය කියන එක තමයි අද අපට තිබෙන ප්‍රධානම ගැටළුව. මේ ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් මේ සංවර්ධනය වෙනවාද? එහෙම නැත්නම් මේ රටේ තිබෙන දේශපාලන අධිකාරිය වෙනුවෙන් එහෙම නැත්නම් මේ රටේ ඉන්න ඉහළ පැලැන්තියක් වෙනුවෙන් මේ සංවර්ධනය වෙනවාද කියන එක තමයි ප්‍රධාන වශයෙන් තිබෙන ගැටළුව. මේ සංවර්ධනය මානව හිතවාදී සංවර්ධනයක්ද? එහෙම නැත්නම් ජනතාවට අවශ්‍ය සංවර්ධනයක්ද? ජනතාවගේ උවමනා එපාකම් සිදු වෙන සංවර්ධනයක්ද කියන එක තමයි අද අපට තිබෙන ප්‍රධානම ගැටළුව බවට අද පත් වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම නම් හිතන්නේ, මේක ජනතාව මුල් කර ගෙන වෙන සංවර්ධනයක් නොවෙයි. මේක මේ රටේ ඉන්න ඉහළ පැලැන්තියක්, එහෙම නැත්නම් ව්‍යාපාර පැලැන්තියක් වෙනුවෙන් මේ කරන සංවර්ධනයක් තමයි පසුගිය කාලයේ අපි දැක්කේ. අද දැන් කථා වුණා High Way ගැන. අධිවේගී මාර්ග ගැන. ඒ ඇත්ත. අපි දැක්කා දකුණු අධිවේගී මාර්ගය හැදුවා. ඒ හැදුවාට පස්සේ, වැස්සක් වැස්සාට පස්සේ දකුණු ප්‍රදේශයේ කළුතර දිස්ත්‍රික්කයේ අධිවේගී මාර්ගය නිසා විශාල ප්‍රදේශයක් යට වුණා. විශාල ජනතාවකට ඒකෙන් බාධා සිද්ධ වුණා. ඔවුන්ගේ ජීවිත කඩා වැටුණා. ඒ අධිවේගී මාර්ගය අපි හැදුවාට නමුත් අපි ගම්වලට ගිහිල්ලා බැලුවාම ඒ ගම්වල තිබෙන පාරවල් ටික, ඒ වතුවල තිබෙන පාරවල් ටික හදන්න එහෙම මුදල් වියදම් කරන්නේ නැහැ. මේ කාපට් කරලා, අධිවේගී මාර්ග හදන්නේ මේ රටේ ඉන්න ඉහළ පැළැන්තිවල ඉන්න මොන්ටෙරෝ, පෙජරෝ ඒ වාගේ වාහනවල යන්න පුළුවන් ඒ පැළැන්තියට යන්න තමයි මේ අධිවේගී මාර්ග හදන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

බොරු කියන්න එපා. කොහේවත් යට වෙලා නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එහෙම නැත්නම් ගම්වල ඉන්න, ගමේ බයිසිකලය පදින, ගමේ ත්‍රීවීල් එක එලවන, ගමේ මෝටර් සයිකලය යන ඒ පාරවල් හැදෙන්නේ නැහැ. අද ඒ පාරවල් තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්කයට ගිහිල්ලා අතුරු පාරවල් ටික බැලුවාම, ඒ අතුරු පාරවල්වල අද එකම - බස්නාහිර පළාත තුළ විශාල අතුරු පාරවල් ප්‍රමාණයක් තිබෙනවා. ඒවා සංවර්ධනය වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ කාපට් පාරවල් ගැන

නොවෙයි. ඔබතුමා මේ අතුරු පාරවල් ගැන, කාපට් පාරවල් ගැන කථා කරනවා. මොනවාද? මේ ඔබතුමා සභාවට කියන්නේ. විෂයට අදාළව කථා කරන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මේ කථාව මම කරන්නේ විෂයට අදාළව. මේක සංවර්ධනය ගැන තිබෙන ගැටළුවක්. ඒ සංවර්ධනය උඩ වෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි හතයි තිබෙන්නේ. දැන් විනාඩි 04 ක් වෙන දේවල් ගැන කථා කළා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ව්‍යසනයක් මේක. විශේෂයෙන් පසුගිය කාලයේ අපි දන්නවා, මේ සංවර්ධන වැඩ පිළිවෙළවල් යටතේ විශාල වශයෙන් කඳුකරයේ ඒ පළාත්වල ගස් කැපුවා. කැලෑ එළි කළා. ඒවා විනාශ කරලා තිබුණා. අද වන කොට මම තමුන්නාන්සේට මතු කරන්න කැමැතියි. අවදානයට යොමු කරන්න කැමැතියි. අද මේ මාලිගාවත්ත ප්‍රදේශයේ තිබෙනවා, දිවංගත ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ හදපු නිවාස 1700 ක පමණ නිවාස සංකීර්ණයක්. ඒ නිවාස සංකීර්ණය වටේ, ඒ නිවාසවල ඉන්න නිවාසලාභීන්ට, ඒ ජනතාවට අවශ්‍ය කරන ඒ පරිසරය විශාල ගස් වවලා ඒ අවශ්‍ය කරන පරිසරය හදලා තිබුණා. නමුත් දැන් දවස් දෙකකට කලින් අපි දන්නේ නැහැ, නිවාස අමාත්‍යාංශය දැනුවත් ද කියලා. අක්කර භාගයක තිබුණු ගස් 300 ක් විතර වාගේ කපලා ඇලා, ඒවා විනාශ කරලා දාලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ ඒ නිවාසවලට අවශ්‍ය කරන ඒ වාතාශ්‍රය, ඒ පරිසරය, ඒ නිවාස හදනවාත් එක්කම ඒ වටේ විශාල ගස් ප්‍රමාණයක් වැව්වා. ඒ ගස් වැව්වේ මේ පරිසරය ආරක්ෂා කරන්න. නමුත් අද වන කොට නිවාස අමාත්‍යාංශය විසින් මේක කළාද කියලා අපි දන්නේ නැහැ. ගස්වැල් 300 ක් විතර වාගේ කපලා, සමතලා කරලා දාලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ තුළ විශාල පරිසර හානියක් ඒ ප්‍රදේශ තුළ අද සිද්ධ වෙනවා. විශේෂයෙන්ම මගේ කථාව තුළදී මම මතු කරන්නේ මේ කරන සංවර්ධනය, මේ වන ස්වභාවික විපත්වලට වග කිව යුතුයි කියලයි. මොකද, මේ සංවර්ධනය හරහා තමයි, මේ මානව හිතවාදී නැති සංවර්ධනයක් හරහා තමයි මේ ස්වභාවික විපත්ති සිද්ධ වෙන්නේ. ඒ නිසා රජය තමන්ගේ සංවර්ධන වැඩ පිළිවෙළේදී මේ සංවර්ධනයන් මානව හිතවාදී සංවර්ධනයක් බවට පරිවර්තනය කළොත් විතරයි අපට මේ ස්වභාවික විපත්වලින් බේරෙන්නට පුළුවන් කියන එක තමුන්නාන්සේ ඉදිරියේ මතු කරන්න කැමැතියි. ස්තුතියි.

[අ.භා. 01.12]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව සම්බන්ධව කථා කරන්න අවසර ලබා දීම සම්බන්ධව. ඒ මාතෘකාවට අදාළව මගේ කථාව පටන් ගන්න කලින් මම කැමැතියි සභාවේ අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම අද මේ සභාවේදී සිරස මාධ්‍ය ආයතනය සභාව වාර්තා කිරීම සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධව සමහර මන්ත්‍රීවරුන් කථා කළා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ VI වන පළාත් සභාව සිරස මාධ්‍ය ආයතනයත්, සමහර මුද්‍රිත මාධ්‍ය ආයතනත් හරහා බස්නාහිර පළාත් සභාවක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවෙන් කෙරෙන කාර්ය මොකක්ද කියන එක ජනතාව අතරට යනවා. ඒ නිසා මේ ගරු සභාවෙන් මම ඉල්ලා සිටින්න කැමැතියි. ඔබතුමා අනෙකුත් විද්‍යුත් මාධ්‍ය ආයතනවලටත් ආරාධනා කරන්න, මේ ආයතනයට පැමිණෙන්න. මේ සභාව වාර්තා කරන්නය කියලා. එහෙම නැතිව මාධ්‍ය වාරණයකට ලක් කරන්න යෝජනා වෙන්නේ නැතිව අනෙකුත් මාධ්‍යවලටත් විවෘතව ආරාධනා කරලා ඒ මාධ්‍ය හරහාත් මේ සභාවේ කෙරෙන කාර්යයන් මහජනයා අතරට ගෙන යන්න අවස්ථාව ලබා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක කරලා තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා. සියලුම මාධ්‍යවලට අපි ආරාධනා කරලා තිබෙනවා. මාධ්‍ය වාරණයක් අපි කරන්නේ නැහැ. අපි විවෘතව -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

යන්නේ ඔබතුමාගේ එක විතරයි නේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ නිසා විශේෂයෙන්ම වාර්තා කරන්න එන මාධ්‍ය ආයතනයක් වාරණයට ලක් කරන්න කවුරු හරි යෝජනා කරනවා නම්, මම ඒ යෝජනාව ඉතාම පිළිකුළෙන් හෙළා දකිනවා. මොකද හේතුව, මේ සභාවෙන් කෙරෙන කාර්යය සම්බන්ධව ජනතාවට පණිවිඩයක් ගෙන එන්නේ, මේ මාධ්‍ය ආයතනය හරහා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සිරසට කියන්න ඔබතුමාව විතරක් දාන්න එපා කියලා. අනෙක් මන්ත්‍රීවරුන්ගේත් අදහස් පෙන්වන්න කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මේ මාතෘකාවට අදාළව කථා කරද්දී ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද මේ යෝජනාව දිහා බැලුවාම -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සිරස එන්නේ ඕගොල්ලෝ වෙනුවෙන් විතරයි. ඒකයි ප්‍රශ්නය.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මේ යෝජනාව හොඳ යෝජනාවක් වෙන්නේ පැතිකඩ ගණනාවකින්. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජනතාවට සහන සැලැස්වීම සඳහාත්, ඒ එන්න තිබෙන ආපදාවලින් ඒ ජනතාව බේරා ගැනීම සඳහාත් මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව ඉතාම හොඳයි. ඒ එක්කම මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. දැන් මේ යෝජනාව හරහා ඇත්තටම අපට පුළුවන් රජයට යෝජනා කරන්න තවත් අමාත්‍යාංශයක් පිහිටුවන්න කියලත්. කොස්ලන්ද ජනතාව නාය යෑමෙන් බේරා ගැනීමේ අමාත්‍යාංශයක් පිහිටුවීමේ අවස්ථාවකුත් මේ හරහා ලැබිලා තිබෙනවා. මොකද හේතුව, අපි විශේෂයෙන්ම 2004 සුනාමි ව්‍යසනය ආවාට පස්සේ, විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් ඇති කරලා, ආපදා කළමනාකරණ ඇමතිවරයෙකුත් පත් කරලා තිබෙන රටක තමයි නැවත වරක් මේ පළාත් සභාව මේ යෝජනාව ගේන්නේ. විශේෂයෙන්ම අපි කොපමණ අධිකාරී පිහිටෙව්වත් ඇමතිවරු පත් කළත්, අමාත්‍යාංශ පත් කළත්, ඒ අමාත්‍යාංශ යටතේ ඉන්න නිලධාරීන් අදාළ අවශ්‍ය මූලික පියවරයන් ගන්නවාද කියන ගැටලුව අපට තිබෙනවා. විශේෂයෙන්ම කොස්ලන්දේ මෙවැනි නාය යාමක් සිදු වෙයි කියලා කලින් ප්‍රකාශ වෙලා තිබුණත්, සැක පහළ කරලා තිබුණත් ඒ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා ඒ ජනතාව අවදානම් සහිත කලාපයෙන් ඈත් කිරීම සඳහා පියවර ගත්තාද කියන සැකය අපට තිබෙනවා. ඒ නිසා තමයි මේ අධිකාරියක් පිහිටුවීමේදී මේ අධිකාරියේ බලය සම්බන්ධව, ඒ අධිකාරියට, ඒ නිලධාරීන් ක්‍රියාත්මක නොවෙනවා නම් ඒ සඳහා ගත හැකි පියවර සහ බලතල සම්බන්ධවත් වගකීමක් ලබා දිය යුතුයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. එහෙම නැත්නම් වෙන්නේ නැවතත් මහජනතාවගේ බදු ගෙවන මුදල් කාබාසිනියා වීමක් මේ හරහා සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා මෙහි මූලික කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා එවැනි බලයක් සහිත අධිකාරියක් පිහිටුවන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට අද ඉදිරිපත් වෙලා තිබෙනවා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය බස්නාහිර පළාතේ පිහිටුවීම සම්බන්ධව - දැන් විශේෂයෙන්ම මට කනගාටුයි මේක ගැන කියන්න. බස්නාහිර පළාතේ තිබෙන අපද්‍රව්‍ය කළමනාකරණය ගැන, ඒ සියලු කාරණා ගැන කථා කරද්දී, විශේෂයෙන්ම මේ කාලගුණික විපර්යාසයත් එක්ක කාලගුණික වෙනස් වීමත් එක්ක දැන් කරදියාන කුණු දාන ස්ථානය ගැන කථා කරලා තිබෙනවා. හැබැයි, මීතොටමුල්ලට කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේත් අනෙකුත් නගර සභා කිහිපයක කුණු ගෙනැල්ලා බලෙන් කොළොන්නාව ජනතාව මත පටවලා, ඒ ජනතාවගේ සාමාන්‍ය ජීවිතය විනාශ කරලා, ඒ දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කරලා මේ පවත්වාගෙන යන කොළොන්නාව, මීතොටමුල්ල කුණු කන්ද ගැන අපේ පළාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අවධානය යොමු නොවීම සම්බන්ධව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ එක්කම මේ වේගවත් සංවර්ධන ක්‍රියාමාර්ග කරන එක රටට හොඳයි. ඒක කරන්න ඕනෑ. ඒකෙන් සාක්කු පුරවන එක ගැන අපි කථා කරන්නේ නැහැ. ඒකෙන් කොමිස් ගහන එක ගැන අපි කථා කරන්නේ නැහැ. හැබැයි, මේ සංවර්ධන කාර්යයන් කරන කොට පාරවල් හදන කොට වෙන්න පුළුවන්, මුහුද ගොඩ කරන කොට වෙන්න පුළුවන් තවත් වෙනත් සංවර්ධන කාර්යයක් වෙන්න පුළුවන්. ඒ සංවර්ධන කාර්යය ආරම්භ කරන්න

කලින්, පූර්ව පරිසර ශක්‍යතා වාර්තාවක් ලබා ගන්නය කියලා මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම දැන් කොළඹ නගරය ආශ්‍රිතව ගොඩ කිරීමට නියමිත Port City කියන දූපත සම්බන්ධව කථා කරද්දී, දැන් අක්කර 500 ක් ගොඩ කරනවා. හෙක්ටයාර් 233 ක්. මා ඉතා වගකීමෙන් කියනවා මේ හෙක්ටයාර් 233 න් චීනයේ CCCC කියන සමාගම සමඟ අත්සන් කරපු ගිවිසුම අනුව, හෙක්ටරයාර් 233 න් 125 ක් ශ්‍රී ලංකාවට අයිතියි. ඉතිරි 108 න් 88 ක් 99 අවුරුද්දක් යන කල් චීනයට අයිතියි. ඊට අමතරව හෙක්ටයාර් 20 ක්, ඒ කියන්නේ අක්කර 45 කට ආසන්න ප්‍රමාණයක් සදාකාලිකව චීනයට අයිතියි. මේ දූපතේ ඒ අක්කර 45 තුළ ශ්‍රී ලංකාවේ කොඩියවත් උස්සන්න බැරි තත්ත්වයක් තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ අතරම කියන්න ඕනෑ. පසුගිය ඔක්තෝබර්, නොවැම්බර් මාසවලදී මේ යෝජනාව අනුමත කර ගනිද්දී, ඒ මොහොත වන කොට මේ අක්කර 500 ක් ගොඩ කිරීම හරහා ඒ මුහුදු වතුර කොයි පැත්තටද යන්නේ. ඒවායින් වන හානිය මොකක්ද? ඒ සඳහා හානියක් වෙනවා නම් ඒ ජනතාව ඒවායින් බේරා ගැනීම සඳහා ගන්නා වූ පියවර මොකක්ද කියන එක සම්බන්ධවත් කිසිදු තීන්දුවක් නැතිව තමයි කැබිනට් මණ්ඩලයට මෙය ඉදිරිපත් කර තිබුණේ.

ඊට අමතරව, මේ සංවර්ධන කටයුත්ත භාර දුන්න, චීනයේ CCCC කියන සමාගම ලෝක බැංකුව අසාදු ලේඛන ගත කළ සමාගමක්. මෙන්න මේ වාගේ ලෝක බැංකුව තහනම් කළ සංවිධානවලට පරිසර ශක්‍යතා වාර්තා නැතිව, ටෙන්ඩර් කැඳවීම්වලින් තොරව කඩිමුඩියේ මේ සංවර්ධන ව්‍යාපෘතීන් පෞද්ගලික සමාගම්වලට ලබා දීමේ වුවමනාව නිසා තමයි නිසි විධියට පරිසර අධ්‍යයනය කරලා, මේ හානීන් සම්බන්ධව ගණනය කරලා, ඒ වෙන්න තිබෙන ඒවාට මූලික පියවර, ඒ හානිය වෙන්න කලින් ගන්නේ නැතිව ක්‍රියාත්මක කිරීම හරහා තමයි මෙවැනි තත්ත්වයක් මතු වෙලා තිබෙන්නේ කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ. ඒ අතරවාරයේ මම අවසාන වශයෙන් කියන්න කැමැතියි. විශේෂයෙන්ම මෙවැනි ස්වභාවික ව්‍යසනයන් ආවාම, සුනාමියක් ආවාම, ගං වතුරක් ආවාම, එහෙම නැත්නම් වියළි කාලගුණික තත්ත්වයක්, නියඟයක් වාගේ තත්ත්වයක් ආවාම රටේ ජනතාව, ශ්‍රී ලාංකික ජනතාව සියලු දෙනා එකට එකතු වෙලා ජාති කුල ආගම් භේද බලන්නේ නැතිව, පාට පක්ෂ භේද බලන්නේ නැතිව ඒ පීඩාවට පත් වුණු ජනතාවට සහනාධාර ලබා දීම සඳහා ඔවුන්ගේ උදව් ලබා දීම සඳහා ඉදිරිපත් වෙනවා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ අවසාන වශයෙන් දැන් කොස්ලන්ද ප්‍රදේශයේ ජනතාව මීරියබැද්ද ජනතාව මේ නාය යාම හරහා ඔවුන් අනාථ භාවයට පත් වුණාම සිරස මාධ්‍ය ජාලය, ඔවුන්ගේ සහන යාත්‍රාව අරගෙන විශේෂයෙන්ම සුනාමියේදී කළා වාගේ, පොළොන්නරුව නියඟයේදී කළා වාගේ, ගං වතුර ආපු වෙලාවේ කළා වාගේ පසුගිය ඉරිදා දවසේ ජනතාවගේ සහනාධාර එකතු කර ගෙන සිරස සහන යාත්‍රාව මීරියබැද්ද ප්‍රදේශයට ගියාම, රජයේ නිලධාරීන් ඒ සහන යාත්‍රාවට බාධා කිරීම සම්බන්ධයෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. (බාධා කිරීම්) ඒ අසරණ අහිංසක ජනතාවට ආධාර උපකාර කිරීම සඳහා ඒ ද්‍රව්‍ය නිසි ලෙස බෙදා හැරීම සම්බන්ධව අපේ කනගාටුවත් මේ පළාත් සභාවේ කනගාටුවත් ප්‍රකාශ කරනවා. අවසාන වශයෙන් මම එක දෙයක් කියන්න කැමැතියි. (බාධා කිරීම්)

[සභාවේ ඝෝෂා]

අවසාන වශයෙන් මට මේ සම්බන්ධව කාල වේලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, අනෙක් මාධ්‍ය ආයතනවලටත් ආරාධනා කරන්නය කියලා නැවත වරක් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සමඟ යම් යම් තොරතුරු ලබා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසුණා. එතැනදී ගරු සභාපතිතුමනි, මේ මොහොතේත් මාස හයකට පසුවත් වෙබ් අඩවිය යාවත්කාලීන කෙරිලා නැහැ. කිසිදු මන්ත්‍රීවරයකුගේ නාම ලේඛනයක් මේ වන විට යාවත්කාලීන වෙලා නැහැයි කියන එක ගරු සභාපතිතුමනි, ඔබතුමාට දන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. මම ඒ පිළිබඳව -

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ඒ පිළිබඳව කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මීට පෙර කථා කරපු එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ කථාව ආරම්භයේදී එතුමා ප්‍රකාශ කළා. මේ සභාව මාධ්‍ය වාරණයක් කරනවාය කියන එක. මම කොහොමත් ඒක අනුමත කරන්නේ නැහැ. මොකද, හේතුව අපි විවෘතව -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමා නැති වෙලාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම සභාව ආවරණය කරන්න සෑම මාධ්‍යකටම අපි අවසර දීලා තිබෙනවා. රජයේ සහ පෞද්ගලික සියලුම මාධ්‍යවලට අපි ආරාධනා කරලා තිබෙනවා මේ සභා රැස්වීම් පැවැත්වෙන දිනයට මෙම සභාවට ඇවිල්ලා නිවැරදි මාධ්‍ය ආවරණයක් දෙන්නය කියලා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි ගරු මන්ත්‍රීතුමා. සිරස මාධ්‍ය සමහර විට කිහිප දෙනෙක්ව විතරයි මේ මාධ්‍යයෙන් පෙන්වන්නේ. ඒකයි මන්ත්‍රීතුමන්ලාට පොඩි තරහක් තිබෙන්නේ. ඒකයි හේතුව. අනෙක් මන්ත්‍රීවරු කෑ ගහන්නේ මන්ත්‍රීවරු දෙන්නයි තුන් දෙනයි පෙන්වන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඔබතුමා සිරස මාධ්‍ය ආයතනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් ඒ අයවත් පොඩ්ඩක් පෙන්වන්න. එතකොට මේ ප්‍රශ්නය ඉවරයි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගිය සතියේ ඔබතුමාව පෙන්නුවා. මම දැක්කා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. (බාධා කිරීම්) මීළඟට අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.22]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, අපේ දිස්ත්‍රික්කයේ, අපේ ආසනයේ සහෝදර ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ඉතාම කාලෝචිත මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් පළ කරන්නට ලැබීම පිළිබඳව, විශේෂයෙන්ම ස්වභාවික උවදුරු හා කාලගුණික විපර්යාසයන් නිසා බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර කියන දිස්ත්‍රික්ක තුනේ ජීවත් වන ජනයාව ඒ තත්ත්වයෙන් වළක්වා ගැනීම සඳහා, ආපදා සඳහා මුහුණ දීමට වෙනම ඒකකයක් පිහිටුවීම සම්බන්ධයෙන් කරන යෝජනාව ඉතාමත්ම ඵලදායී යෝජනාවක් බවට පත් වන්නේ මෙවර අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා 77 ක් ඇතුළේ මේ ගංවතුර පාලනය සම්බන්ධයෙන් කිසිදු යෝජනාවක් අයත් නොවන නිසා මේ බස්නාහිර පළාතට මේ සම්බන්ධයෙන් විශේෂ වගකීමක් හා යුතුකමක් ඉෂ්ට කරන්න තිබෙන බව විශ්වාස කරනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවල 41(1) යෝජනාවේ පමණක් යන්තම් සඳහන් වෙන කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් යම් කාර්යභාරයක් කිරීමට මිලියන 1500 ක් වෙන් කිරීම හැරුණු කොට කළුතර, රත්නපුර, දකුණු පළාතේ ආදී ගං වතුරෙන් සිදු වන හානි සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරන ආයතනයකට මූල්‍ය ප්‍රතිපාදනයක් මේ අයවැයෙන් වෙන් වෙලා නැති තත්ත්වය තුළ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වැදගත් වෙනවා.

මෙහි විශේෂ තත්ත්වය තිබෙන්නේ, මේ අවුරුද්දේ මේ තත්ත්වයට වැඩිපුරම ආරම්භයේදී මුහුණ දීපු ආසනය, දිස්ත්‍රික්කය තමයි කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රදේශය. බුලත්සිංහල ප්‍රදේශය. පළමුවැනි නාය යාම වාර්තා වෙන්නේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්තෙන්. ඒ ප්‍රදේශයේ පවුල් ගණනාවක් නාය යාමට ලක් වුණා. ගංවතුරෙන් හානියට පත් වුණා. බුලත්සිංහල, මතුගම, වලල්ලාවිට ආදී ප්‍රදේශවල මේ තත්ත්වයට මුහුණ දුන්නා. ඒ නිසා නිරන්තරයෙන් ඇති වන වර්ෂාපතනය නිසා මේ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව විශාල හානිදායක තත්ත්වයන්වලට විටින් විට පත් වෙනවා. මේ අවුරුද්දේ පස් වැනි මාසේ තිස් එක් වැනිදා ඉඳලා හය වැනි මාසේ හතර වැනිදා වන තෙක් උපරිම වර්ෂාපතනය මිලි මීටර් 303 ක් වාර්තා වෙන්නේ කළුතර දිස්ත්‍රික්කයෙන්. මේ වර්ෂාපතන තත්ත්වය තුළ, මේ කාල සීමාව තුළ විපතට පත් වුණු පවුල් සංඛ්‍යාව 7500 ක් වන කොට පුද්ගලයෝ 27,243 ක්. පුද්ගලයෝ 22 ක් මරණයට පත් වෙනවා, කළුතර දිස්ත්‍රික්කයත්, කොළඹත්, ගම්පහත් කියන මේ බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුන තුළ. ඒ නිසා

මේ යෝජනාවේ වැදගත්කම මත පිහිටලා, මේ සංවර්ධන ව්‍යාපෘති ඉෂ්ට කිරීමේදී යම් පාලනයකට ඇති කර ගැනීමේ වගකීම තිබෙන්නේ මේ ආයතනවලට. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරු දශක ගණනාවක ඉඳලා නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුවා. මේ අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති සහ අවිධිමත් ගං වතුර පාලනය නිසා ඇති වන තත්ත්වය මැඩ පවත්වන්න ඕනෑය කියලා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇන්ටන් නානායක්කාර මහත්මයා අවස්ථා ගණනාවක තමන්ගේ නිර්දේශ ලිපි මේ ආණ්ඩුවටත්, ඒ අදාළ දෙපාර්තමේන්තු හරහා ඉදිරිපත් කරනු ලැබුවා. මේ කොළඹ නගරය ගං වතුරෙන් යට වීම අඩු කර ගැනීම සඳහා වැව් හෑරීම, කෘතිම ජල රඳවන ඉදි කිරීම කියන එක ඵලදායී විසඳුමක් නොවෙන බව. නමුත් මේ තත්ත්වය මේ වාරිමාර්ග අධ්‍යක්ෂවරයාගේ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ තත්ත්වය, ඒ නිර්දේශ සලකන්නේ නැතිව දිගින් දිගටම මේ තත්ත්වයන් සිද්ධ වීම මේ ජලය පාලනය කිරීම සඳහා හේතුවක් නොවන බව පැහැදිලි වෙනවා. මේ සම්බන්ධයෙන් කථා කරන කොට මධ්‍යම අප්‍රිකා ජන රජයේ ජීන් බිඩෙල් බොසෙන්සා කියන අධිරාජ්‍යා තමන්ගේ අසීමිත බලය යොදා ගෙන කටයුතු කිරීම නිසා අවසානයේ ඒ රටට, ඒ ප්‍රදේශයට විශාල හානි සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ලංකාවේත් තමන්ගේ අසීමිත බලය උපයෝගී කර ගෙන යම් රාජ්‍ය නිලධාරියෙකු මේ කොළඹ නගරයේ ගං වතුර පාලනය සඳහා කෘතිම ජලාශ ඉදි කරනවා නම්, කෘතිම වැව් ඉදි කරනවා නම් එහි අනිසි ප්‍රතිඵලය විනාශකාරී අත්හදා බැලීමක් දක්වා දිවෙන බව මේ ඇන්ටන් නානායක්කාර කියන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සඳහන් කරලා තිබෙන අවස්ථාවක මේ යෝජනාව එන්නේ.

ගරු සභාපතිතුමනි, ජල පෝෂක ප්‍රදේශ ඉතාමත්ම දරුණු විධියට වැහිලා ගිහිල්ලා තිබෙන තත්ත්වය තුළයි අද ගංවතුර ක්‍රම ක්‍රමයෙන් පාලනය වෙන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද ජල පෝෂක ප්‍රදේශ ගොඩ කරලා, ඒ ගොඩ කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ නැති තත්ත්වයක් තුළයි අද ගං වතුරෙන් හානියට පත් වන තැනක තමයි කොළඹ, කළුතර, ගම්පහ දිස්ත්‍රික්ක තුන තුළ තිබෙන්නේ. කුමන ආයතනය ද, කුමන රාජ්‍ය ආයතනය ද බස්නාහිර පළාත් සභාවේ මොන අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනය ද භූ විෂමතා ලක්ෂණ අනුව, වර්ෂාපතනය අනුව පස්, ගල් හා වැලි අතරින් ජලය කාන්දු වීම පිළිබඳව ගණනය කරමින්, වැසි වතුර ගලා යාම සම්බන්ධයෙන් භූගත ජල මට්ටම් ආදිය ගැන තාක්ෂණික වශයෙන් සැබෑ තොරතුරු ඒකරාශී කරලා මේ ගංවතුර පාලනය කිරීම සහ නාය යාම සම්බන්ධයෙන් තාක්ෂණික වැඩ පිළිවෙළකට ගිහිල්ලා තිබෙන්නේ. ඒ කිසිම ආයතනයක් රාජ්‍ය මට්ටමින් වේවා, පළාත් මට්ටමින් වේවා මේ කාරණයට අත තියලා නැහැයි කියන එකයි මගේ විශ්වාසය. එහෙම නැත්නම් ඉතාමත් ගෞරවයෙන්, ආදරයෙන් ඉල්ලා සිටිනවා, බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් සුවිශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ, කඳු සහිත ප්‍රදේශයක ජීවත් වන අගලවත්ත, වලල්ලාවිට ඒ වාගේම මතුගම, බුලත්සිංහල ආදී ප්‍රදේශවල බණ්ඩාරගම ආසනයේ, කළු ගඟ ආශ්‍රිතව ජීවත් වන අපේ ප්‍රදේශයේ උදවිය වෙනුවෙන් මේ තාක්ෂණික ඇගයීම සිදු කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් මූල්‍ය ප්‍රතිපාදන අපේ සමාජ සුභ සාධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හරහා හෝ වෙනත් සුදුසු අමාත්‍යාංශයක් හරහා මේ සම්බන්ධයෙන් යොමු කරන්නය කියන ඉල්ලීම ගෞරවයෙන් කරනවා.

දැන් පසුගිය දවසක කොස්ලන්ද ප්‍රදේශයේ සිදු වුණු තත්ත්වය පිළිබඳව ගත්තත්, මේ තාක්ෂණික ඇගයීමක් නැතිකමත්, නිවැරදි පරිදි දත්ත ගලා නොයාමත් ඒ අදාළ නිලධාරීන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය 2006 අවුරුද්දේ කරපු සමීක්ෂණය තුළ කොස්ලන්දෙන් ඉවත් කරන්නය කිව්වා. 2011 දී නැවතත් කිව්වා. ඔවුන් දක්වනවා, එන්.බී.ආර්. එක නැවත දැනුම් දෙනවා කළුතර දිස්ත්‍රික්කයේ සුවිශාල ප්‍රදේශයක්, විශේෂයෙන් බණ්ඩාරගම ආසනයේ ඉහළ කොටස, බුලත්සිංහල ආසනය, මතුගම ආසනය, අගලවත්ත ආසනය කියන ආසන හතර. මේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අවදානම් කලාප බවට පත් වෙලා තිබෙන වෙලාවක මම ගෞරවයෙන් ඉල්ලනවා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිත වැදගත් යෝජනාවක් නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාව ප්‍රමුඛස්ථානයක් ලබා දීලා ක්‍රියා කරමින් ඒ ඒකකයක් පිහිටුවීමත්, තාක්ෂණික ඇගයීමක් මත මේ දිස්ත්‍රික්ක තුන තුළ ඇගයීමක් කරන්නත් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මේ යෝජනාව සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 05 ක කාලයක් තිබෙනවා. ඔබතුමියගේත් මංගල කථාව ද අද?

[අ.භා. 01.29]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මම කථා කිහිපයක් කළා. මූලාසනයේ සිටින අපගේ ගරු සභාපතිතුමාගෙන්ද, මහ ඇමතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයෙන්ද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්ද අවසර ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපෙන් අවසර ඉල්ලන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඕනෑ නැහැ. මූලාසනයෙන් අවසර ගන්න කෝ. ඇති.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ස්තුතියි අඩුපාඩු කියලා දුන්නාට. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට. බොහොම ස්තුතියි ඔබතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලන්නකෝ ඒ මන්ත්‍රීතුමිය කොපමණ හොඳද කියලා. ඔබතුමාට ස්තුති කළා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ලලිත් එල්ලාවල අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධව අපි පළමුවෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, අද කාලයේ තිබෙන ප්‍රධාන පෙළේ ගැටළුවක් තමයි මේ පරිසර හානි, පරිසර දූෂණය නිසා ඇති වන මේ ආපදා තත්ත්වයන් ගැන. ඒ ගැන අපි කථා කළොත් එහෙම ලංකාවේ විශේෂයෙන්ම ගන්න ඕනෑ ආපදා වර්ග පහක් තිබෙනවා. ඒ තමයි, ගං වතුර, නාය යාම, නියඟය, සුළි සුළං, වෙරළ ආශ්‍රිත ආපදා කියලා ආපදා පහකට බෙදෙනවා. ඒකෙන් අපට වැඩිපුරම බලපාන්නේ ගංවතුර සහ නියඟය. නාය යාම සාමාන්‍ය විධියට අපට බලපානවා. නමුත් ගංවතුරයි නියඟයයි තමයි වැඩියෙන්ම බලපාන්නේ. ඒකේදී ගංවතුර පිළිබඳව අපි බස්නාහිර පළාතක් විධියට යෝජනාවක් ගේනවා. ගංවතුරක් දැන් අපට නවත්වන්න බැහැ. සමහර හානි නතර කර ගන්න බැහැ. පෙර දැනුවත් වීම ඉතාම වැදගත්. ගංවතුර තත්ත්වයන් මෙන්න මේ කාලේදී ඇති වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර කියන්නේ තෙත් කලාපීය ප්‍රදේශයක්. ඒකේදී ගංවතුර ඇති වීමට ප්‍රධානම හේතුවක් වෙනවා මෝසම් වැසි සමය. නිරිත දිග මෝසම් වැසි මැයි සිට සැප්තැම්බර් දක්වාත්, ඊසාන දිග මෝසම් වැසි දෙසැම්බර් සිට පෙබරවාරි දක්වාත් පවතිනවා. බස්නාහිර සහ සබරගමුව පළාත්වලට ගංවතුර තත්ත්වයන් ඇති වීමට හේතු වෙනවා. අපි ගං වතුරට පෙර සූදානමක් වෙනවා නම් මම හිතන්නේ ගං වතුරෙන් වෙන හානි අවම කරගන්න, අඩු කර ගන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම ගං වතුරවලට ප්‍රධානම හේතුවක් තමයි රොන් මඩ අයින් නොකිරීම. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාත් සභාව විධියට දැනට අපි කර ගෙන යනවා. අපි රොන් මඩ අයින් කරලා, කාණු පද්ධතිය මීට වඩා වැඩි දියුණු කළොත් - මම හිතන්නේ මේ වසරේ නම් ගොඩක් ගංවතුර ගම්පහ දිස්ත්‍රික්කයට අඩු වෙලා තිබෙනවා, මේ රොන් මඩ අයින් කිරීම සහ කාණු පද්ධතිය සුද්ධ කිරීම තුළින්. අපි ඉල්ලා සිටිනවා, තවත් මේක හොඳින් ක්‍රියාකාරී තත්ත්වයකට ගන්නය කියලා.

ඒ වාගේම මෑතකදී සිදු වුණු විශාල හානියක් තමයි අපේ කොස්ලන්ද හල්දුම්මුල්ලේ මීරියබැද්දේ නාය යෑම. නාය යෑම ගැන කථා කළොත් එහෙම අපි අද තේ වගා කරනවා. ප්‍රමිතියක් නැහැ. අපි ඉස්සර තේ වගා කළේ ප්‍රමිතියකට. ඒ කියන්නේ තේ වගා කරන කොට හැම තිස්සේම විශාල ගස් වගා කරන්න පුරුදු වෙලා තිබුණා. කඳුකරයේ නාය යාම නතර කිරීමට. නමුත් අද එහෙම සිදු වීමක් වෙන්නේ නැහැ. ලොකු ගස් වගා කරන්නේ නැතිව තේ වගාව කිරීම තුළ නාය යාම සිදු වෙනවා. අපි ඉස්සර මේකට සිංහල භාෂාවෙන් අපි කථා කරන කොට කිව්වා, දිය හෙනය කියලා. ඒ කියන්නේ නාය යාමට සිංහල වචනයක් හැටියට භාවිතා කළේ දිය හෙනය. ඇත්තටම අපට අර මාධ්‍ය වර්තාවකත් යනවා ඇහුණා දිය ශබ්දයක් කියලා. ඒ කියන්නේ ලොකු ගස් වගා කිරීම නැති වීම තුළ නාය යාම සිද්ධ වෙනවා කඳුකරයේ. ඉතින් අපි ඉල්ලා සිටිනවා. තේ වගා කරන කොට විශාල ගස් පැළ කිරීම තුළ ගොඩක් වෙලාවට නාය යාම අඩු වීමට හේතු වෙනවා.

ඒ වාගේම බස්නාහිර පළාත විධියට මම යෝජනාවලියක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපේ පරිසර හානිවලට අපි

මොකද කරන්නේ? මොනවාද? ගත යුතු ක්‍රියාමාර්ග කියලා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානයට ලක් කරලා, මේවාට මොනවාද? කරන්න පුළුවන් කියන එක සොයා බලන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. ව්‍යසනය කලින් හඳුනාගැනීම සහ නවීන තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම. ඒ වාගේම ව්‍යසන සිදු වූ පසු ගනු ලබන ක්‍රියාමාර්ග. ව්‍යසන පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීම හා ව්‍යසන සඳහා බලපාන මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම. රජයේ සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේදී පරිසරය සැලකිල්ලට ගැනීම. රජයේ ආපදා ක්‍රම උපාය සිතියමක් සකස් කිරීම. බස්නාහිර පළාත් සභාව තුළ අවධානම් ප්‍රදේශ පිළිබඳ තක්සේරු වාර්තාවක් සකස් කිරීම. ඒ වාගේම අපට ලොකු ගැටළුවක් තිබෙනවා. ජලය ආරක්ෂා ක්‍රමවේදය ජනතාව දැනුවත් කිරීම. මොකද, ගොඩක් අයට, අපට බලපාන ගැටළුක් තමයි ජලය. ඒ නිසා ජලය ආරක්ෂා කර ගන්නේ කොහොමද කියලා ජනතාව දැනුවත් කිරීම. ශ්‍රී ලංකාවේ වියළි ප්‍රදේශයට අයත් සාම්ප්‍රදායික ජල එක් රැස් කිරීමේ වැව් පද්ධතිය සකස් කිරීම සහ තෙත් කලාපයේ වගුරු බිම් අතර මේවා රැක ගැනීමට කාලගුණ වෙනස්කම් අවම කර ගැනීමට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම ඔක්සිජන් වැඩියෙන් පිට කරන ශාක වර්ග පැළ කිරීම. ගංගා ආශ්‍රිත, ඇළ දොළ ආශ්‍රිත විශාල ගස් පැළ කිරීම බාදනය අඩු වීමට හේතුවක් වෙනවා. පරිසරය සුරකිමු තේමාව යටතේ පාසල් දරුවන් සිට වැඩිහිටියන් දක්වා දැනුවත් කිරීම. මොකද, ගොඩක්ම පරිසර හානි සිදු වෙන්න ප්‍රධානම හේතුව මනුස්සයා පරිසරයත් එක්ක කරන ගනුදෙනුවත් එක්ක. ඒ නිසා දරුවන්ගේ සිට පාසල් අධ්‍යාපනය සිට වැඩිහිටියා දක්වා පරිසරය සුරැකීම කියන තේමාව යටතේ පරිසරය රැක ගැනීම කිරීම. ඒ වාගේම ක්ෂණික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය කාලය නම් අවසන්. තව විනාඩියක් කථා කරන්න කෝ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

තව එකක් ඉදිරිපත් කරන්නම්. ක්ෂණික -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, සභාවේ ගණ පූරණය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***අ.භා. 01.35 ට, සභාවේ ගණපූරණය නොමැති බව එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, කැඳවීම් සීනුව නාද කරන ලදුව පසුව ගණපූරණය ඇති විය.***

*At 01.35 p.m. as Hon. S.M. Marikkar, Member pointed out that there was no quorum in the Council sitting, division bells were ordered to be rung and subsequently the quorum was formed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කථා කරන්න. ගණ පූරණය සම්පූර්ණ වී තිබෙනවා. තව විනාඩියක් ඔබතුමියට කාලය දෙන්නම්.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒ වාගේම ක්ෂණික ආපදා තත්ත්වයන් බෙදා හැරීමේ ක්‍රමවේදයක් ලෙස 1999 ජනවාරි 30 වන දින ඩයලොග් ආයතනය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ප්‍රථම හදිසි ආපදා අනතුරු හැඟවීමේ පද්ධතිය හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම දැන් ව්‍යසනයක් වෙන්න පෙර ඩයලොග් ආයතනයත් එක්ක එකට එකතු වෙලා මේක කරන නිසා අපට SMS එකක් එනවා. ඒ වාගේම අපි ඉල්ලා සිටිනවා, ක්ෂණිකව ආපදාවක් වෙන කොට මිනිස්සුන්ව දැනුවත් කරන ක්‍රමවේදයක්. අනික් ආයතන එක්ක හරි කථා කරලා ඒ වාගේ ක්‍රමවේදයක් අපට හඳුන්වා දෙන්නය කියලත් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අවසාන වශයෙන් අපි කියනවා. කනගාටුවෙන් කියන්නේ. වියළි කලාපය තවදුරටත් වියළි වන්නත්, තෙත් කලාපය තවදුරටත් තෙත් වන්නත් මිනිසා විසින් ජල මූලාශ්‍ර දූෂණය කිරීම හේතුවෙන් තවදුරටත් මෙම තත්ත්වය උග්‍ර වන බැවින් ඇති කිරීම ජලය හෝ ජල හිඟය යන අවස්ථා දෙකේ ඇති වන ඩෙංගු රෝගය පැතිර යාම සහ ආහාර හිඟය. ඒ කියන්නේ නිතර ගං වතුර ගැලීම සිට අපට ඩෙංගු රෝගය ද, ජලය නැති වීම තුළ ආහාර හිඟය ද ඒ කියන්නේ වගාවල් වගා කර ගන්න බැරි නිසා අපට ආහාර හිඟයක් ද ඇති වෙනවා. මේවා ගැන සැලකිලිමත් වෙමින් බස්නාහිර පළාතේ මෙහෙයුම් ඒකකයක් හදන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් සියලුම දෙනාට අපි තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 01.37]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, මුලින්ම කොස්ලන්ද, හල්දුම්මුල්ල, මීරියබැද්ද ප්‍රදේශය නාය යෑමෙන් විපතට පත් වුණු ජනතාවට සහ ඒ පවුල්වලට අපේ පක්ෂයේ ශෝකය, කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි. මේ යෝජනාව ගත්තොත් මේ අවස්ථාවේ සංවේදීකම සලකලා, ඉතාම මානුෂීය සහ සදාචාරමය යෝජනාවක් වුණත් පරිපාලනමය වශයෙන් ප්‍රතික්ෂේප කරන්න ඕනෑ යෝජනාවක්. මොකද, දැන් මේ කොස්ලන්දේ නාය යාමට පෙර, විශේෂයෙන් බස්නාහිර පළාතේ මෙවැනි ස්වභාවික ආපදාවන් ගණනාවක් සිද්ධ වුණා. හැමදාම මැයි මාසයේදී, ජූනි මාසයේදී අපේ ප්‍රදේශයේ මේ දිස්ත්‍රික්ක තුනේ, විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුර ගලනවා. නාය යනවා. අවසන් නාය යෑමෙන් 13 දෙනෙකුගේ ජීවිත නැති වුණා. මේ වැසි කාලයේදීත් මේ වන කොට බණ්ඩාරගම ප්‍රදේශයේ අටළුගම ගෙවල් හතරක් තර්ජනයට ලක් වෙලා, ඒ ජනතාව ආරක්ෂිත ස්ථානයක පදිංචි කරලා තිබෙනවා. ඒ වාගේම අගලවත්ත, මතුගම, බුලත්සිංහල ආසනය තර්ජනයට ලක් වෙලා තිබෙනවා. අපි මෙවැනි ව්‍යසනයක් කොහේ හරි වාර්තා වුණාට පස්සේ අර වැස්සට වඳුරෝ ගෙවල් හදන්නා වාගේ අපි හැමදාම මෙවැනි යෝජනා සාකච්ඡා කරලා තිබෙනවා. දැන් මේක පුරුද්දක් වෙලා තිබෙන්නේ. රටේ මොකක් හරි සිද්ධියක් වුණාට පස්සේ ගරු සභාපතිතුමනි, ආණ්ඩුවෙන් දානවා කොමිසමක්. විශේෂ ජනාධිපති කොමිසම. කොමිසමත් නැහැ. කොමිසමේ වාර්තාවට සිදු වුණු දෙයකුත් නැහැ. ගත්ත පියවරත් නැහැ.

ඒ වාගේම තමයි මොකක් හරි ආපදාවක් වුණාට පස්සේ කමිටුවක් දානවා. හරියට අර ටී.බී. ඒකනායක මැතිතුමාගේ සපත්තු දෙකට කමිටුවක් දැම්මා වාගේ. කමිටුවට වුණු දෙයකුත් නැහැ. වාර්තාවත් නැහැ. ගත්ත ක්‍රියාමාර්ගයකුත් නැහැ. දැන් මෙවැනි යෝජනා අපි සම්මත කර ගත්තාට ඇත්තටම ගත්තොත් එහෙම මෙවැනි යෝජනා පිළිබඳව අපි සලකා බලන්න තිබුණේ මීට කලින්. ඒ විතරක් නොවෙයි. දැන් ඇත්තටම කොස්ලන්ද ආදර්ශයට ගන්නවා නම් ඔබතුමා දකින්න ඇති පත්තරවල. 2005 සහ 2011 දී ඒ අදාළ ආයතන මගින් අනතුරු ඇඟවීමක් කළා. මේ සිදුවීම ආරංචි වුණාට පස්සේ මේ සම්බන්ධයෙන් වගකීම තිබෙන මහින්ද අමරවීර ඇමතිවරයා මාධ්‍යවලට ඇවිල්ලා මොකක්ද කිව්වේ? ඔහු කිව්වා, ජනතාවට අවදානම පිළිබඳව දැනුම් දීලා තිබෙනවා. ඔවුන් ගියේ නැහැයි කියලා. ඒ පොළොව දෙදරලා, ඒ නාය යාම සිදු වුණත් ඒ පිළිබඳව ආණ්ඩුව සංවේදී වුණේ නැහැ. කිව්වාට වැඩක් නැහැ. කිව්වා කියලා කොහේ පදිංචි කරවන්නද? ඒ ජනතාවට ඉඩම් දෙන්න ඕනෑ. විකල්ප ජීවන වෘත්තීන් දෙන්න ඕනෑ. එහෙම නැතිව කිව්වාට වැඩක් නැහැ.

හැබැයි, තමන්ගේ දේශපාලන බලය දෙදරීමට ලක් වෙන කොට ඒකට ආණ්ඩුව සංවේදීයි. තමුන්නාන්සේලාට මතක නම්, ඌව පළාත් සභා ඡන්දය ඔන්න මෙන්න කියලා අපේ රටේ ඇමති මණ්ඩලය 107, 109 වුණා. ප්‍රභා ගනේෂන් සහ දිගම්බරන් මන්ත්‍රීවරුන්ට නියෝජ්‍ය ඇමතිකම් දුන්නා. ඇයි? ඌව පළාත් සභා මැතිවරණය කිට්ටු කරලා ආණ්ඩුවට තමන්ගේ දේශපාලන පොළොව දෙදරනවා කියලා දැනෙන්න පටන් ගත්තා. ඒකට සංවේදී වුණා. ඒකට දුන්නා ඇමතිකම. ඒ විතරක් නොවෙයි ඌව පළාත් සභාවේ ඇමතිකම් බෙදා ගන්න කොට තොණ්ඩමන් මහත්තයාගේ පක්ෂයෙන් පොඩි කවල් එකක් ඇද්දා. ඔන්න පළාත් සභාවේ බලය ගිලිහෙයි කියලා ඒ සංවේදීකම ආණ්ඩුවට තිබුණා. ඒ පොළොව දෙදරීම ආණ්ඩුවට දැනෙනවා. හැබැයි, මේ ජනතාවගේ පොළොව දෙදරලා, මේ මිනිස්සු නාය ගිහිල්ලා තමන්ගේ ජීවිතය නැති වෙනකල් ඒ සංවේදීකම තමුන්නාන්සේට තිබුණේ නැහැ. මොකක්ද කළේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය? ගිහිල්ලා AGA ලාට කිව්වා. AGA ලියුමක් යවනවා අයින් වෙන්නය කියලා. එපමණයි. කරපු දෙයක් නැහැ. අපි කියන්නේ, ආපදා කළමනාකරණයට මෙහෙම මුහුණ දෙන්න බැහැ. අපේ රටේ තිබෙන්නේ මොකක්ද? අපේ රටේ තිබෙන්නේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක්, කළමනාකරණය කරන්න. ආපදාවක් වුණාට පස්සේ එතැනට ගිහිල්ලා මොනවා හරි වැඩ ටිකක් කරන්න. ඒක නොවෙයි වැදගත් වෙන්නේ. ආපදා වැළැක්වීමේ අමාත්‍යාංශයක් ඕනෑ. ආපදා වළක්වන්නයි ඕනෑ. ඒකටයි පුරෝකථනය කරලා සැලසුමක් හදන්න ඕනෑ. ඒකට ඕනෑ කරන්නේ මොකක්ද? ඒකට ඕනෑ කරන්නේ මධ්‍යම ආණ්ඩුවේ මැදිහත්වීම. මේ පළාත් සභාවලින් කොහේ හරි නාය ගියට පස්සේ ඌව පළාතේ එකක් හදයි. මධ්‍යම පළාතේ එකක් හදයි. බස්නාහිර පළාතේ එකක් හදයි. මොකක්ද කරන්න පුළුවන්? අඩු ගණනේ තමුන්නාන්සේලා පළාත් සභාවලට පක්ෂපාතී අය. පළාත් සභා වෙනුවෙන් ජීවිත පූජා කරපු මන්ත්‍රීවරුන්ගේ දියණියන් ඉන්න පළාත් සභා. පසුගිය කාලයේ පළාත් සභාවල සමාජ සේවා අමාත්‍යාංශයට

තිබුණා බලයක් මෙවැනි ආපදාවක් වුණාට පස්සේ ආධාර කරන්න. ඒක ගත්තා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන්. තමුන්නාන්සේලා ඒකට අත ඉස්සුවා. අත් දෙකම උස්සලා සම්මත කළා ඒක. දිවි නැගුම පනත සම්මත කළා. දිවි නැගුම පනතෙන් මෙවැනි අවස්ථාවලට මැදිහත් වෙන්න පළාත් සභාවට තිබෙන අවස්ථාව අහිමි කළා. ඒකට අත් දෙකම උස්සලා අත ඉස්සුවා. ඒවා ඔක්කොම දීලා, අඩු ගණනේ අපට කරන්න පුළුවන් ටිකත් දීලා මධ්‍යම ආණ්ඩුවට, ඒවායෙන් බැසිල් රාජපක්ෂ මහත්තයාගේ අමාත්‍යාංශය පෝෂණය කරන්න අත උස්සලා දැන් ඇවිල්ලා කියනවා, කමිටු දාන්නය කියලා. මොකක්ද? කරන්න පුළුවන්. මේකට ඕනෑ කරන්නේ ඒක නොවෙයි. ඕනෑ කරන්නේ, මධ්‍යම ආණ්ඩුවේ මැදිහත්වීමක්. ඒකට පළාත් සභා සම්බන්ධ කර ගන්න, ප්‍රාදේශීය සභා සම්බන්ධ කර ගන්න. හැබැයි, ඒකට එක ආයතනයක් ඕනෑ. මෙවැනි ආපදා එහෙම නැතිව වළක්වන්න බැහැ. දැන් අපි දන්නවා, අධ්‍යාපන අමාත්‍යාංශය තිබෙනවා. පළාත් පාසල්. මධ්‍යම ආණ්ඩුවේ පාසල්. රෝහල් තිබෙනවා. පළාත් රෝහල්, මධ්‍යම ආණ්ඩුවේ රෝහල්. පාරවල් තිබෙනවා, මධ්‍යම ආණ්ඩුවේ පාරවල්, පළාත් පාරවල්. ආපදා කොහොමද එහෙම කරන්නේ. ලොකු නාය යෑම් මධ්‍යම ආණ්ඩුවේ නාය යෑම්. පොඩි නාය යෑම් පළාත් නාය යෑම්. ලොකු ගංවතුර මධ්‍යම ආණ්ඩුවේ ගං වතුර. පොඩි ඒවා පළාත් ගංවතුර. එහෙම කරන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ. ඒකට ඕනෑ කරනවා මධ්‍යම ආණ්ඩුවේ සෘජු මැදිහත්වීමක්. ඒකට අමාත්‍යාංශ ගණනාවක් ළං කර ගන්න ඕනෑ. පාවිච්චි කරනවා නම්, විධායක බලය පාවිච්චි කරන්න ඕනෑ ඔය වාගේ දේවල්වලට. බලය ගොඩ ගහ ගන්න නොවෙයි. මේ වාගේ ජනතාව ආපදාවට පත් වෙන කොට අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරලා කළමනාකරණය කරලා, බලය මෙහෙයවන්න. ඒක කරන්නේ නැතිව මෙවැනි යෝජනා කළාට වැඩක් නැහැ.

ගරු සභාපතිතුමනි, අපට පුළුවන් මෙවැනි යෝජනා ගෙනැල්ලා, මේ සංවේදීකම පාවිච්චි කරලා, ඕනෑ නම් මේ ඔන් ලයින් කැසිනෝ පිළිබඳ කථාව යට යවන්න පුළුවන්. පළාත් සභාවේ. හැබැයි ඒක නොවෙයි වැදගත්කම තිබෙන්නේ. මේකට ජාතික වැඩ පිළිවෙළක් ඕනෑ. ඒකට පළාත් සභාවේ යම් කාර්යභාරයක් තිබෙනවා නම්, පළාත් සභාව දායක කර ගන්න. මේකේ කමිටුවක් හැදුවාය කියලා වැඩක් වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි මෙවැනි ආපදාවක් වුණාට පස්සේ රට ටිකක් භය වෙන්න ඕනෑ. ඇයි? දැන් සුනාමිය ආවා. සුනාමිය ආවාට පස්සේ ලොකු අරමුදලක් හැදුවා. හෙල්පින් හම්බන්තොට. සුනාමි අරමුදල. ලොකුවට හැදුවා. මොකද වුණේ? වංචා කළා. සුනාමි හොරා කියලා පාරවල්වල ගහන්න පටන් ගත්තා. දැන් හෙල්පින් හල්දුම්මුල්ල හදලා ඒ මුදල්වලට මොකද වෙන්නේ කියලත් ජනතාව අවධානයෙන් ඉන්න ඕනෑ. එහෙම නැත්නම් පස්සේ කාලයක දැන් ඉන්න ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට කියන්න සිද්ධ වෙයි මගේ මොකක් හරි තිබුණා සම්බන්ධයක්. ඒ නිසා ඒ කාලේ ඒ තීන්දුව දුන්නේ නැහැ. මම ඒ ගැන කනගාටු වෙනවා කියලා. එහෙම කියන්න පුළුවන්. හෙල්පින් හම්බන්තොට හෙල්පින් හල්දුම්මුල්ල වෙන කොට. ඒ නිසා ඒවාත් පරිස්සම් වෙන්න ඕනෑ. ඒ නිසා මේ සංවේදීකම, මේ මානුෂිකකම පාවිච්චි කරලා අපි පාඩමක් ඉගෙන ගෙන, අත්දැකීමක් කර ගෙන ඇත්තටම තමුන්නාන්සේලා මධ්‍යම ආණ්ඩුවට යෝජනාවක් කරන්න ආපදා වැළැක්වීමේ අමාත්‍යාංශය බල ගන්වන්නය කියලා. ඒකට ඉතිරි අමාත්‍යාංශවල සහාය ගන්නය කියලා. අධ්‍යාපන, සෞඛ්‍ය අමාත්‍යාංශවල, පරිසර අමාත්‍යාංශයේ සහාය ගන්නය කියලා.

ඒ විතරක් නොවෙයි අඩු තරමේ දැන් අර ජාතික හෙළ උරුමයේ පාඨලී චම්පික රණවක ඇමතිතුමා. එතුමා වේදිකා ගානේ කියා ගෙන යනවා ඉදිරියේ එන දේශගුණික අවදානමක් පිළිබඳව. අනතුරක් පිළිබඳව. ඒවා ගණන් ගන්නේ නැහැ. ඒවා ගණන් ගන්නවා වෙනුවට කොහොම හරි බලනවා මේක අර කෝටි 150 වංචාව උඩට අර ගෙන, මොකක් හරි ගේමක් දෙන්න පුළුවන්ද කියලා. ඒවා නොවෙයි. රට ගැන හිතන්න. බලය පාවිච්චි කරන්න ඕනෑ, රට වෙනුවෙන්. රටේ ජනතාව වෙනුවෙන්. නාය ගියාට පස්සේ, මිනිස්සු වැළලිලා ගියාට පස්සේ දුක් වෙලා, නිකම් දුක් මුහුණ දා ගෙන ටීවී එකට දැම්මාට වැඩක් වෙන්නේ නැහැ. ආධාර එකතු කළාට වැඩක් වෙන්නේ නැහැ. දැන් මේවායෙන් පාඩමක් ඉගෙන ගන්නේ නැත්නම් අපි කොහාටද යන්නේ? ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි බස්නාහිර පළාත් සභාව විධියට, බස්නාහිර පළාතට විතරක් නොවෙයි මේ රටට වන ආපදා පිළිබඳව කල්පනා කරලා බලලා එවැනි බලයක් සහිත අමාත්‍යාංශයකට බලය පවරමු කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.45]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඇත්තටම කාලෝචිතයි. ඒ සම්බන්ධව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මට මෙතැනදී කියන්න තිබෙන්නේ. ඉස්සර අපි පුංචි කාලේ කියනවා, වෙලේ වතුර කියලා. දැන් කියනවා ගෙයි වතුර කියලා. ඇයි? මිනිස්සු වෙලේ ගෙවල් හදලා. මෙතැනදී ඇත්තටම පළාත් පාලන ආයතන යම් ප්‍රමාණයක් වග කියන්න ඕනෑ. මොකද හේතුව, මිනිස්සු ස්වභාවයෙන්ම හැම තිස්සේම වැරදි කරනවා. මිනිස්සු අනවසර ඉදි කිරීම් කරන කොට පළාත් පාලන ආයතන මේවාට පියවර ගන්නේ නැහැ. ඒ කියන්නේ වැරදි තැන්වල, හානියක් වෙන්න පුළුවන් තැන්වල ඉදි කිරීම් කරනවා. ඒ නිසා ඔබතුමා හරහා පළාත් පාලන ආයතනවලට දැනුම් දීමක් කරන්න, මේ බස්නාහිර පළාත තුළ අනවසර ඉදි කිරීමක් කරනවා නම් ඒ පළාත් පාලන ආයතන ඒවාට විරුද්ධ වෙන්න කියලා.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ විරුද්ධ පක්ෂය කථා කරන්නේ අර ඔක්කෝම කුණු බේර බොක්කෙන් යනවා වාගේ ආපදාවකදී මේ රජය කිසිම දෙයක් කරන්නේ නැහැයි කියලා. අපි දැක්කා. අපි කනගාටු වෙනවා. ඒ කොස්ලන්ද ව්‍යසනය වෙලාවේ ජනාධිපතිතුමා පැය ගණනකින් එතැනට ගියා. විපක්ෂ නායකතුමා පැය ගණනකින් ගියා. අපි ඒ ගැන සතුටු වෙනවා. නමුත් මොකුත් කරන්න බැහැයි කියන්න බැහැ. හැමදාම TV එකේ පෙන්වනවා. ත්‍රිවිධ හමුදාව, AGA මහත්වරු, GA මහත්වරු, අදාළ ආයතන එතැන මැරී ගෙන වැඩ කරනවා. මේ ස්වභාව දහමත් එක්කලා, මේ වැස්සත් එක්කලා ඒ කරන ක්‍රියාවලිය පරක්කු වෙනවා. තවමත් කරනවා. අත අරින්නේ නැහැයි කියනවා. ගරු සභාපතිතුමනි, කරන්නේ නැහැයි කියන්න බැහැ. මම දැක්කා. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කියනවා, කොළඹ සුදු වැන් ගෙනැල්ලා, ගෙවල් අයින් කරලා මේ බිල්ඩින් ගහනවා වාගේ ඒකත් කරන්න කියලා. එහෙම කරන්න බැහැ. සුදු වැන් එවලා නැහැ. එතකොට ඔයගොල්ලෝ කියන්නේ අර කොළඹ මුඩුක්කුවල ඉන්න අයට එහෙම්මම ඉන්න දෙන්න කියලාද? එතැන පාචනය, ක්ෂය රෝගය, ඩෙංගු ඔක්කොම හදන්න කියලාද? නැහැ. රට දියුණු වෙන කොට, රජයක් වශයෙන් ඒ මුඩුක්කු අයින් කරලා, ඒවා අයින් කරලා මහල් නිවාස, තට්ටු නිවාස හදලා, ජනතාවට හොඳ තත්ත්වයක් උදා කරන කොට ඒ කථා කරන්නේ ඉරිසියාවෙන්. ගරු සභාපතිතුමනි, මේ දවස්වල ඇමරිකාවේ Carolina ප්‍රාන්තයේ, Carolina නගරයේ හිම මීටර් 1 ½ ක්. ස්වභාව දහම එහෙම තමයි. ඉන්දියාවේ, පකිස්ථානයේ ගං වතුරෙන් 300 ක් මැරිලා. චීනයේ. මේ ගං වතුර කියන ඒවා ස්වභාව දහමට - අපට ඕනෑ විධියට එන්නේ නැහැ. ඊළඟට, ස්වභාවික විපත් අපට ඕනෑ විධියට එන්නේ නැහැ. කියලා එන්නෙත් නැහැ. දැන් බලන්න සුනාමි ආවා. ජපානෙත් යට වුණා. ජපානෙත් ගියා සුනාමියට. අපට නවත්වන්න බැහැ. නමුත් ලංකාව සුනාමි පාලන ඒකකයක් ඇති කරලා, සැරෙන් සැරේ ඒක ක්‍රියාත්මක කරනවා. ජනතාවට දැනුම් දෙනවා. මේකෙන් වැළකෙන්නේ මෙහෙමයි කියලා, රජය මග ඇරලා නැහැ.

ගරු සභාපතිතුමනි, මෙතැනදී අපි සතුටු වෙන්න ඕනෑ. රජයක් වශයෙන් විශාල කටයුත්තක් කරන්න ඕනෑ. අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා, කොළඹ කෝටිපතියන්ට සංවර්ධනය කරනවාය කියලා. අර දියත පාර්ක් එකට ගියාම ඉන්නේ කෝටිපතියෝද? එක රැයකට ලක්ෂ ගණනක් සෙනඟ ඉන්නවා. කොළඹ ජනතාව සතුටු වෙනවා. ආරක්ෂක ලේකම්තුමා, ජනාධිපතිතුමා, බැසිල් රාජපක්ෂ මැතිතුමා මේවා ඇති කරලා තිබෙන්නේ ජනතාවට සතුටු වෙන්න. සාමාන්‍ය ජනතාවට. දවසට වාහන 15,000 ක් යනවා කටුනායක - කොළඹ අධිවේගී මාර්ගයේ. ඔක්කොම යන්නේ ප්‍රාඩෝද? ඔක්කොම යන්නේ පැජරෝද? මගේ ගේ ළඟිනුත් යනවා. සාමාන්‍ය වැන් යනවා. පුංචි කාර් යනවා. ඔබතුමා ඒක වැරදියි. කොළඹ - මීගමුව අධිවේගී මාර්ගයේ යන බස් රථවලට සෙනග පිරෙන නිසා කොළඹ - මීගමුව පාරේ සාමාන්‍ය පාරේ බස්වල සෙනඟ නැහැ. ඒවායේ යන්නෙත් කෝටි පතියෝද? ගරු සභාපතිතුමනි, මේ කුහකත්වය. මම අහගෙන අපේ ගරු මන්ත්‍රීතුමියක් කියනවා, ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර ව්‍යසනය අඩු වෙලා කියලා. ඇත්තටම අපි ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මම ඉන්නේ ගඟ අයිනේ. අර අත්තනගල්ල ඔයට මුත්‍රා කළත් අපේ ගෙවල් පැත්ත යට වෙනවා. ඒ තරමට ගං වතුර දානවා. අද බැසිල් රාජපක්ෂ මැතිතුමා, දඩුගං ඔය, අත්තනගලු ඔය පළල් කරලා මම හිතන්නේ ගං වතුර ගැලීම නවත්වලා තිබෙනවා. මට කියන්න දෙන්න. (බාධා කිරීම්) දැන් යට වෙන්නේ නැහැ. තිබෙනවා නම් දානවා. (බාධා කිරීම්) දැන් වැලි නැහැ දඩුගං ඔයේ. ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ, කැලණි ගඟ, කළු

ගඟ ඒ වාගේම ගංගා කිහිපයක් තිබෙන අපේ බස්නාහිර පළාත පිළිබඳව. ඒ නිසා ගරු සභාපතිතුමා මඟින් ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මීට වඩා සම්බන්ධ වෙලා. මේ ගඟ මුහුදට වැටෙන ආශ්‍රිතව විශාල ඇල වේලි කපලා ඒවා සංවර්ධනය කරන්නය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.51]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම ස්තූතිවන්ත වෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් පසුව අපේ පක්ෂ විපක්ෂ සියලු ගරු මන්ත්‍රීතුමන්ලා හරවත් විධියට මේ යෝජනාව පිළිබඳව කථා කිරීම ගැන. දැන් ඇත්තටම මම කාරණයක් දෙකක් කියනවා. අපේ එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ යෝජනාවට පිටින් කථා කරපු නිසා මතක් කරලා දෙන්නේ. විධිමත් සංවර්ධනය ගැන කථා කළා. ගරු සභාපතිතුමනි, විධිමත් සංවර්ධනය වුණේ අද නොවෙයි. එකට හොඳම උදාහරණය තමයි පානදුර මෝදරවිල ගොඩ කිරීම. එදා අසූ ගණන්වල මෝදරවිල ගොඩ කිරීමත් එක්ක අදටත් පානදුර නගරය යට වෙනවා. ඒත් එක්කම සමහරු කියනවා, කොළඹ රාජ්‍ය නිලධාරීන් ඉඳගෙන අවිධිමත් විධියට වැඩ කරනවා කියලා. අවිධිමත් විධියට නොවෙයි. අද වැව් කපන්න වෙලා තිබෙන්නේ, අද නගර කිට්ටුව වැව් හදන්න වෙලා තිබෙන්නේ එදා අවිධිමත් විධියට ගොඩ කරපු නිසා. ඒ වතුර ටික තියාගන්න ඕනෑ නිසා. වතුර ටික රඳවා ගන්න තැනක් තියෙන්න ඕනෑ නිසා. ඒ නිසා තමයි අද එහෙම වෙලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා මම පැහැදිලිව මතක් කරනවා. අද නොවෙයි අවිධිමත් විධියට සංවර්ධනය වුණේ එදා. අද සමහරු කිව්වා, අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා, අද නගරය විතරයි සංවර්ධනය වෙන්නේ. කෝටිපතියන්ට විතරයි මේ සංවර්ධනය කියලා. අද මම එතුමාට කියනවා. එන්න. අපේ ගම් තියෙන්නේ අති දුෂ්කර ප්‍රදේශවල. ඒ දුෂ්කර පාරවල් පවා අද කාපට් වෙලා. එදා අපි ගාලු පාරට ආවේ කාපට් පාරක් බලාගන්න. අද අපේ ප්‍රදේශවල අති දුෂ්කර පාරවල් කාපට් වෙලා. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ. අද ඒ විධියේ දියුණුවක් විශාල ලෙස සිදු වෙලා තිබෙනවා. අද කාපට් පාරවල් කිලෝ මීටර් දහස් ගණනක් යනකොට එක තැනක් දෙකක් එහෙම වෙනවා. එදා තමුන්නාන්සේලාට මතක ඇති එක්සත් ජාතික පක්ෂ කාලයේ, ගම්උදාව කාලයේ මොනතරම් ගස් කොළන් කපලා දැම්මාද කියලා. එදා ගස් කපන්න දුන්නා, ගම්උදා තිබුණු හැම තැනකම. ගිහිල්ලා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය විවාදවලට යන්න අවශ්‍ය නැහැ. මාතෘකාවට අදාළව කථා කරන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එදා තමයි පරිසර හානි සියල්ල වුණේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම කිව්වේ රජයට නිකම් මඩ ගහන නිසා. මේ තරම් සංවර්ධනයක් වුණු කාලයක්, මේ තරම් විධිමත් විධියට සංවර්ධනය වුණු කාලයක් මේ රටේ අපි කවදාවත් දැක්කේ නැහැ. ඒක නිසා මේ යෝජනාවට නිවැරැදිව අදහස් දැක්වීම පිළිබඳව සියලුම මම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න
QUESTIONS ASKED AT THE TIME OF COUNCIL ADJOURNMENT.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා සභා ගර්භයේ නොමැති බැවින් මම එම ප්‍රශ්නයට පිළිතුරු සභාගත කරනවා.[5]

---

[5] වාචික පිළිතුරු පහතින් සඳහන් කර ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කළා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සභාගත කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා සභාගත කළාම මට අතුරු ප්‍රශ්න අහන්න බැරි වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කෙටියෙන් උත්තර දෙන්න පුළුවන්ද? ඒ වාගේම අතුරු ප්‍රශ්න ඇහුවොත් ගරු ප්‍රධාන ඇමැතිතුමාට උත්තර දෙන්න අමාරුයි. විෂයය භාර ඇමැතිතුමා සභාවේ නැති නිසා. ලිඛිතව එතුමාට ඉදිරිපත් කරන්න. ඊළඟ සභාවේදී මම ඒකට උත්තර සපයන්නම්.

**** සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ ප්‍රශ්නය***
*Questions Presented at the time of Council Adjournment*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස, ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

අ. හෝමාගම රෝහලේ නව ගොඩනැගිල්ලේ නේවාසික රෝගීන් බැලීම සඳහා යන අය ගොඩනැගිල්ලට ඇතුළු වන ස්ථානයේ සපත්තු හා සෙරෙප්පු ගලවා ගොඩනැගිලි පරිශ්‍රයට ඇතුළු විය යුතු බව දන්නේද?

ආ. එය නීතියක්ද? රීතියක්ද? නව සම්ප්‍රදායක් සඳහා ආරම්භයක්ද?

ඇ. එකී තීරණය ගනු ලැබුවේ කවරෙක්ද?

ඈ. කවර අරමුණකින්ද?

ඉ. සපත්තු සෙරෙප්පු අතුරුදහන් වීම නිසා ඇති වී තිබෙන මහජනයාගේ අපහසුතාවය පිළිබඳව විසඳුම් තිබේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**** [සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

(1) හෝමාගම රෝහලේ රෝගීන් බැලීමට එන අය සපත්තු ගලවා ඇතුළුවීම නීතියක්ද? / රීතියක්ද?

මෙය බමුණු ආරච්චි මහතා විසින් ගෙනගන ලද නව චාට්ටු සංකීර්ණයට පමණක් ක්‍රියාත්මක රීතියකි. නව සම්ප්‍රදායක ආරම්භයක් නොවේ.

(2) එම තීරණය ගත්තේ කවුද?

රෝහල් පරිපාලන කමිටුව විසිනි.

(3) අරමුණ කුමක්ද?

එම ගොඩනැගිල්ලේ බිමට යොදා ඇත්තේ සෞඛ්‍ය ගොඩනැගිලි සඳහා නිර්දේශිත උසස්ම ගණයේ කාපට් වර්ගයකි. මෙම කාපට් මතින් සපත්තු පළඳා භාවිතාකරව එළියේ වැලි [illegible] තොගෙට ඇතුළු වුවහොත් [illegible] ලක්වේ. එසේ වූ විට නැවත සකස්කිරීම වියදම් අධිකය.

(4) සපත්තු නැතිවීම් හා අතුරුදන් වීම පිළිබඳ ~~[illegible]~~ වාර්තා වී තිබේද?

නැත.

ඒ පිළිබඳව පියවරක් ගෙන තිබේද?

ආරක්ෂක නිලධාරීන් දැනුවත් කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අ. i. බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බස්නාහිර පළාතේ පාසල්වලට වර්ණාලේප කිරීම සඳහා කොපමණ මුදලක් ලබා දී තිබේද?

iii. පාසල් අනුව කුමන ප්‍රමාණවලින් එම මුදල් ලබා දී තිබේද?

iv. එම මුදල් ලබාදීම සඳහා පළාත් සභා මන්ත්‍රීවරුන් සහභාගී කරවාගෙන පාසල්වල

උත්සව පවත්වන ලෙස ඔබ විසින් උපදෙස් ලබා දී තිබේද?

v. එම උත්සව මගින් පාසල් ඉගෙනුම් ක්‍රියාවලියට බාධා වන බව ඔබ පිළිගන්නේද?

vi. මේ දිනවල සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වෙන බව ඔබ දන්නේද?

vii. ඉහත කී උත්සව මගින් මෙම සම්මන්ත්‍රණවලට බාධා සිදුවන බව ඔබ පිළිගන්නේද?

vii. පාසල්වල සංවිධානය කරනු ලබන මෙම උත්සවවලින් නොවැම්බර් 10 වැනි දින හා 19 වැනි දින ආරම්භ වීමට නියමිත වාර විභාග සඳහා බාධා වන බව ඔබ පිළිගන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මේ ප්‍රශ්න ඊළඟ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කොපමණ කාලයක්ද ඉල්ලන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මාස තුනක් ඇතුළත උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ඉදිරිපත් කරපු ප්‍රශ්න ටික අපි ඊළඟ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, සභාව කල් තබන වෙලාවේ ඇහුවේ වෙන මොනවත් නිසා නොවෙයි. ඊයේ දවසේ ගරු ප්‍රධාන ඇමැතිතුමා, පළාත් සභා මන්ත්‍රීවරුන් සහභාගී වෙලා පාසල් විශාල ප්‍රමාණයක මේ උත්සව පැවැත්වූවා. හැබැයි, ඊයේ දවස තුළ මට ගුරුවරු පාසල් තුළ ඉඳගෙන මේ පැමිණිල්ල කළා. මම දුරකථනයෙන් සවන් දුන්නා මන්ත්‍රීවරුන්ගේ කථාවලට. එතකොට ඒ අවස්ථාවේදීම විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දීපු ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කිරීමේ සම්මන්ත්‍රණ CD මගින් විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමන්ලාට ඕවා අහන්න අයිතියක් නැහැ. ඔබතුමන්ලා ඉස්කෝලවලට ගිහි තිබ්බා. අහන්න අයිතියක් තියෙනවැයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ? අඩුම තරමේ මේ වාගේ වැදගත් ප්‍රශ්නයක් - මම මේ සාකච්ඡා කරන්නේ (බාධා කිරීම්) ලබන මාසේ 09 වැනිදා - මාස තුනක් ඇතුළත ප්‍රශ්නයකට උත්තර දෙන්න බැරි ඇමැතිවරු. මෙතුමාගේ කෙරුවාවල් කවුරුත් දන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වැදගත් ප්‍රශ්නයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම කල්ගන්න අවස්ථාවේදී (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මම යොමු කරන්නේ අඩුම තරමේ දැන් මේ දිනවල සාමාන්‍ය පෙළ විභාගයට ගුරුවරු තමන්ගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය මට පැහැදිලියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතකොට මේ උත්සව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් විෂයය භාර ගරු ඇමැතිතුමා කල් ඉල්ලුවා. ඒ නිසා ඊළඟ න්‍යාය පත්‍රයට මම ඒ ප්‍රශ්න යොමු කරනවා. එතකොට උත්තර ලැබෙනවා. මට වෙන කරන්න දෙයක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

## සභාව කල් තබන අවස්ථාවේ කළ යෝජනාව
## MOTION PRESENTED AT THE TIME OF ADJOURNMENT

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, *"කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෘත්තීය සමිතිවලට සාමාජිකයින් බඳවා ගැනීමට සියලුම වෘත්තීය සමිතිවලට අයිතියක් ඇත. එයට බාධා කිරීමට කිසිවකුට අයිතියක් නැත. නමුත් මේ වනවිට බස්නාහිර පළාත තුළ රාජ්‍ය බලය යොදවමින් බලහත්කාරයෙන් ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට සාමාජිකයින් බඳවා ගැනීමට කටයුතු කරමින් තිබේ.*

*එබැවින් බලහත්කාරයෙන් හා රාජ්‍ය බලය යොදාගනිමින් සිදු කරන මෙම සාමාජික බඳවා ගැනීම් නතර කිරීමට වහාම පියවර ගත යුතු යැයි යෝජනා කර සිටී."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් වේලාව ප.ව. 02.00 යි. ඔබතුමාට කොපමණ කාලයක් ඕනෑද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විනාඩි 10 ක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 05 ක් මදිද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විනාඩි 05 ක් මදි ගරු සභාපතිතුමා. මම උපරිම කෙටි කරන්න උත්සාහ කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය අවශ්‍යද යෝජනාවට උත්තර දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම කථා කරන්නේ නැහැ. ඊළඟට ඡන්දයට යමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේකට ඡන්දය විමසන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්දය විමසන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා දැන් මහ ඇමැතිකම් දෙපාරක් දැරුවා නේද? කල් තබන අවස්ථාවේ යෝජනාවට ඡන්දය විමසන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඕක මට අදාළ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙනම් ඔබතුමාගේ විනාඩි 10 කින් කථාව අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මා මේ යෝජනාව ඉදිරිපත් කරන්න කල්පනා කළේ මේ වනවිට බස්නාහිර පළාත තුළ කලාප මට්ටමෙන් - උදේ වරුවේදී අපි ප්‍රශ්න ඇසීමේදී සාකච්ඡා කළා වාගේම රාජ්‍ය බලය යොදා ගනිමින් වෘත්තීය සමිති සාමාජිකයන් බඳවා ගැනීමට ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය කටයුතු කරමින් තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) වගන්තිය අනුව සෑම පුරවැසියෙකුටම වෘත්තීය සමිතියක් පිහිටුවීමේ හා වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහස තිබෙනවා. ඒ පිළිබඳ කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම මේ රටේ ක්‍රියාත්මක වන ආයතන සංග්‍රහය අනුවත් ඒ වාගේම වෘත්තීය සමිති ආඥා පනත අනුවත් වෘත්තීය සමිතිවලට බැඳෙන්න, සාමාජිකයෝ බඳවා ගන්න වෘත්තීය සමිතිවලට අයිතිවාසිකමක් තිබෙනවා. ඒ පිළිබඳ කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි දැන් ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ, මේ වනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රාජ්‍ය බලය යොදා ගනිමින් වෘත්තීය සමිති සාමාජිකයින් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. බලහත්කාරය යොදා ගනිමින් තිබෙනවා. දැන් -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු මන්ත්‍රීතුමා, බලහත්කාරයෙන් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බලහත්කාරය මම පැහැදිලි කරන්නම්. ඔබතුමා ඉන්න. මම -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලහත්කාරයෙන් බඳවා ගන්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ පැහැදිලි කිරීම කරන්න ඉඩ දෙන්න කෝ? පිළිතුරු කථාවක් ගරු ප්‍රධාන ඇමැතිතුමා කරන්නේ නැත්නම් ඔබතුමා කරන්න. එතකොට දැන් මේ වනකොට මම උදේ වරුවේ සඳහන් කළා වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමා මැදිහත් වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. මෙතුමාට විනාඩි 10 ක් දුන්නා. ඔබතුමාටත් අවශ්‍ය නම් කාලය දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බාධා කරන්න එපා. ඔබතුමන්ලා පිළිතුරු කථාව කරන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා මැදිහත් වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලිපි ශීර්ෂය යටතේ කලාප අධ්‍යක්ෂවරු - (බාධා කිරීම්) මේ වනකොට ගරු ප්‍රධාන ඇමැතිතුමා කලාප මට්ටමෙන් කලාප අධ්‍යක්ෂවරු, ඒ වාගේම අනෙකුත් අධ්‍යක්ෂවරු කැඳවමින් වෘත්තීය සමිති සාමාජිකයන් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. ඒ වාගේම දැන් පසුගිය 24 වැනිදා මතුගම කලාපයේ විදුහල්පතිවරු ගණනාවක්, ඒ වාගේම අධ්‍යක්ෂවරු ගණනාවක් ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ සාමාජිකයෝ ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් ගාණේ යමින් තිබෙනවා. එතකොට අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඊළඟට පිළියන්දල කලාපයේ. පිළියන්දල කලාපයේ අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. එතුමා තමයි මම දන්න තරමින් ඒ කලාප කාර්යාලයේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ සම්බන්ධීකරණ නිලධාරියා. එතකොට ඔහු කලාප අධ්‍යක්ෂකටත් වඩා උඩින් ඉඳිමින්, ඔහුගේ බලය පාවිච්චි කරමින්, අනෙකුත් අය යොදාගෙන ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. ඒ වාගේම ගුරුවරුන්ට බලපෑම් කරමින් තිබෙනවා. ඔවුන්ට ස්ථාන මාරුවීම් ලබා ගන්න, ඔවුන්ට උසස්වීම් ලබා ගන්න විතරක් නොවෙයි. ඉදිරියේදී දෙනවා යැයි පොරොන්දු වෙලා තිබෙන වාහන බලපත්‍ර දෙනවා කියලා දැන් කියනවා. ඒවා ලබා ගන්නත් ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ සාමාජිකයෝ වෙන්න ඕනෑ. ඒ විධියට විවිධ බලපෑම් කරමින් තිබෙනවා. මේක ඉතාම බරපතළ කාරණයක්. දැන් ආයතන සංග්‍රහය අනුව, 2 (4) වගන්තිය

[ගරු මහින්ද ජයසිංහ]

පිළිබඳව මේ සභාවේ අවධානයට යොමු කරනවා. ආයතන සංග්‍රහයේ 32 වැනි පරිච්ඡේදයේ 2 (4) වගන්තියේ මෙහෙම කියනවා,

*"ආණ්ඩුවේ කිසිම ගොඩනැගිල්ලක හෝ ආණ්ඩුවේ වෙනත් වැඩ පොළක හෝ දේශපාලන රැස්වීම් නොපැවැත්විය යුතුය. හොඳට අහගන්න. එසේ වෙතත් ආණ්ඩුවේ ගොඩනැගිල්ලක හෝ ආණ්ඩුවේ වෙනත් වැඩ පොළක හෝ සාමාන්‍ය වැඩ කරන කාලය තුළ හෝ ඉන් පිටස්තරව හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය ඇතිව වෘත්තීය සමිති රැස්වීමක් පැවැත්වීම මෙම රෙගුලාසියෙන් තහනම් නොකෙරේ."*

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔය අයිතිය තියෙනවා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් කියලා ඉවර වෙනකල් ඉන්න කෝ මහ ඇමැතිතුමා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

දන්නේ නැති නිසා අහන්නේ. මම ඕක කියවලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

- පැවැත්වීම මෙම රෙගුලාසියෙන් තහනම් නොකෙරේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

රීතිවලින් ඉඩ දීලා තිබෙනවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වෘත්තීය සමිති කටයුතු තහනම් කරන්නේ නැහැ. ඊළඟට,

එහෙත් එම අවසරය ඇත්තේ අදාළ වෘත්තීය සමිතියේ සාමාජිකයෙකු නොවන අයෙකුටය.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එතකොට පාසල් ගිනි තියන්න අයිතිය දීලා තියෙනවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අදාළ රැස්වීමට සහභාගී නොවන්නේ නම් පමණි. මොකක්ද ගරු සභාපතිතුමනි, කියන්නේ? වෘත්තීය සමිති අයිතිය තිබෙනවා. වෘත්තීය සමිතිවලට පුළුවන් සාමාජිකයෝ බඳවා ගන්න. රජයේ ගොඩනැගිලි, පාසල් ගොඩනැගිලි ඕනෑම එකක් පාවිච්චි කරන්න පුළුවන්. වැඩ කරන කාලේ වුණත් පුළුවන්. හැබැයි මොකක්ද කියන්නේ? එම අවසරය ඇත්තේ අදාළ වෘත්තීය සමිතියේ සාමාජිකයකු නොවන අයෙකු අදාළ රැස්වීමට සහභාගී නොවන්නේ නම් පමණි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔය කොයි කාලසීමාවේ ආයතන සංග්‍රහයද? පොඩ්ඩක් බලන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වෘත්තීය සමිති සාමාජිකයෙකු නොවන අයෙකුට රැස්වීමට සහභාගී වෙන්න බැහැ. මම දැන ගන්න කැමැතියි ඔබතුමාගේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

88 - 89 නොවෙයිද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සංගමයේ සාමාජික අංකය මොකක්ද? ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ සාමාජිකයෙකු වුණේ කවදාද? මොකක්ද සාමාජික අංකය?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ආරාධිතයෙක් පමණයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ආරාධිතයින්ට මේකට යන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුළුවන්. පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ආරාධිතයෝ කොහොමද මේ රද්දොළුව පඤ්ඤානන්ද ප්‍රාථමික විදුහලේ -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, ආරාධිතයෝ කොහොමද 10 වැනි මාසේ 27 වැනිදා රජයේ වැඩ කරන දිනයක්. සදුදා. පාසල් පවත්වන දිනයක්. රද්දොළුව පඤ්ඤානන්ද ප්‍රාථමික විදුහලේ උදේ 11.30 ට සාමාජිකයෙකු නොවන කෙනෙක් රැස්වීමට සහභාගී වෙන්නේ කොහොමද? මොකක්ද නීතිය? ගිනි තියපු අය ගැන නොවෙයි. උත්තර දෙන්න. ඔබතුමා කවදාද සාමාජික වුණේ? ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න. අපි පැහැදිලිව කියන්නේ මේ වෙන මොකක්වත් නොවෙයි. මේ රටේ ගුරුවරු බිය වැද්දීම, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ගුරුවරු බිය වද්දමින්, බලහත්කාරයෙන් යොදා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ට්‍රාන්ස්ෆෝමර් කීයක් කැඩුවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගිහිල්ලා කියන්න ඔය ගුරු සංගමයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (බාධා කිරීම්) එක සාමාජිකයෙක් බඳවා ගන්න බැහැ. ඇයි? ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ රටේ ගුරුවරු එක් ලක්ෂ පනස්දාහක් සාමාජික වුණු අධ්‍යාපන සමූපකාර සමිතිය කියලා එකක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකද කළේ? ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ අධ්‍යාපන සමූපකාර සමිතියේ පසුගිය 2008 මාර්තු 29 වැනිදා ඡන්දය තිබ්බා. ඡන්දයෙන් දින්නේ කවුද? 2/3 ක බලයක් -

[සභාවේ ඝෝෂා]

ලැබුණා. අධ්‍යක්ෂ මණ්ඩලය මාස 28 ක් පාලනය කළා. අන්තිමට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

චෝදනා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොනවාද චෝදනා? එක චෝදනාවක්වත් උසාවියේ ඔප්පු කරලා නැහැ. අවුරුදු 04 ක් නඩු කිව්වා. ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය නඩු දැම්මා. නඩු දාලා අධ්‍යාපන සමූපකාර සමිතිය, හොඳට අහගන්න.

[සභාවේ ඝෝෂා]

පත් කරලා තිබෙනවා. අද හොර ගුහාවක් බවට පත් කරලා තිබෙනවා. අද ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට ඉස්කෝල ගාණේ යන්න බැහැ. ඉස්කෝලවලට ගිහිල්ලා සාමාජිකයෝ බඳවා ගන්න බැහැ. ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට අද ඉස්කෝල ගාණේ යන්න බැහැ මහ ඇමැතිතුමා. ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට අද ඉස්කෝලේ

[ගරු මහින්ද ජයසිංහ]

යන්න බැහැ. ඇයි? අධ්‍යාපන සමූපකාර සමිතිය කාලා විනාශ කරලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

ජොන්ස්ටන් ප්‍රනාන්දු සමූපකාර ඇමැතිගේ ගෝලයෙක්. සමූපකාර සමිතිය කෑවා. විනාශ කළා. ඒ නිසා අද ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට ඉස්කෝලේ ගාණේ යන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

සාමාජිකයෝ බඳවා ගන්න බැහැ. ඒ නිසා මොකද, වෙලා තියෙන්නේ? ඒ නිසා අද බස්නාහිර පළාතේ මේ ගුරුවරුන්ට කරපු -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ගිනි තිබ්බා. ට්‍රාන්ස්ෆෝමර් ගිනි තිබ්බා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා සභාපතිවරුන්ට, නියෝජිතයින්ට ඉස්කෝලවලට යන්න බැහැ. ගිහිල්ලා සාමාජිකයෝ බඳවා ගන්න බැරි නිසා. අනේ අසරණ මහ ඇමැතිතුමා. අර ජේන්නේ නැද්ද අසරණ විධියට බලාගෙන ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා මේ බාධා කිරීම් නතර කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පව්ච්චි කර ගන්නවා ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිට, ලේකම්ට සාමාජිකයෝ බඳවා ගන්න බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා මේ බාධා කිරීම් නතර කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරුවරුන්ට කරපු විනාශයට ඔවුන් සාමාජිකයෝ වෙන්නේ නැහැ. ඒ නිසා අද රාජ්‍ය බලය යොදා ගනිමින් - (බාධා කිරීම්) මේ සභාවට යෝජනා කරනවා, බලහත්කාරයෙන් රාජ්‍ය බලය යොදා ගැනීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වහාම නතර කරන්න ඕනෑ. ගුරුවරුන්ට නිදහසේ පාසල් තුළ ස්වාධීනව කටයුතු කරන්න ඉඩ හදන්න ඕනෑ කියලා යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම යෝජනාව සම්බන්ධව වෙනත් අයෙකු අදහස් ප්‍රකාශ කරන්නේ නැති බවක් පේනවා. ආණ්ඩුවේ පක්ෂයේ ගොඩක් අය බාධා කිරීම් කළා. ඒ අය කැමැති නම් කථා කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, රාජ්‍ය බලය පාවිච්චි කරමින් බලහත්කාරයෙන් ගුරුවරු බඳවා ගන්නම් නම් ඒක සම්පූර්ණයෙන් වැරැදියි. මොකද, පසුගිය කාලයේ අපි දැක්කා - මම දන්නේ නැහැ, එතුමා බලහත්කාරයෙන් කියන එක අර්ථ නිරූපණය කරන්නේ කොහොමද කියලා. තුවක්කු ඔළුවට තියලා, බැඳෙන්න කියනවා නම් ඒක වැරැදියි. එහෙම වෙනවා නම් මම ඒක සොයලා බලනවා. ඊළඟට 89 - 91 කාලයේ වාගේ බෙල්ල කපලා කෝට්ටේ ගහලා තියෙනවා කියලා භය කරලා ලිපි අරිනවා නම්, ඒක බලහත්කාරකමක්. ගරු සභාපතිතුමනි, මෙකට බැඳුනේ නැත්නම් උඹලා මරලා දණඉහෙන් උඩට මිනිය ගෙනියන්න දෙන්නේ නැහැ කියලා, කියනවා නම් ඒක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

උත්තර නැහැ වාගේ නේද? ඇත්ත උත්තර දෙන්න. ආයතන සංග්‍රහයෙන් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පුළුවන් නම් මගේ ආයතන සංග්‍රහයේ ප්‍රශ්නයටයි, රාජකාරී නිවාඩු ලබා දෙන ඒවාට උත්තර දෙන්න. ඒවාට උත්තර දෙන්න. බාලයි.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අහගෙන ඉන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕවා බාල වැඩ. ඕවා බාලයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම බාධා කළාද ඔබතුමාට. මම බාධා කළේ නැහැ කාටවත්. ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇත්ත කථා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අහගෙන ඉන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමන්ලා මගේ කතාව අහගෙන හිටියෙත් නැහැ. කොහොමද අහගෙන ඉන්නේ? මේවාට උත්තර දෙන්න. කොහොමද රාජපක්ෂ - ආයතන සංග්‍රහය

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අහගෙන ඉන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කියන දේ බොරු නොවෙයි. ඇත්ත.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අහගෙන ඉන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකක්ද මේක? පළාත් සභාවක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි සාමාජිකයෝ අඬු වෙලාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, අපිත් ඡන්දෙන් වගකීමකින් ඇවිල්ලා ඉන්නේ. අහන ප්‍රශ්නයට උත්තර දෙන්න.

[සභාවේ ඝෝෂා]

මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළාත් සභාව නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ අසාධාරණයට ලැහැස්ති නැහැ. මේකට ඉඩ දෙන්න ලැහැස්ති නැහැ.

[සභාවේ ඝෝෂා]

මොකක්ද විකාරේ. යන්නේ කොහේද? මල්ලේ පොල්. මෙහෙම අයද පත් කරලා එවලා තිබෙන්නේ. ලැජ්ජයි. ඔක්කෝටම උත්තර නැහැ. එක්කෝ සභාව කල් තියනවා. නැත්නම් වෙන බයිලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. දැන් මේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගුරු සමුපකාරේ කෑවේ කවුද? ඒවා අහගන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අවුරුදු හතරක් ගියා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සමුපකාරය කෑවේ ජොන්ස්ටන්.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මීගමුව කලාපයේ ගුරුවරු කිව්වා ඔබතුමා ගැන. ඒක තමයි රිදිලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ඔබතුමාත් නිශ්ශබ්ද වන්න. අනෙක් මන්ත්‍රීවරුත් නිශ්ශබ්ද වන්න. මම හැම මන්ත්‍රීවරයකුගෙන්ම ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවේ නිශ්ශබ්ද වෙන්න. ගරු සභාවක්. අනවශ්‍ය බාධා කිරීම්වලට යන්න එපා. අවසානයේදී එතුමා උත්තර දේවි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා තරහ ගන්න එපා. මම ඇහුවේ බලහත්කාරකම් කරනවාය කියන එක -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අශෝක විද්‍යාලයේ ළමයි එලෙව්වේ. ලැජ්ජයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු මහ ඇමැතිතුමනි, -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඉඳගන්න. ඉඳගන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමන්ලාගේ තර්ජනවලට යටත් වෙලා නම් ඉඳගන්නේ නැහැ. වාඩි කරන්නත් බැහැ. වාඩි වෙන්න සූදානමකුත් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ නිසා ගරු සභාපතිතුමනි, එහෙම බලහත්කාරයෙන් කරනවා නම්, අපි එදා කැමැතිත් නැහැ. අද කැමැතිත් නැහැ. එහෙම වෙන්න ඉඩ තියන්නේ නැහැ. ඒ වාගේම එතුමා චෝදනාවක් කළා මට, මම ගිහිල්ලා සාමාජිකයෝ බඳවා ගත්තාය කියලා. ගරු සභාපතිතුමනි, මම කිසිම අවස්ථාවකදී මම සහභාගී වුණු රැස්වීමකදී - එක ඉස්කෝලයයි දෙකයි ගැන කිව්වේ. රැස්වීම් දෙකක්. දැන් දහයක් ඉවරයි. ඉතිරි ටික හෙට කරලා ඉවර කරනවා. ඒ එකකවත් ගරු සභාපතිතුමනි, සාමාජිකයෝ බඳවා ගැනීමක් කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා. අපි අපේ වෘත්තීය සමිති නිලධාරීන් විසින් සාමාජිකයන්ව බඳවා ගන්න පාසල් මට්ටමින් නියෝජිතයෝ පත් කර ගැනීමක් සිදු කරනවා. ඒ නියෝජිත හමුවට ආරාධිතයෙක් හැටියට මට සහභාගී වෙන්නයි ආරාධනා කළේ ගරු සභාපතිතුමනි. එතැනදී මම පැහැදිලි කළේ, සාමාජිකයෝ බඳවා ගැනීමේ ඇති වැදගත්කම. මොකද, නැත්නම් අනෙකුත් වෘත්තීය සමිති අඩුපාඩු සොය සොයා කථා කරන මේ දේවල් - දැන් හොඳම උදාහරණය. පසුගිය කාලයේ කථා කරපු දෙයක් තමයි බස්නාහිර පළාතේ ප්‍රාථමික ගුරුවරුන්ගේ හිඟය. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාත් එදා සහභාගී වුණා. ඒ අය සහභාගී වෙලා මේ කාරණාව කිව්වා. අපි ගුරු වෘත්තීය සමිති, එතුමන්ලා කිව්ව දේ අපි පිළිගත්තා. ජනාධිපතිතුමාට කියලා මිලියන 100 ක් ඉල්ලා ගෙන අපි ගුරු පුහුණු වීම කළා. එතකොට මේ මන්ත්‍රීතුමන්ලා එකතු වෙලා ඒ ගුරු පුහුණුවීම් තියන එක නවත්වන්නය කියලා වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක්

ගත්තා. අපි පඩියට අමතරව රුපියල් හාරසීයක් ගෙව්වා. පුහුණු වීම දුන්නා. දෙන්න හදන කොට, කිව්වා ඉස්කෝලවල මේක කළ යුතුයි කියලා. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරන වෙලාවේදී මේ කටයුත්ත කළ යුතුයි කියලා වෘත්තීය සමිති ගෙනාවා. අපි එකඟ වුණේ නැහැ. මොකද, අධ්‍යාපනය කියන්නේ දරුවන්ගේ දෙයක්. ඒ නිසා ගුරුවරු මෙතුමන්ලාගේ කීම ඇහුවේ නැහැ. අවසානයේදී ගුරු පුහුණුවට සියලුම අය සහභාගි වුණා. මෙතුමන්ලාගේම අය අසාර්ථක වුණා.

ඊළඟට අපි රක්ෂණ ක්‍රමය දෙද්දී, පළාත් සභාවෙන් 50% ක් ගෙවලා ගුරුවරුන්ට රක්ෂණ ක්‍රමයක් ආරම්භ කළා. අද අපි 26 දෙනෙකුට රක්ෂණය ගෙවලා තිබෙනවා. එතකොට මෙතුමන්ලා කිව්වා, මේ රක්ෂණ ක්‍රමය කළොත් අග්‍රහාර නැතිව යනවා. ඒකෙනුත් ගුරුවරුන්ව නොමඟ ඇරියා. ඒකත් අද බොරුවක් කියන එක සනාථ වෙලා තිබෙනවා. අද මේ අයට ඕනෑ අර හිඟන්නාගේ තුවාලේ වාගේ මේ අධ්‍යාපන සුභසාධන කටයුතු සහ අනිකුත් ඒවා කරන කොට වැරැදි තොරතුරු පෙන්න පෙන්නා තමන්ගේ සාමාජිකයන් වර්ධනය කරගන්න. ඒක කරගන්න බැරි වෙන කොට මේ වේදනාවා මම පිළිගන්නවා, ගරු සභාපතිතුමනි. මම ඒකට අනුකම්පා කරනවා. ඒකට මගේ කිසිම පෞද්ගලික මේකක් නැහැ. මොකද මෙතුමාට එහෙම සිද්ධීන් කිහිපයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. මට මතකයි අසෝක විද්‍යාලයේ සිද්ධියට ගියාම දරුවන් එතැනින් එළෙව්වා, වෘත්තීය සමිතියක් හැටියට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුණු බිත්තර ගැහුවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙම වුණා නේ? මම ඒක අනුමත කරන්නේ නැහැ. මොකද, මන්ත්‍රීවරයෙකුගේ ගෞරවය නැති කළේ. අපි හැමෝම මන්ත්‍රීවරු. ඔබතුමාට එහෙම වුණු එක ගැන මම කනගාටු වෙනවා. සත්භාවයෙන් කනගාටු වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

Thank you. මට එහෙම එකක් වුණේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එළෙව්වා. අපි ටී.වී. එකේ දැක්කා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාගේ ගෝලයෝ තමයි ඉස්කෝලේ ඇතුළේ ඉඳන් වැඩේ කළේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ටී.වී. එකේ දැක්කේ, දරුවෝ එහෙම මන්ත්‍රීවරයෙකුට කරපු එක. වෘත්තීය සමිතියක් හැටියට කටයුතු කරද්දී -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාගේ බොරුව කියන්න කෝ. කමක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

තරහ ගන්න එපා. මම කියන එක අහගෙන ඉන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, නියෝජිතයෙකු මුණ ගැසීම පමණයි සිදු වුණේ. ඊට පස්සේ දැන් හෙට අනිද්දා සිට ඒ නියෝජිතයන් සාමාජිකයන් බඳවා ගැනීම කරනවා. එතකොට සාමාජික වර්ධනයක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇත්ත තත්ත්වේ කියන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඇත්ත මම මේ කියන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අර සභාව නැති වේලාවේදී කියපු ටිකත් කියන්නද මම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා කථා කළා ඒක.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකයි මේකයි දෙකක් නේ. ඔබතුමා කිව්ව එකට මම උත්තරේ දෙනවා. ඒකටත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කියන එක අහගෙන ඉන්න කෝ. හැමෝම අහන්න කෝ. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු එක එක කොන් කැලි දාන්න යන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉතාමත්ම වගකීමෙන් කියනවා. අපේ ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය කටයුතු කරද්දී, මම ඒ රැස්වීම්වලට ගියා. කිසිම ආකාරයකින් බලහත්කාරකමක්, බලෙන් බඳවා ගැනීමක් සිද්ධ කළේ නැහැ. සාමාජිකයන්ට ගුරු වෘත්තීයේ ඇති වටිනාකම පැහැදිලි කරන්නත්, ඒ වාගේම ගුරු සේවා ව්‍යවස්ථාව, විදුහල්පති සේවා ව්‍යවස්ථාව ගැන පැහැදිලි කරන්නත් ඒ කටයුතු කිරීමේදී අපේ වෘත්තීය සමිතියක් හැටියට ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය ශක්තිමත් වීමේ අවශ්‍යතාවයත් අපි පැහැදිලි කරලා දුන්නා පමණයි. ඒ නිසා මේ කියන කාරණා අසත්‍යයි. එතුමන්ලාට මේ සාමාජිකයන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ තුළ ඒ අයගේ සාමාජිකයන් ගිලිහෙනවා.

ඒ විතරක් නොවෙයි. මට එකක් කියන්න බැරි වුණා, ගරු සභාපතිතුමනි. ඒ සාමාජිකයන්ට මගේ අත්සනින් අපි හැඳුනුම්පතකුත් දෙනවා. පාසල් මට්ටමේ නියෝජිතයන්ට. හැඳුනුම්පතක් දෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගුරු සංගමයේ නියෝජිතයන්ට -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාගේ අත්සනින් දෙන්නේ කොහොමද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඇයි මම ඒකේ සාමාජිකයෙක් නේ? කමිටුවේ නියෝජිතයෙක් මම. පක්ෂයෙන් කමිටුවක් පත් කරනවා. එක එක වෘත්තීය සමිති සම්බන්ධව. ගුරු සංගමයේ ජෝන් සෙනෙවිරත්න ඇමැතිතුමාගේ නායකත්වයෙන් පත් කරපු කමිටුවේ නියෝජිතයෙක් මම. එතකොට ඒකේ පොඩි වරප්‍රසාද ප්‍රමාණයක් තිබෙනවා. ඒකත් ඔබතුමන්ලා දැනගන්න ඕනෑ. මාධ්‍යයටත් ඒක යන්න ඕනෑ නිසා. ඒ හැඳුනුම්පත දුන්නාම (බාධා කිරීමක්)

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මහ ඇමැතිතුමාගේ එක්කෙනා කියලා එයා විදුහල්පතිතුමාටත් Control වෙන්නේ නැතිව යයි නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, එහෙම වෙන්නේ නැහැ. අපේ අය විනයක් එක්ක යනවා. එහෙම වෙන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැනටත් එහෙම වෙලා තිබෙන්නේ. කමක් නැහැ. ඔබතුමා කියන්න කෝ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ අයව පත් කරලා තිබෙන්නේ පාසලේ ගුරුවරුන් සම්බන්ධ ගැටලුවක් මතු වුණොත් ඒක නිරාකරණය කරන්න මැදිහත්කරුවෙකු හැටියට විතරයි. එවැනි මැදිහත්වීමක් කරන්න. ඒ අනුව ඒ අයට පුළුවන්කම තිබෙනවා තමන්ගේ සහෝදර ගුරුවරුන්ගේ ගැටලුවක් මතු වෙන කොට - එහෙම නැත්නම් ඒ අය අපෙන් ගිලිහී යනවා. ඒ නිසා හැඳුනුම්පතක් දෙනවා. ඒ විතරක් නොවෙයි. මගේ මහජන දිනයට ඒ අය ආවම

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඇත්ත කියනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මේ ඇත්ත කියන්නේ. ඕක හංගන්න දෙයක් නොවෙයි නේ. දැන් තමුන්නාන්සේලා බොරු කියලා මිනිස්සු රවට්ටලා අල්ලන් ඉන්නවා වාගේ නොවෙයි නේ. අපි ඇත්ත කියනවා නේ. මම ඒ අයට -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හැඳුනුම්පතේ උඩ දාන්නේ මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් සංගමයද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක තවම නැහැ. හොඳ එකක් හදලා ඔබතුමාට පෙන්වන්නම්. ඒ විතරක් නොවෙයි. ඒ ගුරුවරයා හැඳුනුම්පත අරගෙන ගියාම පළාතේ ප්‍රධාන ඇමැතිවරයා හැටියට මම ළඟට ආවොත් එයාට විශේෂත්වයක් තිබෙනවා. පෝළිමෙන් ගන්නේ නැහැ. ඉක්මණට අරගෙන එන්න පුළුවන්. එතකොට ඒ අයගේ ගුරු ප්‍රශ්න පිළිබඳව විසඳුම් ලැබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා සන්තෝෂ වෙන්න ඕනෑ. ගුරුවරුන්ගේ ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබා දෙන්න - ඔබතුමන්ලාටත් ආරාධනා කරනවා, අපිත් එක්ක සම්බන්ධ වෙන්න කියලා. Identity Card එකක් ඕනෑ නම් ලබා දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මමත් බැඳෙන්නම් ඕකට. මමත් ඕකේ සාමාජිකයෙක් වෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2015 වසරට අදාළ මුදල් ප්‍රකාශය නොවැම්බර් මස 18 වන දින එනම් ඊළඟ සභා වාරයේදී ඉදිරිපත් කරන බැවින් එම අවස්ථාවට සහභාගී වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ වැඩ කටයුතු අවසන් වෙනවා.

# කල් තැබීම
ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ප.ව. 02.24 ට, 2014 නොවැම්බර් මස 18 වන දින පූ.ව. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 02.24 p.m till 09.30 a.m. on 18.11.2014*